ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 මාර්තු 08 වන බදාදා
3 කාණ්ඩය 14 කලාපය
මිල රු. 80 යි

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් විශේෂ අතිරේකයක් මෙවර ධරණී සමඟ නොමිලේ

පොලිසියේ බලපෑම නිසා බොරු කිව්වට ඒ පුද්ගලයා මට අතවර කළේ නෑ

දකුණේ ප්‍රාදේශීය දේශපාලනඥයෙකුට එරෙහිව ගිය ලිංගික අපචාර නඩුවේ ඇත්ත කතාව

නිළි රුපිණා හැඩ කළ ඒනිස් අයියාගේ කිව් කිව් බෝල සබන්

යක්කුන්ට දොළ පිදේනි දුන්නත් ඒකයි පවුල් ප්‍රශ්න පිටට දුන්නත් ඒකයි

ජානි ගනේෂන්
'රොක්ලන්ඩ් බිස්ටිලරීස්' සමාගමේ සාමාන්‍යාධිකාරිනි

ඡායාරූප
සමන් අබේසිරිවර්ධන

නුවරඑළිය තවත් හැඩකළ ශකීන්ද්‍රා සැලෝන් මනාලියන් දැක්ම

නුවරඑළිය ශකීන්ද්‍රා සැලෝන් අධිපතිනී නදීශානි නානායක්කාර විසින් ඉදිරිපත් කරන ලද මනාලියන් දැක්මක් පසුගිය 23 වනදා නුවරඑළිය සිනිසිටා ශාලාවේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. ඊට අමතරව ශකීන්ද්‍රා සැලෝන් ආයතනය ඉදිරිපත් කළ විවිධ විශේෂාංගයන්ගෙන්ද උත්සවය වර්ණවත් විය.

තවද හොඳම වරලස, ලස්සනම යුවතිය, හොඳම සම, කඩවසම්ම තරුණයා, සිඟිති කුමරා හා කුමරිය ඇතුළු අංගවලින් උත්සවය අලංකාර වී තිබිණි.

මේ නිසාම නදීශානි නානායක්කාර ඉදිරිපත් කළ මනාලියන් දැක්ම බොහෝදෙනාගේ පැසසුමට ලක්විය.

උළෙලේ අවසාන අංගය ගෙස පැවතියේ විවෘත මනාලියන්ගේ තරඟයයි. කොළඹ, ගම්පහ, මහනුවර, බදුල්ල ආදී ප්‍රදේශවලින් පවා තරඟකරුවන් ඉදිරිපත් වී තිබීම විශේෂත්වයක් විය. එහිදී බුත්තල සිට පැමිණි රෙහාන් ඉදිරිපත් කළ මනාලිය සුන්දරම මනාලිය ලෙස ජයග්‍රහණය කරන ලදි.

ඩල්සි හත්තැල්ල, කිරන් ඩී සොයිසා ආරාධිත අමුත්තන් ලෙස නිවැරදි තරඟ විනිශ්චයක් ලබාදුන් අතර නුවරඑළිය නගරාධිපති ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රභූවරුන් ආරාධිත අමුත්තන් ලෙස සහභාගී විය. මෙම උත්සවය සඳහා මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය සපයන ලද්දේ ‘ධරණී’ පුවත්පත විසිනි.

ක්‍රිෂාන්ත පුෂ්පකුමාර

"කාට පේන්නද දන්නෑ ඔය තරම් හැඩවෙන්නේ?"

සම්පත්ගේ ඇනුම්පදයට කිසිවක් නොකී උදෑරා, හැඳසිටි සාරයේ අඩුපාඩු සකසන්නට වූවාය. ඒත් එක්කම ඇයට මතක් වූයේ, සම්පත් තම කාර්යාලයටද ඇමතුම් දෙමින් තමන් එහි සිටිනවාද යන්න වරින්වර විමසනවා යැයි දුරකතන සහායිකාව කී කතාවය. ඒ ගැන ඔහුගෙන් අහන්නට සිතුණත් එයද ඔහුගේ කෝපයට හේතුවනු ඇතැයි ඇයට සිතුණාය.

"පරක්කු වෙනවා උදෑරා."

සැබෑවටම පරක්කුවක් නැතත් උදෑරා ලස්සනට, පිළිවෙලට කාර්යාලයට යෑම සම්පත්ගේ හිතට ගෙනෙන්නේ ඊර්ෂ්‍යාවකි. තරහවකි. ඒ වගේම සති කිහිපයක සිට ඔහු ඇයව සැක කරන්නට පෙලඹී තිබේ.

"ඔයාට පරක්කු නම් ඔයා යන්න සම්පත්... මං බස් එකේ එන්නම්."

තමා දෙස නොරිස්සුමින් බලා සිටින සම්පත් දෙස බලා උදෑරා කීවාය.

"ඔව් එතකොට ලේසිනේ අරෑ එක්ක ජෝඩු දලා යන්න."

"කා එක්කද..? කවුද අරෑ කියන්නේ..?"

"මම දන්නෑ කියලද හිතන්නේ?"

සම්පත් උදෑරා වෙත කඩා පැන්නේය.

"මොනවද සම්පත් මේ විකාර කතා. ඔයා නිසා මට දැන් රස්සාවත් කරගන්න බැරිවෙලා. මගේ හිතකවත් නැති මනුස්සයෙක් එක්ක සම්බන්ධයක් තියෙනවද කියලා ඔයා අහනවා. ඇයි මේ සැකේ?"

උදෑරා කීවේ දෑසින් කඳුළු වැටෙද්දීය. ඉන් සම්පත් කෝප ගත්තේය.

"මං දවසක අතටම අල්ලගන්නම්. එතකල් ඉඳපන්කෝ."

"නැති දෙයක් අල්ලගන්නේ කොහොමද?"

"නෑ කියන්න එපා යකෝ තමන්ගේ වරද පිළිගනින්."

එය තර්ජනයක් වැන්න. ඔහු ඇයට තම වරද පිළිගන්නැයි කිහිපවිටක් කීවේය. මේ සිදුවන්නේ කුමක්දැයි උදෑරාට සිතාගන්නටවත් නොහැකිය. කාර්යාලයට යන අදහස එවලේම අතහැර දැමූ උදෑරා කාමරයට වී හඬා වැටෙන්නට වූවාය.

සම්පත් ගෙදරින් ගිය පසු ඇය කල්පනා කළේ මේ අහේතුක සැක කිරීම සමඟ ජීවත්වන්නේ කෙසේද කියායි. අවසානයේ ඇය තම මිතුරියකට මේ ගැන කීවාය. මිතුරිය කීවේ වෛද්‍යවරයෙකු වෙත සම්පත් යොමු කරන ලෙසයි.

විලියම් ෂේක්ස්පියර්ගේ 'ඔතෙලෝ' නාට්‍යයේ ඔතෙලෝ ද මෙවන්ම පටලැවිල්ලක් හේතුවෙන් තම බිරිඳ සැකකර ඇය මරා දමනු ලබයි. අවසානයේ ඇයගේ නිර්දෝෂීභාවය වටහාගන්නා ඔතෙලෝද ජීවිතය හැර යන අතර ඒ වනවිට සැකය නිසා වන විනාශය වී අවසන්ය.

තමන්ගේ පෙම්වතිය බිරිඳ හුදෙකලාවේ ඉන්නවට කැමතියි. මේ සියල්ල කරන්නේ සැකය නිසා. සාමාන්‍ය මානසික තත්ත්වයකදී සැකයක් ඇතිවුණොත් ඊට අදාළ තොරතුරු තහවුරු වීමක් නොමැතිවිට එය යටපත්ව යනවා. ඒත් මේ තත්ත්වය තුළ එය එසේ නොවෙයි. ඇතැම් අවස්ථාවල පෙම්වතියට පෙම්වතාට ඒ ගැන පාපොච්චාරණය කරන්න කියලා තර්ජනය කරනවා. සමහරවිට පහර දෙනවා. එතැනදී සහකරු හෝ සහකාරිය බොරුවට හෝ එය පිළිගත්තොත් ඇතිවන තත්ත්වය ඔහුගේ සැකය තහවුරු වීමක් හැටියට ඔහු දකිනවා."

ඒ කරාපිටිය ශික්ෂණ රෝහලේ මනෝ වෛද්‍ය විශේෂඥ රූමී රුබන් මහතායි. ඔහු පෙන්වා දෙන්නේ එසේ නොකරන ලද වරදක් පිළිගැනීම තුළම, ඇයව හෝ ඔහුව තව තවත් අවිශ්වාස කරන්නට, ඒ තුළ තලා පෙලා දමන්නට රෝගියා උත්සාහ කරනු ලබන බවයි.

කතා කරනවා දුටුවහොත් ඔහුට එම පුද්ගලයාගේ හෝ තම සහකාරියගේත් ජීවිත නැති කරන්න හිතෙන සිතිවිල්ලක් එකවර ආ හැකියි. එහෙම සිදුවීම් ඕනෑතරම් සිදුවෙලා තියෙනවා. ඒ වගේම මෙය අදාළ පුද්ගලයා දිගින් දිගට මෙම මනෝභාවයන් තුළ හිඳීම විශාදය ඇති කරවන්නක්. ඒ වගේම ඔහුට නින්ද යන්නේ නැහැ. සතුටක් නෑ. බලාපොරොත්තුවක් නැහැ. තමන්ගේ ජීවිතය පවා නැති කරගන්න පෙලඹෙනවා."

මෙම රෝගීන් තමන්ට එවන් රෝගයක් ඇතැයි පිළිගන්නට අකමැති අතර, වෛද්‍යවරයෙකු වෙත යාමට කතා කළහොත් 'පිස්සුදැයි' අසන අවස්ථා තිබේ.

"එහෙම අකමැත්තක් දකින්න තිබුණත් මෙම රෝගයට ප්‍රතිකාර අවශ්‍යයි. ඖෂධ ප්‍රතිකාර වගේම මනෝ වෛද්‍ය උපදේශනයත් වැදගත් වෙනවා. එයට මොවුන් කිසිසේත්ම කැමති නැහැ. ඒ වගේම

මගේ යකා අවුසන්නේ නැතුව ඌත් එක්ක ගිය බව පිළිගනින්

ලිංගික ඊර්ෂ්‍යාව මායා රෝගයක්

මත්ද්‍රව්‍ය, මත්පැන් පානය මෙන්ම ලිංගික බෙලහීනතාවයන්ගෙන් පෙළීම නිසාත් මේ තත්ත්වය ඇතිවෙන්න පුළුවන්

කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය රූමී රුබන්

මෙම රෝගය ඔතෙලෝ සින්ඩ්‍රෝම් (Othello Syndrome) ය. රෝගාතුර ඊර්ෂ්‍යාව (Morbid Jealousy), මිථ්‍යා ඊර්ෂ්‍යාව (Delusional Jealousy) යන නම්වලින්ද මෙම රෝග තත්ත්වය හඳුන්වන අතර, ඊට ඔතෙලෝ නම ලැබුණේ ඉහත නාට්‍ය පසුබිමත් සමඟිනි.

'සැකය' ගිනි පුලිඟුවක් තරම් භයානක වූවකි. එය අලු යට තිබී වරින්වර දැල්වෙන්නා සේ තම සහකරු සහකාරිය අහේතුක පෙළීමකට ලක්කරනු ලබයි. මෙම සැකය තුළ කිසිඳු තහවුරු කරගත් සිද්ධි දෑමයක් නැතත්, තම මානසික වටාපිටාව තුළ එය ගලපාගැනීමට ඔහු උත්සුක වේ. අනතුරුව අදාළ පුද්ගලයා පෙලඹෙන්නේ එය තහවුරු කරන වටපිටාවක් මනසේ ඇඳගනිමින් තම සහකරු සහකාරිය දැඩි ලෙස ප්‍රශ්න කිරීමටය.

"මෙම තත්ත්වය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය තුළම දකින්න ලැබෙනවා. වැඩිපුරම පුරුෂ පාර්ශවය තුළ මෙම ලක්ෂණ දැකිය හැකියි. ඊට වයසක්, තරාතිරමක් නැහැ. තමන්ගේ පෙම්වතා, පෙම්වතිය, එහෙම නැත්නම් සහකරු, සහකාරිය ගැන ඇතිවන 'සැකය' තමයි මෙහි ප්‍රධාන ලක්ෂණය වෙන්නේ. මේ සැකය මාස ගණනක සිට හිතේ තියෙන්න පුළුවන්. එහිදී රෝගියා හඳුනාගන්න මාසයක කාලයක්වත් රෝග ලක්ෂණ සහිතව පසුවෙන්න ඕන. මෙහිදී සිදුවෙන්නේ නිශ්චිත හේතුවක් ඇතිව හෝ නැතිව සිතේ ඇතිවන සිතිවිල්ලක්. ඒ වගේම මෙතැනදී ඇතිවන සැකය තහවුරු කරන්න සාධක ඔහුම සොයාගන්නවා. ෆෝන් චෙක් කරනවා. හැක් කරනවා. සමහර අවස්ථාවල කතා කරන්නේ මොනවද බලන්න රෙකෝඩර් පවා සවි කරනවා. යාළුවෝ ආශ්‍රය කරන්න දෙන්නේ නෑ. පවුලේ ඥාතීන්වත් දුරස් කරවනවා.

මෙය මායා රෝගයක් ලෙස සැලකෙන අතර, අනෙකුත් මායා රෝගයන්ට වඩා මෙය වෙනස්ය. මෙහිදී තම පෙම්වතියට හෝ බිරිඳට අසීමිතව ආදරය කරන අතරම, ඉහවහා යන වෛර සිතිවිල්ලක්ද හිතේ පවතී. මෙම චකිනෙකට වෙනස් මනෝභාවය තුළ තම සහකරු හෝ සහකාරිය දැඩි පීඩාවකට ලක්කෙරේ.

මෙම රෝගය ඇතිවීමට බලපාන සාධක කිහිපයක් ඇත. ජානමය සාධක එහිදී මූලිකය. එනම් පවුලේ අයෙකු බීන්නොන්මාදය වැනි මානසික රෝගාබාධයකට ලක්ව ඇත්නම් ඔවුන් මෙම රෝගයේ ගොදුරක් වීමට ඉඩ තිබේ. මත්ද්‍රව්‍ය, මත්පැන් පානය මෙන්ම ලිංගික බෙලහීනතාවයන්ගෙන් පෙළීම, ස්නායු ආබාධ, අතීතයේ ප්‍රේම සබඳතා බිඳී ඇතිවන විරහව තුළ ලබන අමිහිරි අත්දැකීම්ද මීට හේතුවන අවස්ථා තිබේ.

"මෙතැනදී රෝගියා උත්සුක වෙන්නේ නැති දෙයක් සනාථ කරගන්න. ඒ වගේ අවස්ථාවක ඔහුගේ සැකයට භාජනය වන පුද්ගලයෙක්, තමන්ගේ සහකාරිය සමඟ

මෙම රෝගියාගේ මූලිකම ලක්ෂණය සැක කිරීම විතරක් වෙන්න පුළුවන්. වෙනත් කිසිඳු රෝග ලක්ෂණයක් නැහැ. බැලූ බැල්මටත් එසේයි. එහෙත්, තමන්ගේ සහකරුට හෝ සහකාරියට දැඩි ලෙස පීඩා විඳිල්ලකිරීම සිදුවෙනවා. තමන්ගේ දරුවෝ තමන්ගේ නෙවෙයි කියලා හිතනවා. ඇතැම්විටෙක මෙවැනි පුද්ගලයින්ට ප්‍රතිකාර ලබාදීමට නීතියේ පිහිට පතලා, රෝහල්ගත කර ප්‍රතිකාර ලබාදෙන්න සිදුවෙන අවස්ථා තියෙනවා. අඩුම තරමින් වසරක පමණ ප්‍රතිකාරවලින් අනතුරුව රෝගියා සුවපත් කරගැනීමේ බලාපොරොත්තු තබාගත හැකියි."

අහේතුක සැකයකින් සියල්ල බිඳ වැටෙන්නට නොදී තම පවුලේ ආදරණීයයන් ගැන අවධානයෙන් සිටින්න. නැතිනම් අහේතුක සැකයකට හිතේ සතුට, සැනසුම අහිමිව යනු ඇත. වටිනා ජීවිතයද අහිමිව යා හැකිය.

■ දීපා වසන්ති එදිරිසිංහ

“පිරිමින්ගේ කර්මාන්තයක් කියලා හංවඩු ගහපු ක්ෂේත්‍රයක ලොකු තනතුරක් දරන එක අභියෝගයක්. හැබැයි වැඩ කරද්දි මම ගැහැනියෙක් කියලා හිත හිතා ඉන්නේ නැහැ. මහන්සි වෙලා වැඩ කරන්න පුළුවන් නම් ඔය අභියෝග සේරම අපිට යටයි.”

එහෙම කියන්නේ හීනා නාගරාජන්. ඉන්දියාව කියන්නේ නිකන්ම නෙවෙයි කටුත් ගහලා සංස්කෘතික වැටවල් හදපු රටක්. විශේෂයෙන්ම ගෑනුන්ට. එහෙම රටක අරක්කු කර්මාන්තය පිරිමින්ගේ ආධිපත්‍යයට යටත් එකක් වීම අහන්න දෙයක් නෙමෙයි. හැබැයි 2020දී කාන්තාවක් ඒ ආධිපත්‍යය වෙනස් කළා. ගෑනුන්ට මත්පැන් තහනම් ඉන්දියාවේ ලොකුම මත්පැන් සමාගමේ නායකත්වය දරන්නේ ඔය උඩින් නම කියපු හීනා. ඉන්දියාවේ මත්පැන් සමාගමක කළමනාකාර අධ්‍යක්ෂ තනතුර දරාපු ප්‍රථම සහ එකම කාන්තාවත් ඇයයි.

හීනාගේ කතාව මතක් වුණේ ජානි නිසා.

ජානි ගනේෂන් ලංකාවේ ප්‍රමුඛ පෙළේ මත්පැන් සමාගමක් වන ‘රොක්ලන්ඩ් ඩිස්ටිලරීස්’ සමාගමේ සාමාන්‍යාධිකාරිනිය. සහකාර මූල්‍ය කළමනාකාරිනියක් විදියට වෘත්තීය ජීවිතය ඇරැඹූ ඇය අභියෝග, කැපකිරීම් මැද සාර්ථකත්වයේ හිනිපෙත්තට ආපු කාන්තාවක්. ඉතින් පිරිමින්ගේ ආධිපත්‍යය පැතිරුණු කර්මාන්තයක ඉහළ තනතුරක් දරන මේ සුවිශේෂී කාන්තාවට අද ‘ධරණී’ කවරය සරසන්න ඉඩ දෙන්න අපි හිතුවා.

කාන්තාවක් ලොකු පුටුවකට ආවම ආයතනයට වාසි වැඩියි

ජානි ගනේෂන්

ඔබ වරලත් ගණකාධිකාරිනියක් ඔවට පත්වෙන්නේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන්න කලින්. මේ කතාව අපි එතැනින් පටන්ගමු?

හොඳයි. කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ කළමනාකරණ උපාධිය හදාරන ගමන්ම මම චාර්ටඩ් අකවුන්ටින් කරන්න පටන්ගත්තේ. ඉතින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන්න කලින් මට වරලත් ගණකාධිකාරිනියක් වෙන්න පුළුවන් වුණා.. චාර්ටඩ් අකවුන්ටන්ට් කෙනෙක් වුණාට පස්සෙ මම මුලින්ම රැකියාවට ගියේ ඩයලොග් ආයතනයට. ඒ සහකාර මූල්‍ය කළමනාකාරිනියක් විදියට. එතකොට මට වයස අවුරුදු විසිපහයි. මම මුලින්ම රැකියාවට බැඳුණු අවස්ථාවේ මට වඩා වයසින් වැඩි සහ අත්දැකීම් බහුල කිහිපදෙනෙක් මට වාර්තා කළා. අවුරුදු විසිපහක තරුණියක් විදියට එය මට විශාල වගකීමක් වගේම නායකත්වය පිළිබඳ වටිනා අත්දැකීමක් වුණා. පොත්පත්වලින් ලැබෙන දැනුමට වඩා වැඩි දැනුමක් කණ්ඩායමක් විදියට වැඩ කරද්දි ලැබුණා.

සහකාර කළමනාකාරිනියක් විදියට පටන්ගත්ත වෘත්තීය ගමන ඔබ දැන් සාමාන්‍යාධිකාරිනියක් දක්වා පැමිණ තියෙනවා. ඒ ගමන ගැන කෙටියෙන් කියන්න?

ඩයලොග් ආයතනයෙන් පසුව මම මූල්‍ය කළමණාකාරිනියක් විදියට එක්වුණේ ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයට. එතැනදි මම කීල්ස් සුපර් ආයතනයේ වගේම එලිෆන්ට් හවුස් ආයතනයේත් මූල්‍ය කළමනාකාරිනියක් විදියට කටයුතු කළා. දැන් රැකියාව කරන රොක්ලන්ඩ් ඩිස්ටලරීස් ආයතනයට මම එක්වුණේ මූල්‍ය ප්‍රධානී විදියට. රොක්ලන්ඩ් එකට බැඳිලා වසර දෙකකට පසු මම එහි සාමාන්‍යාධිකාරිනිය ලෙස පත්වුණා.

***ගොඩක් කාන්තාවන් වෘත්තීය ගමන අතරමග නතර කරනවා. ඔබට හිතෙන විදියට එහෙම වෙන්නෙ ඇයි?**

ඒකට වගකියන්න ඕනි කාන්තාවන් වන අපිමයි. එයට හොඳ උදහරණයක් මම කියන්නම්. සාමාන්‍යයෙන් සමාගමක විධායක මට්ටමේ සියදෙනෙක් ඉන්නවා නම් එයින් හතළිහක් විතරම ඉන්නේ කාන්තාවන්. හැබැයි ඊට පියවර කිහිපයක් ඉහළින් තියෙන මැනේජර් ලෙවල් එකේදි ඒක සම්පූර්ණයෙන්ම වෙනස් වෙනවා. කළමනාකාර කියලා තනතුරු විස්සක් තියෙනවා නම් එතැන කාන්තාවෝ ඉන්නෙ දෙන්නයි. විධායක මට්ටමේදි සියයට හතළිහක් වුණු කාන්තා නියෝජනය කළමනාකරණ මට්ටමේදී සියයට දහයක් වෙලා.

ඒක එහෙම වෙන්න බලපාන බාහිර සාධකත් තියෙනවා. නමුත් වැඩි වශයෙන් ඒකට වගකියන්න ඕනි කාන්තාවන්ම තමයි. උසස්වීමකට සුදුසුකම් ලබන්න නම් වැඩි වගකීම් දරන්න වෙනවා. හැබැයි වගකීම් දෙන්න හදනකොට විවිධාකාර පෞද්ගලික හේතු මත ඒවා ප්‍රතික්ෂේප කරන කාන්තාවන් මම දැකලා තියෙනවා.

***ඔබේ වෘත්තීය අත්දැකීම් අනුව වෘත්තියෙන් ඉහළට යන්න කාන්තාවක් හිතන විදිය වෙනස් කරගන්න ඕනේ කොහොමද?**

කාන්තාවක් වීම නිසා වෘත්තීය ජීවිතයේ විශේෂ සැලකිලි ලැබෙන්න ඕනි කියලා හරි, මෘදු විදියට තමන්ට අනිත් අය සැලකිය යුතුයි කියලා හරි කාන්තාවන් හිතනවා නම් ඒක වැරදියි.

තවත් සමහර කාන්තාවන්ගෙ හිත්වල තියෙනවා තමන් කාන්තාවක් නිසා හවස පහෙන් පස්සෙ කාර්යාලයෙ ඉන්න ඕනි නැහැ, සතිඅන්තයේ වැඩ කරන්න බැහැ වගේ අදහස්. එහෙම අදහස් දරන කාන්තාවන්ට වෘත්තීය ජීවිතේ ඉහළට යන්න අමාරුයි.

මෙතැනදි කිවයුතු තවත් වැදගත්ම කාරණයක් තියෙනවා. සමාන තනතුරු දෙකක කාන්තාවක් සහ පිරිමි කෙනෙක් ඉන්න අවස්ථාවක පිරිමි කෙනාගේ වැටුපට වඩා කාන්තාවගේ වැටුප තරමක් අඩුවෙන්න පුළුවන්. එහෙම වෙලාවට කාන්තාව හිතනවා ‘මම කාන්තාවක් වෙලත් මට මේ තනතුර දුන්නනෙ, ඒ නිසා වැටුප ගැන ප්‍රශ්න කරන්න අවශ්‍ය නැහැ’ කියලා. එහෙම හිතන්න හොඳ නැහැ. දෙන්නම එකම සේවය නම් ලබාදෙන්නෙ කාන්තා පිරිමි කියලා භේදයක් නැතිව එකම වැටුප් සහ වරප්‍රසාද ලැබිය යුතුයි. ඒ වෙනුවෙන් හඬ නගන්න තරම් ආත්මශක්තියක් කාන්තාවන්ට තිබිය යුතුයි.

***කාන්තාවන් ඉහළ තනතුරුවල ඉන්නකොට ආයතනයට වාසියි කියලා ඔබ හිතනවද?**

ඒකට හොඳ උදහරණයක් මම ඔබට කියන්නම්. ඒ තමයි අන්තර්ජාතිකව කරපු සමහර පරීක්ෂණවලින් අනාවරණය වෙලා තියෙනවා අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩි කාන්තා නියෝජනයක් තියෙන සමාගම්වල මූල්‍යමය ප්‍රතිඵල, එහෙම නොවන සමාගම්වලට වඩා වැඩියි කියලා.

යම් ප්‍රශ්නයක් දිහා පිරිමි ප්‍රධානියෙකුයි කාන්තා ප්‍රධානියෙකුයි බලන විදිය හාත්පසින්ම වෙනස් වෙන්න පුළුවන්. පිරිමි පුද්ගලයා ඒ ප්‍රශ්නය ආයතනයට බලපාන්නෙ කොහොමද කියලා බලද්දි කාන්තාව බොහෝවිට එය පැති ගණනාවකින් බලනවා. මතුවෙලා තියෙන ප්‍රශ්නය ආයතනයට, සේවකයින්ට, පාරිභෝගිකයින්ට වැනි පාර්ශවවලට වෙන වෙනම බලපාන්නෙ කොහොමද කියලා ඇය හිතනවා. ඒක හරියට අම්මා කෙනෙක් ගෙදර ප්‍රශ්නයක් දිහා හැම පැත්තකින්ම බලනවා වගේ වැඩක්. අම්මා ප්‍රශ්නයට උත්තර හොයන්නෙ පවුලේ හැම සාමාජිකයෙක් ගැනම හිතලා. බොහෝ කාන්තා ප්‍රධානීන් ප්‍රශ්න විසඳන්න උත්සාහ කරන්නෙත් ඒ ප්‍රශ්නයට මැදිවෙලා ඉන්න හැම පාර්ශවයක් ගැනම හිතලා. ඒක කාන්තාවන්ට සංවේදී බවත් එක්ක එන විශේෂ දක්ෂතාවයක්.

***සම්ප්‍රදායිකවම අපේ පවුල්වල වැඩි වගකීම් පැවරෙන්නේ කාන්තාවට. එහෙම වගකීම් පැවරෙන එක කාන්තාවගේ වෘත්තීය දියුණුවට බාධාවක්ද?**

මෙහෙමයි. අපි කොයිතරම් බටහිර සංස්කෘතියට අනුගත වෙන්න හැදුවත් අපේ රටේ කාන්තාවකට සම්ප්‍රදායිකව ලැබෙන පවුලේ වගකීම්වලින් ඇයට සම්පූර්ණයෙන්ම නිදහස් වෙන්න බැහැ. එහෙම නිදහස් වෙන්න ඕනි කියලා මම හිතන්නෙත් නැහැ.

පවුලේ සහාය නැතිව කාන්තාවකට වෘත්තීය ජීවිතයේ ලොකු ගමනක් යන්න අමාරුයි. තමන්ගෙ වෘත්තීය ගමන ගැන නිවැරදි අදහසක් පවුල තුළට දුන්නහම කිසිම පවුලක් එයට බාධා කරයි කියලා මම හිතන්නෙ නැහැ. මගේ වෘත්තිය ගැන විශ්වාසයක් මගේ පවුලෙ අයට තියෙනවා නම් සම්ප්‍රදායිකව මට පැවරෙන පවුලේ වගකීම් මා සමඟ බෙදගන්න ඔවුන් ඉදිරිපත් වෙනවා. එහෙම වුණහම පවුලේ වගකීම් බාධාවක් කරගන්නෙ නැතිව කාන්තාවකට තමන්ගේ වෘත්තීය ගමන යන්න පුළුවන්.

***වෘත්තියෙන් ඉහළට යන බිරිඳකට සැමියාගේ සහායත් අවශ්‍යයි නේද?**

අපි ඔතැනදි බොහොම පැහැදිලිව තේරුම්ගන්න ඕනි දේ තමයි දෙන්නෙක් එකතුවෙලා එක පවුලක් හදගත්තට ඒ

අපි කොයිතරම් බටහිර සංස්කෘතියට අනුගත වෙන්න හැදුවත් අපේ රටේ කාන්තාවකට සම්ප්‍රදායිකව ලැබෙන පවුලේ වගකීම්වලින් ඇයට සම්පූර්ණයෙන්ම නිදහස් වෙන්න බැහැ. එහෙම නිදහස් වෙන්න ඕනි කියලා මම හිතන්නෙත් නැහැ

දෙන්නට තියෙන්නේ වෘත්තීය ගමන් දෙකක් කියන එක. දෙවිදියක හීන වී දෙන්නට තියෙන්නේ. එතකොට දෙන්නම දැනගන්න ඕනි එකිනෙකාට ගරු කරන්න. ඔවුන්ගේ වෘත්තීන්වල ස්වභාවය අඳුනගන්න.

සැමියගෙ හීන හැබෑ කරගන්න බිරිඳ උදව් කරන්න ඕනි. වී වගේම බිරිඳගේ හීන හැබෑ කරගන්න සැමියා උදව් කරන්න ඕනි. එහෙම නොවී එක්කෙනෙක් හරි පසුපසට ගියොත් එහෙම පසුපසට ගිය කෙනා ඉන්නෙ සතුටින් නෙමෙයි. අපි හිතමු එහෙම අසතුටින් ඉන්නෙ බිරිඳ කියලා. එතකොට ඇය කොහොමද සැමියව සතුටින් තියන්නේ?

හැබැයි මම මේකත් කියන්නම ඕනි. දැන් සමාජය අතීතයට වඩා සෑහෙන වෙනස්. බොහෝ සැමියන් ඔවුන්ගේ බිරියන්ට වෘත්තීයමය විදියට ඉදිරියට යන්න ගොඩක් උදව් කරන හැටි අපි දකිනවා. එහෙම කරන සැමියන්ව අපි අගය කරන්නම ඕනි. මමත් වාසනාවන්ත වෙලා තියෙනවා මගේ හීන ඉටු කරගන්න මටත් වඩා උනන්දු සැමියෙක් ලබන්න.

ඉහළ තනතුරක ඉන්න කාන්තාවක් විදියට ඔබ කොහොමද පිරිසක් පාලනය කරන්නේ?

පාලනය කියන වචනය වෙනුවට කළමනාකරණය කියන වචනය භාවිත කරන්න මම කැමතියි. මොකද ආයතනයක පිරිසක් කළමනාකරණය කරනවා හැර පාලනය කරන්න බැහැ. ඒ නිසා මම කරන්නේ මගේ යටතේ වැඩ කරන අය කළමනාකරණය කරන එක. ඔතැනදි වැදගත්ම දෙයක් තමයි සේවකයෙක් තමන් වැඩකරන ආයතනයෙන් සේවයට සරිලන වැටුපක් බලාපොරොත්තු වෙනවා වගේම එතැනින් තමන්ට ගෞරවයකුත්, රැකියාවේ ප්‍රගතියකුත් බලාපොරොත්තු වෙනවා. ඕනිම තරාතිරමක සේවකයෙක්ට වී ගෞරවය සහ අවස්ථාව දෙන්න අපිට පුළුවන් වෙන්න ඕනි. එතකොට කාන්තා ප්‍රධානියෙක්ට වුණත් සේවකයින් කළමනාකරණය කරගන්න එක අපහසු දෙයක් නෙමෙයි.

කාර්යබහුල ජීවිතේට විවේකයක් හොයාගන්නේ කොහොමද?

කැමැත්තෙන් සහ ආශාවෙන් කරන කටයුතුවලදි කාර්යබහුල බවක් දැනෙන්නෙ නැහැ. හැමදේම නිසියාකාරව සැලසුම් කරන නිසා විවේක කාලය ඉබේම ලැබෙනවා. රැකියාවේ කටයුතුවලට පරිබාහිරව මම වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ නොයෙක් කටයුතුවලට සම්බන්ධ වෙනවා. තරුණ වරලත් ගණකාධිකරීවරුන්ගේ සංගමයේ සභාපති තනතුරත් දරලා තියෙනවා. දේශකයෙක් විදියටත් කටයුතු කරනවා. මම Toastmaster කෙනෙක් වුණේ මගේ කථික හැකියාවන් දියුණු කරගන්න. මේ හැමදෙයක්ම මම සතුටින් කරන්නේ.

පවුල සහ සමීප මිතුරන් සමඟ කාලය ගත කිරීමත් මම මගනොහැර කරන දෙයක්. ව්‍යායාම කිරීමත් මගේ ජීවිතයේ අනිවාර්යය අංගයක්. නිරෝගී බව ආරක්ෂා කරගන්න අවශ්‍ය දේ වෙනුවෙන් අනිවාර්යයෙන්ම කාලය වෙන් කරනවා. අපි හැමෝටම තියෙන්නේ පැය විසිහතරයි. වී පැය විසිහතර හරියට කළමනාකරණය කරගන්න අයට මේ කිසිදෙයක් අපහසු දේවල් නෙමෙයි.

■ **හසිත කුරුප්පු**

ඡායාරූප - හසිත නිලුපුල්

මගේ ප්‍රින්සිපල් ලෙඩ වුණාම බලාගන්න මම කවදාහරි වෛද්‍යවරියක් වෙනවා

අත්තනායක
එම්. හේරත්

රත්තරන් දුවේ

පේරාදෙණිය රාජකීය විද්‍යාලයෙන් එක්තරා දවසක මට ආරාධනාවක් ලැබුණා. ඒ ඉස්කෝලේ විදුහල්පතිවරයා විශ්‍රාම යන දවසේ සිසු දෙමාපියන් අමතා ගුරුවරු පිළිබඳ අනුස්මරණ දේශනයක් කිරීමට. ඒ විදුහල්පතිතුමා මං දැනගෙන හිටිය කෙනෙක් නෙවෙයි. ඒත් මං ආරාධනය භාරගත්තා. රෝයල් විද්‍යාලය පිරිමි විද්‍යාලයක්. මං උත්සවයට ගියාට පස්සේ චාරිත්‍රානුකූලව කෙරෙන කටයුතු එකින් එක අවසන් වුණා. ඊටපස්සේ තිබුණේ මගේ දේශනය. මම කතා කරන්න යනවිටම සුදු ඇඳගත් මහාමායා ශිෂ්‍යාවක් මගේ ළඟට ආවා.

"සර්ගේ කතාවට කලින් මට සර්ගේ කාලයෙන් පුංචි වෙලාවක් දෙනවද කතාවක් කරන්න?"

නෘත්‍ය පත්‍රානුකූලව ඒ වගේ අවදානම් වැඩක් කරන එක ටිකක් භයානක වුණත් ඒ වගේ ඇට්ටර වැඩ කිරීමට මම ගොඩක් කැමති හින්ද මං ඒ දුවත් එක්ක වේදිකාවට ගොඩවුණා. මම වේදිකාවට ගොඩවෙනකොටම ඒ සිදුවීම බලාගෙන හිටිය විශ්‍රාම ගන්නා විදුහල්පතිතුමා ඒ දුවගේ ක්‍රියාව දිහා සැලකිල්ලෙන් බලාගෙන ඉන්න බව මං දැක්කා. ඇය පළමුවෙන් සභාවෙන් අවසර ගත්තා. තමන්ගේ කාලයෙන් විනාඩි කිහිපයක් ලබාදීම ගැන මටත් ස්තූති කරා. මං කිව්වනේ දුවේ මේ පාසල පිරිමි පාසලක් කියලා. ඒ හින්ද මේ වෙන්න යන දේ ගැන මටත් පුදුමයි.

ඉතින් දුවේ ඒ දුව කියන්න පටන්ගත්තා මෙහෙම කතාවක්. ඒ දුව ඉගෙනගෙන තියෙන්නේ පේරාදෙණිය පැත්තේ මිශ්‍ර ඉස්කෝලෙක. ඒ ඉස්කෝලේ විදුහල්පතිතුමා විදියට ඉඳලා තියෙන්නේ අද විශ්‍රාම යන මුල් ගුරුතුමා. ඒතකොට එයා ඉඳලා තියෙන්නේ හය වසරේ. අම්මා තාත්තාටත් මේ දුවට ඉගැන්වීමට ඒ තරම් උවමනාවක් තිබිලා නැහැ. මේ දුවට ඉගෙනගන්න ඕනකමක් තිබිලත් නැහැ. ඒ හින්ද මේ දුව ඉස්කෝලේ ඇවිල්ලා තියෙන්නේ ගෙදර ඉන්න කම්මැලිකමට. ආණ්ඩුවෙන් නිකන් දෙන සුදු රෙදි ටිකයි, නිකන් දෙන පොත් ටිකයි හින්ද ඉස්කෝලේ ආවා මිසක් ඇයට අධ්‍යාපනය ලැබීමේ අවශ්‍යතාවයක් තිබිලා නැහැ. ඉස්කෝලේ උගන්වන පාඩම් වැඩට සහභාගී වුණා මිසක් අතිරේක පංතිවලටවත් ඇය සහභාගී වෙලා නැහැ. අම්මලා යන්න කියලත් නැහැ. මේ අතර දහය වසරේ ඉගෙනගන්න ඒ දුව තමන් දන්න හඳුනන කෙනෙක් එක්ක ප්‍රේම සම්බන්ධයක් පටන්ගත්තා. මේ සිදුවීම සිදුවෙන කාලයේ ජංගම දුරකතන භාවිතය දියුණු වෙලා තිබුණෙත් නැහැ. ප්‍රේමය ප්‍රකාශ කරගැනීමට ලියුම් ලියන කාලයක තමයි මේ සිදුවීම සිද්ධ වුණේ. ඇගේ දෙමව්පියෝ මේ දුවගේ හැසිරීම් ගැන හෙව්වෙත් නැහැ. ඒ හින්ද එයා තම පෙම්වතාට ලියුම් ලියමින් විනෝදෙන් කලදවස ගෙව්වා. ඔය අතරේ පෙම්වතා දුන්න ලිපියක් ඇගේ අත්වැරදීමක් හින්ද පංතිභාර ගුරුතුමියගේ අතට අහුවුණා. ලිපිය දැකලා පංතිභාර ගුරුතුමිය කෝපයෙන් වෙව්ලන්න පටන්ගත්තා. ගුරුතුමිය හැසිරුණේ ලෝකෙ පළවැනි පෙම් ලිපිය තමන් අතට පත්වුණා තරම් කෝපයකින්. ජීවිතයේ කිසිම දවසක කිසිම කෙනෙකු හා ප්‍රේමයක් විඳලා නැති ගුරුවරියක් වගේ ඇය මේ දුව දිහා බලාගෙන ඉඳලා පාසලේ විනයභාර ආචාර්යවරිය වෙත ඇය පිටත් කරා. ඇය මේ දුවගෙන් ඒ තරුණයා ගැන නොයෙක් දේ ඇහුවා. රෝමියෝ ජුලියට්ට පසු පෙම් ලිපියක් මේ ගුරුතුමී කවමදකවත් දැකලා තිබුණේ නැහැ. ඇය මේ දුව දිහා බැලුවේ පලිගන්නා දෑසකින්. මේ ටීචගේ වැඩේ ළමයින්ගේ මේ වගේ කාරණා ඉස්කෝලෙ පුරාම පතුරලා ඒ ළමයට ඉස්කෝලෙ එපා කරවන එක බව මේ දුව දැනගෙන හිටියා. ඇය මේ දැරිවිවත් රැගෙන විදුහල්පතිතුමා ළඟට ගියා. ඇයට පෙම්වතා ලියා එවූ පෙම්පත එතුමිය විදුහපල්පතිතුමාට දුන්නා. එතුමා ලිපිය දිහා බැලුවෙවත් නැහැ. ඇය දිහා බලලා මුල් ගුරුතුමා ඒ ලිපිය කෑලි කෑලිවලට ඉරලා කුණු කූඩෙට දැම්මා.

"ටීචර් මේ ප්‍රශ්නේ මෙතැනින් ඉවරයි. කිසිම ගුරුවරයෙකුට මේ කේලම කියන්න එපා. එහෙම කියලා පතුරවලා තිබුණොත් මං ඒ ගැන බලාගන්නම්."

දැරියව මඳක් එළියට යවා එතුමා ගුරුවරියට තදින් දෝෂාරෝපණය කරා. පංතිභාර ගුරුමියවත් ගෙන්නුවා. ඇයට ගුරුතුමා දෙස් කිව්වා. ඒ ගුරුවරු කරන්නේ ළමයින්ගේ මේ වගේ වරදක් දැක්කම විසඳන එක නෙවෙයි. ඒක රහ කර කර ගුරු විවේකාගාරයේ පතුරන එක. ඉතින් ආපහු ළමයව කැඳවපු ගුරුතුමා ඇයට කිව්වා

"දුවේ ඒක ඉවරයි. ඔයා ඉගෙනගන්න. පෙම් කරන්න ඕන වයසක නෙවෙයි දුව ඉන්නේ, ඉගෙනගන්න වයසක. දුව බයවෙන්න එපා. ඔයා පංතියට යන්න."

දුව හිතුවේ මුල් ගුරුතුමා දෙමව්පියන් කැඳවලා තමන්ව දැඩි අසරණ තත්ත්වයකට පත්කරයි කියලා. සිද්ධිය එතැනින් නතර වුණා. පංතිභාර ගුරුතුමියයි විනයභාර ගුරුතුමියයි මේ දුවගේ කතාව පැතිරුවේ නැහැ. මුල් ගුරුතුමාගේ හැටි දන්න හින්ද ඒ අය නිහඬ වුණා. හැබැයි ඒ දෙන්නා එදයින් පස්සේ මේ දුවගේ මූණ දිහාවත් බැලුවේ නැහැ. විදුහල්පතිතුමාගේ හිතුවක්කාර වැඩ ගැන ඒ දෙන්නා හිටියේ දැඩි කළකිරීමෙන්. එදා ඉඳලා මේ දුව අර ප්‍රේම සබඳතාව අතහැරියා. ඒ පිරිමි ළමයා මේ දුව පස්සේ ආවෙත් නැහැ. ඇය ආදරණීය මුල් ගුරුතුමා දුන්න දඬුවම භුක්ති වින්ද. මුල් ගුරුතුමා ඇයට පහර දුන්නේ නැහැ. කොන් කරේ නැහැ. ඉතින් දුවේ එදා ඉඳලා දුවගේ සම්පූර්ණ අවධානය ඉගෙනීමට යොමුවුණා. දෙමව්පියන්ට මේ වෙනස තේරුණේ නැහැ. කොහොමටත් ඒ අය දරුවගේ අධ්‍යාපනය ගැන ඒ හැටි අවබෝධයක් තිබ්බ අය නෙවෙයි. ඇය වසරක් ඇතුළත ඒ පාසලට කීර්තියක් ගෙන දෙමින් A9ක් සහිතව සමත් වුණා. ඉතින් දුවව කැඳවලා මුල් ගුරුතුමා ඇයට සුබ පැතුවා. දැන් දුව වෙන ඉස්කෝලෙකට යා යුතුයි. මුල් ගුරුතුමා ඒකටත් උදව් කරා. ඇය මහාමායාවට තේරුණා. මහාමායාවේ ඇඳුමෙන් සැරසී විද්‍යා විෂයයන් හදාරණ ඇය විදුහල්පතිතුමා දෙස බලාගෙන කිව්වා,

"මේ ඉන්නේ මගේ ඒ මුල් ගුරුතුමා."

මුළු සභාගැබක් කෙළවරක් නැති අත්පොළසන් නාදයකින් පුංචි දුවට ගෞරව කළා. ඇය අවසානයට කියපු දේ දුවේ මගේ කන් අස්සේ තවම දෝංකාර දෙනවා.

"මගේ මුල් ගුරුතුමා අපේ මිශ්‍ර පාසැලෙන් මාරුවුණා මේ ඉස්කෝලෙට. ඒක මට ආරංචි වෙලා මම ආවා මේ උත්සවයට. අත්තනායක සර් මට අවස්ථාවක් දෙන බව මම දැනගෙන හිටියා. මම කොහොම හරි වෛද්‍ය විද්‍යාලයට යනවා. ගිහින් මං වෛද්‍යවරියක් වෙනවා. ඒ මොකටද දන්නවද? මට පහර නොදී අවවාද දීලා මාව මේ වගේ තත්ත්වයකට පත්කරපු මගේ මුල් ගුරුතුමා ලෙඩ වුණාම මට ඕන එතුමාව බලාගන්න. මං දෙස්තර වෙන්නේ මගේ සර්ට උදව් කරන්න."

සභාගැබ නොනවත්වා අත්පොලොසන් දෙන්න වුණා. විදුහල්පතිතුමා හිස ඔසවා බැලුවේ නැහැ. එතුමා බිම බලාගෙන සිටිනවා විතරයි මම දැක්කේ. ඒ උත්සවයේ ප්‍රධාන දෙසුම ඒ දුව කරා. හැමතැනම ප්‍රධාන දේශකයා වුණ මම එදා අප්‍රධාන දේශකයා වුණා. මං ඒ හැටි දිගු කතාවක් කරේ නැහැ.

කාලය ගෙවී ගියා. ඒ දුව උසස් පෙළ සමත් වුණාද? වෛද්‍ය විද්‍යාලයට ගියාද? මම දන්නේ නැහැ. ඔය සිද්ධියෙන් වසර පහකට පස්සේ මට කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආරාධනාවක් ලැබුණා වෛද්‍ය පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් දේශනයක් පවත්වන්න රස වින්දනාත්මක ගීත සාහිත්‍ය ගැන. ඒ.එන්.ඕ. ධර්මදාස, නන්දා මාලනී වගේ අයත් මාත් එක්ක ඔය ගී රස වින්දන සැඳෑවට එකතු වුණා. ඒ වැඩේ ඉවරවුණ ගමන් එක දුවෙක් මගේ ළඟට දුවගෙන ආවා.

"සර්ට මාව මතකද? අර රෝයල් කොලේජ් එකේ මගේ මුල් ගුරුතුමාගේ උත්සවයේ කතාව කෙරුවේ මම. මම වෛද්‍ය විද්‍යාලයට ආවා සර්. සර්ට මතකද මගේ පොරොන්දුව? තව ටික දවසකින් මම වෛද්‍යවරියක් ලෙස සේවය අරඹනවා මගේ මුල් ගුරුතුමාට බෙහෙත් දෙන්න. මගේ නියම අප්පච්චිට බෙහෙත් දෙන්න. මම සර් හොයාගෙන යනවා."

ඇගේ ඒ උදන වාක්‍යයට අත්පොලොසන් දෙන්න කෙනෙක් එතැන හිටියේ නැහැ. ඒ දුව අද කොයි රෝහලේ ඉන්නවද? ඇයට මුල්ගුරුතුමා හමුවුණාද? මම දන්නේ නැහැ. ඒත් මේ සිදුවීමෙන් මට තවත් දෙයක් කල්පනා වුණා.

පේරාදෙණිය වෛද්‍ය පීඨයේ, කොළඹ වෛද්‍ය පීඨයේ පමණක් නෙමෙයි මුළු ලෝකයේම අවධානයට ලක්වෙච්ච මහාචාර්ය සේනක බිබිලේ මහත්තයා ගැන සඳහනක් කරන්න ඕන දුවේ. එතුමා ඉපදුණාට පස්සේ එතුමගේ අම්මට කිරි එරුණේ නැහැ. බිබිලේ දරුවගේ තාත්තා ගමේ දුප්පත් අම්මලට චන්න කියලා ඒ දුප්පත් අම්මලට කියලා දුප්පතුන්ගේ කිරි බිබිලේ දරුවාට පොවන්න සැලැස්සුවා. බිබිලේ මහත්තයගෙ තාත්තා රදළයෙක් වුණත් ගැමියා තලාපෙලා වැඩගත් කෙනෙක් නෙවෙයි. එතුමා තම පුතාට නිතරම කිව්වේ බීපු කිරිවල ණය ගෙවන්නනම් කවදහරි මේ දුප්පත් අම්මලට සේවය කරන්න කියලා. තමන්ගේ කුඹුරු ගොවින්ට අඳේට දුන්නත් ඒවයේ වැඩි ලාභය බිබිලේ මහත්තයා දුන්නේ දුප්පත් ගැමියන්ට. ඉතින් දුවේ පුංචි බිබිලේ දරුවා ඉගෙනගන්න ආවේ ත්‍රිත්ව විද්‍යාලයට. ඔය අතරේ තාත්තා නැතිවුණා. බිබිලේ දරුවට අධ්‍යාපනය අතහරින්න කටයුතු යෙදුණා. නමුත් ත්‍රිත්ව විද්‍යාලයේ ගුරුවරු එකතුවෙලා බිබිලේ දරුවට ඉගැන්නුවා. එතුමා කොළඹ වෛද්‍ය විද්‍යාලයට තේරුණා. දෙස්තර විභාගය පාස්වෙච්ච බිබිලේ මහාචාර්යතුමාට ඕන වුණා අර අම්මලා හොයාගෙන ගිහිල්ලා සලකන්න. අනේ එතකොට ඒ අම්මලා සේරම නැතිවෙලා. ඊටපස්සේ තමයි ලෝකයේ බෙහෙත් මාෆියාවට එරෙහි සටන එතුමා පටන්ගත්තේ. වෛද්‍ය නාමයෙන් පමණක් බෙහෙත් නිකුත් කිරීම මුළු ලෝකයේම රැල්ලක් බවට පත් කරා. තමන්ට කිරි දුන් අම්මලා නැති හින්ද රටේම අම්මලා වෙනුවෙන් ඖෂධ ප්‍රතිපත්තියේ වෙනසක් එතුමා ඇති කරා. S.P.S බෙහෙත් ලාභ කරා. රාජ්‍ය ඔසුසල එතුමාගේ සංකල්පයක්. එතුමගේ මේ විප්ලවයට බෙහෙත් සමාගම් විරුද්ධ වුණා. එතුමාට මරණීය තර්ජන ආවා. මේ ශ්‍රේෂ්ඨ මහඇදුරා හදිසියේම මියගියා.

අර දුව වෛද්‍ය විද්‍යාලයෙන් නුවර එනකොට මුල් ගුරුතුමා හිටියත් නොහිටියත් දුප්පත් ජනයාට සලකන්න ක්‍රමයක් ඇති කරලයි දෙස්තර බිබිලේ මියගියේ. දුප්පතුන්ට සලකන්න කියලා ඌවේ මහකළු සිංහලයා කිව්ව අභියෝගය මහාචාර්ය සේනක බිබිලේ මහත්තයා ඉෂ්ට කරා. ඉතින් මගේ දුවේ ඉගෙනගෙන ඉවර වෙනකල් ප්‍රේමය, කසාදය ඔයාලගේ පරිච්ඡේදය කරගන්න එපා. සාගින්නේ හරි ඉගෙනගන්න. මුල් ගුරුතුමා පෙන්වූ මාර්ගයේ ගිය දුව එතුමා කියූ තැනටම ගියා. මහාචාර්ය සේනක බිබිලෙත් තාත්තගේ අවවාදය භාරගෙන ඒ විදියටම කළා.

අත්තනායක එම්. හේරත්

HEALTHSERVE
Health Consultancy

එක්සත් අරාබි එමීර් රාජ්‍යයයේ ලියාපදිංචි සමාගමක් වන
HEALTHSERVE HEALTH CONSULTANCY අප සමාගම ශ්‍රී ලංකාවේ
ගෞරවාන්විත හෙද වෘත්තියේ නියැලී සිටින ඔබ සඳහාම කරන ඇරයුමයි.

ඉහල වැටුප් සහිත Dubai හි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවක් කිරීමට අත්‍යාවශ්‍යම DHA / DOH / MOH බලපත්‍ර ලබා ගැනීම සඳහා අවශ්‍ය විශ්වාසදායී සියලුම මඟ පෙන්වීම් කඩිනම් සේවාවක්, සාධාරණ අය කිරීම යටතේ අප ඔබට ලබා දෙන්නෙමු.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පමණක් නොව මැද පෙරදිග අනෙකුත් රටවල් වන Oman, Qatar, Kuwait, Saudi Arabia සහ Bahrain සඳහා අවැසි සෞඛ්‍යය බලපත්‍ර ලබා ගැනීම සඳහා වන මඟ පෙන්වීම ද අප විසින් සිදු කරනු ලබයි.

- ❖ බලපත්‍රය සඳහා අවශ්‍යය ලිපි ලේඛන සහ සහතික පත්‍ර පිළිබඳව දැනුවත් කිරීම.
- ❖ සුදුසුකම් සහ පළපුරුද්ද මත අයදුම් කිරීමට සුදුසු බලපත්‍ර පිළිබඳව නිසි මඟ පෙන්වීම සිදු කිරීම
- ❖ Primary Source Verification සහ Data Flow යොමු කිරීම් දක්වා නිරවුල් මඟ පෙන්වීම සහ සහය වීම.
- ❖ බලපත්‍ර ලබා ගැනීම සඳහා වන Prometric Exam සඳහා අවශ්‍යය අධ්‍යයන ලේඛන ලබා දීම. (Online Study Materials)
- ❖ බලපත්‍ර ලබා ගැනීමෙන් පසුවද රැකියා අයදුම් පත් (CV) සකස් කිරීම ඇතුළු රැකියා සඳහා අවශ්‍ය පූර්ණ මඟ පෙන්වීම සිදු කිරීම.

සියලු විස්තර සඳහා අපගේ පහත වෙබ් අඩවියෙන් හෝ සෘජුවම අපගේ Whatsapp ගිණුම හරහා පණිවිඩයක් යොමු කිරීම මඟින් අප හා සම්බන්ද විය හැකිය.

+971-50-272-0059 www.healthserve.ae info@healthserve.ae
#332, Sultan Business Center, Oud Metha, Dubai - UAE

දිරිය කාන්තාවන්ට
LIC ලංකා ඒකෂණ සමාගමෙන් සුභ පැතුම්!

ජාත්‍යන්තර
කාන්තා දිනය 2023

LIC
The Hands that Protect
Life Insurance Corporation (Lanka) Ltd.

ජීවිත කාලයට, ජීවිතයටම අත්වැලක්

ශානෙල් බිල්ඩින්
29/2, විසාකා පාර, කොළඹ 04.
www.liclanka.com
ටෙලි: 011255 22 77
ෆැක්ස්: 0112590495

Women's Day Promotion

Born to Shine!

Celebrating the spirit of womenhood

SPECIAL OFFER
Rs.48,000

22kt 22kt
Chain + Pendent
with Gem & Jewellery Certificate

LIMITED STOCK

SKJ
SRI KANTHA
JEWELLERS

Valid from 1st -12th March 2023
*T&C Apply

SRI KANTHA JEWELLERS
Head Office : No. 717, Pannipitiya Rd, Battaramulla.

Battaramulla | Malabe | Godagama |
Maharagama | Hanwella

Hot Line : 077 5 529 528

ගැනු ළමයින්ට තෙල් වැඩි වුණත් ප්‍රශ්න අඩු වුණත් ප්‍රශ්න

මිචෙල් ෆර්බෙර් ඇමරිකානු චර්ම රෝග වෛද්‍යවරියක්. තෙතමනකාරකයක් පාවිච්චි නොකර ඉන්දැද්දි සමට වෙන විපැත්තිය පැහැදිලි කරන්න ඇය අපූරු පරීක්ෂණයක් කළා. ඒකට භාජනය වුණොත් මිචෙල්මයි.

මිචෙල් එයාගේ මූණේ එක පැත්තක් තෝරගෙන ඒ පැත්තට හැමදම මොයිස්චරයිසර් ක්‍රීම් ගෑවා. පැත්තකට ගෑවේ නෑහැ. දවස් තුනකට පස්සේ ක්‍රීම් ගෑව පැත්තට වඩා අනිත් පැත්ත වේළිලා. ඔහොම සතියක් ගියාට පස්සේ ඒ පැත්ත වේළිලා මදිවට මළානික පාටකුත් ගත්තා. මාසෙකින් මොයිස්චරයිසර් නොගාපු පැත්ත හොඳටෝම වේළිලා රතු පැල්ලම් ආවා. මාසෙකින් මිචෙල් පරීක්ෂණේ නතර කළා. එහෙම නොකළා නම් ඇගේ මුහුණේ සියුම් රැළි ඇතිවෙන්න තිබුණා කියලයි වෛද්‍යවරිය කිව්වේ.

මොයිස්චරයිසර් නැත්තම් තෙතමනකාරකයක් ගාන එකෙන් හමේ ඇතිවෙන්න පුළුවන් ප්‍රශ්න කීපයක්ම වළක්වගන්න පුළුවන්. හැමදේකටම වගේ අපේ හමටත් අන්ත දෙකක් තියෙනවානේ. මූණ වේළිලා කියලා කොටසක් කණු කුණු ගාද්දි තව කාණ්ඩෙකට ඕකේ අනිත් පැත්ත. කැවුම් බැදගන්න තරමට හමේ තෙල්. ඔය අන්ත දෙකටම නොයා මැදුම් පිළිවෙතින් සම තියාගන්න හොඳම උපක්‍රමේ තමා මොයිස්චරයිසර්. හැමදම පුරුද්දක් විදියට මොයිස්චරයිසර් ටිකක් ගාන්න ඕනේ ඇයි කියන කාරණාව වගේම ගෙදරදිම මොයිස්චරයිසර් හදාගන්න හැටිත් අද ලිපියෙන් කතා කරමු.

හමට තෙතමනකාරක ගාන්න ඕනය කියන එක මුලින්ම හොයාගෙන තියෙන්නේ ඊජිප්තුවරු. ඒ කාලේ හිටපු හැම ඊජිප්තු කුමාරිකාවක්ම මොයිස්චරයිසර් එකක් විදියට ඇඟට ඔලිව් තෙල් ගාලා. 1550 ගණන්වල එංගලන්තේ රජකම් කරාපු පළමුවැනි එලිසබත් රැජිනත් රූපේ ගැන සෑහෙන්න හිතාපු කෙනෙක්නේ. ඉතින් එතුමිය මොයිස්චරයිසර් එකක් විදියට හැමදම ඇඟ පුරාම මී පැණි ගානවලු. ඉස්සර කාන්තාවෝ රූපේ ගැන හිතපු තරම් දැන් අයට ගානක් නෑ කියලා හිතෙන තැනුත් නැතුව නෙමෙයි.

මොයිස්චරයිසර් ක්‍රීම් එකක් ගාන එකෙන් හමට හොඳක් මිසක නරකක් වෙන්නේ නෑ කියලා දන්නවා වුණත් මේකෙන් වෙන සන්තෘසිය ගැන ගොඩක් අයට දැනුමක් නැහැ. ඒ නිසාදෝ බහුතරයක් කඩෙන් ගන්න ක්‍රීම් එක ගාන්නේ දවසයි දෙකයි. හැමදම ගාන්න කම්මැලි. ඊටපස්සේ ඉතින් හාවා හඳ දකින්නා වගේ ඉඳලා හිටලා හිතුණු වෙලාවට විතරක් ක්‍රීම් ටිකක් උලනවා.

මොයිස්චරයිසර් එකකින් අපේ හමට මොකද වෙන්නේ කියලා දැනුවත් වෙන එක වටින්නේ ඒකයි. අපේ සමේ සීබම් කියලා ස්වභාවික තෙල් වර්ගයක් තියෙනවා. සමේ තෙතමනය ඇතිවෙන්නේ ඔය තෙල නිසයි. සීබම් ටික අනවශ්‍ය විදිහට අයින් වෙලා යනවා නම් අපේ සම වේළෙනවා. තෙතමනකාරකයක් ගෑවහම ආරක්ෂක පටලයකින් සම සීල් කරනවා. එතකොට අපේ සමේ තියෙන සීබම් නිස්සාරණේ නාස්ති වෙන්නේ නෑ. ඒ වගේම මොයිස්චරයිසර් එකෙනුත් සෙලවලට තෙතමනයක් ඇති කරනවා.

සමේ වැඩිපුර සීබම් හැදෙන කෙනෙක් ගැන හිතමුකෝ. ඒ කියන්නේ මූණේ තෙල වැඩි අය. සීබම් සමෙන් අයින් වෙන්න වෙන්න වැඩිපුර සීබම් නිෂ්පාදනය වෙන එක තමයි මේ අයගේ සමේ ස්වභාවය. මොයිස්චරයිසර් එකකින් සමේ තියෙන සීබම් ආරක්ෂා කරගන්න පුළුවන් නිසා අලුතෙන් සීබම් හැදෙන එක පාලනේ වෙනවා. තෙතමනය රැකෙනකොට අලුත් සෛල ඇතිවෙන එක ඉක්මන් වෙනවා. ඒ වගේම රැළි ඇතිවෙන එකත් පාලනේ වෙලා කැළැල් එහෙමත් මැකෙනවා.

හොඳ මොයිස්චරයිසර් එකක් තෝරගන්නේ කොහොමද කියන එකත් දැනගන්නම ඕනේ. කඩවලට ගියාම රාක්ක පුරෝලා වෙවාරණ වර්ගේ ක්‍රීම් ජාති තිබුණට ඔය හැම එකෙන්ම අපිට ඕන දේවල් වෙන්නේ නැහැ.

මොයිස්චරයිසර් වර්ග දෙකක් තියෙනවා. එකක් ජලය මත පදනම් වීවා (Water based moisturizer). අනෙක තෙල් මත පදනම් වීවා (Oil based moisturizer).

තෙල් සහිත සමක් තියෙන කෙනෙක් නම් ජල මූලද්‍රව්‍යවලින් හදපු මොයිස්චරයිසර් එකක් තෝරගන්න. සාමාන්‍ය සමක් තියෙන කෙනෙක්ටත් මේ වර්ගය ගාන්න පුළුවන්.

වියළි සමක් තියෙනවා නම් තෙල් මත පදනම් වෙන මොයිස්චරයිසර් එකක් ගැළපෙනවා. සාමාන්‍ය සමක් තියෙන කෙනෙක්ට මේකත් පාවිච්චි කරන්න පුළුවන්.

මොයිස්චරයිසර් එකක් ගනිද්දි ඒකේ ප්‍රමිතිය ගැන හිතන්න. හයලුරොනික් ඇසිඩ් (Hyluronic acid), ඩිමෙතිකොන් (Dimethicone), ග්ලිසරින් (Glycerin), ප්‍රොපිලීන් ග්ලයිකෝල් (Propylene Glycol) වගේ අමුද්‍රව්‍ය අඩංගු මොයිස්චරයිසර් එකක් තෝරගන්න පුළුවන් නම් වැඩිය හොඳයි. සමහර මොයිස්චරයිසර්වල UV ෆිල්ටර් ඒ කියන්නේ හිරුකිරණින් සම ආරක්ෂා කරන සංයෝග තියෙනවා. එහෙම එකක් ගන්න පුළුවන් නම් එක ගලෙන් කුරුල්ලෝ දෙන්නයි.

මොයිස්චරයිසර් ක්‍රීම් එකක් ගාන්න ඕනේ කොයි වෙලාවටද? ඒක තමයි කට්ටියට ඊගාවට තියෙන ප්‍රශ්නේ.

ශරීරය හේදුවට පස්සේ අනිවාර්යයෙන්ම මේවගෙන් ටිකක් ගාන්න ඕනේ. ඇයි දන්නවද? නානකොට, ඇඟ සෝදනකොට අපේ ඇඟේ තියෙන ස්වභාවික තෙල් අයින් වෙලා යනවා. උණුවතුරෙන් නානවා නම් මේක තවත් වැඩියි. වැඩිපුර වෙලාවක් නෑවට පස්සේ හම නිකන් වේලිච්ච ගතියක් දැනෙන්නේ ඒකයි.

ඊජිප්තු රැජින ක්ලියෝපැට්‍රා නෑවේ කිරිවලින්නුනේ. නාලා අහවර වුණාට පස්සේ ක්ලියෝපැට්‍රා මුළු ඇඟ පුරාම ඔලිව් තෙල් ගල්වනවලු. මූණේ ගාන්න රාජකීය පෙල් කියලා වෙනම මොයිස්චරයිසර් එකක් තිබුණලු. ඒක හදලා තියෙන්නේ මී පැණිවලින්ලු. ඉතින් නෑවට පස්සේ නැත්නම් ඇඟ සේදුවට පස්සේ ක්ලියෝපැට්‍රා වගේ මොයිස්චරයිසර් ගාන්න කියලයි අපේ බවලතියන්ටත් අපි කියන්නේ.

මූණ සේදුවට පස්සෙත් මොයිස්චරයිසර් ක්‍රීම් ටිකක් ගාන්න. මොකද සබන් නැත්නම් ෆේස් වොෂ්වල තියෙන සමහර සංයෝග නිසා අපේ සමේ තියෙන සීබම් ඉවත් වෙනවා.

වළං, භාජන, රෙදි සේදුවට පස්සෙත් අත්වලට මොයිස්චරයිසර් ගාන්න පුළුවන් නම් යසයි. මේ වැඩවලට පාවිච්චි කරන සැර සබන්වලින් අත්වලට වෙන හානිය අවම කරගන්න එතකොට පුළුවන්. ඉස්සර අපේ අත්තම්මලා වුණත් ඉඳුල් වළං සෝදලා අහවර වුණාට පස්සේ කෝමාරිකා කෑල්ලක් අතේ අතුල්ලගන්නවලු.

අනවශ්‍ය රෝම ඉවත් කරන්න සම රේසර්වලින් ශේව් කරන කෙනෙක් නම් ශේව් කළාට පස්සේ මොයිස්චරයිසර් ගාන්නම ඕනේ. රේසර් කරද්දි අපේ සමේ සීබම් ඉවත් වෙනවා. අනික අපේ දෑහැට නොපෙනුණාට රේසර් නිසා සම සියුම්වට තුවාල වෙනවා. ඉතින් මේ හානි වළක්වගන්නත් තෙතමනකාරකයකට පුළුවන්.

ඉරුවිළියට නිරාවරණය වෙන්න කලින් ඇඟේපතේ මොයිස්චරයිසර් ටිකක් ගාගෙන යන එක නුවණට හුරුයි. ඒ වගේම තමයි මේකප් එකක් කරන්න කලිනුත් මේ ක්‍රීම් ටිකක් ගාන්න. එතකොට රූපලාවණ්‍ය ආලේපනවලින් වෙන හානිය අවම කරගන්න ලේසියි. ඒ වගේම රාත්‍රියේ නින්දට යන්න කලිනුත් මොයිස්චරයිස් කරන්න අමතක කරන්න එපා.

මොයිස්චරයිසර් ගානවා කියලා මූණෙයි, අත් දෙකෙයි, කකුල් දෙකෙයි විතරක් ක්‍රීම් ගාලා පලක් නැහැ. රහස් ප්‍රදේශ ඇරුණුකොට මුහුණ, කන්, බෙල්ල, පපුවේ ඉඳලා යටිපතුල දක්වාම මොයිස්චරයිස් කරන්න.

හැමදේම වගේ මොයිස්චරයිසර් ක්‍රීම් එහෙමත් දැන් ගණන් උස්සලානේ. ඒ නිසා ගෙදරදිම මොයිස්චරයිසර් ක්‍රීම් ටිකක් හදාගන්න හැටිත් අපි බලමු.

හොඳම ස්වභාවික තෙතමනකාරකය තමයි කෝමාරිකා. ඉතින් ගෙදර කෝමාරිකා ගහක් දෙකක් පැළ කරගන්න එක තමයි හොඳම වැඩේ.

ග්ලිසරින් 10mlකට රෝස වතුර 5ml එක්ක කෝමාරිකා යුෂ ටිකක් එකතු කරලා හොඳට මිශ්‍ර කරන්න. මේ මිශ්‍රණය ශීතකරණයේ දාලා සතියක් තියාගන්න පුළුවන්.

රෝස වතුර ටිකකට දෙඩම් යුෂ ටිකක් මිශ්‍ර කරලා මොයිස්චරයිසර් එකක් විදියට පාවිච්චි කරන්න.

ජොජෝබා තෙල්වලට ග්ලිසරින් මිශ්‍ර කරලා භාවිතා කරන්න.

ෂියා බටර්වලට සුදු පොල්තෙල් එකතු කරලා හොඳට මිශ්‍ර කරලා පාවිච්චි කරන්න.

කොකෝවා බටර් ටිකකට විටමින් E කරලක් එකතු කරලා කල්තියාගෙන පාවිච්චි කරන්න.

කෝමාරිකා යුෂවලට ඕට්ස් පිටි මිශ්‍ර කරලා ගාන්න.

සහල් ටිකක් දවසක් පෙඟෙන්න තියලා ඒ වතුරට කෝමාරිකා යුෂ මිශ්‍ර කරලා ආලේප කරන්න.

මේ දේවල් ගෙදරදිම හදාගන්න පුළුවන් නම් තවත් මොයිස්චරයිසර් ක්‍රීම් ගන්න කඩේට ගාටන්න ඕනේ නැහැ. සමට ආදරේ කරන කෙනෙක් නම් මොයිස්චරයිසර්වලට ඇබ්බැහි වෙන්න කියලා තමයි අවසානෙට කියන්න තියෙන්නේ.

සමට ආදරේ කරන කෙනෙක් නම් අනිවාර්යයෙන්ම මොයිස්චරයිසර් එකකට ඇබ්බැහි වෙන්න



■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ඇයි මට මගේ වයිෆ්ට දෙවැනි අම්මා කියලා කියන්න බැරිද?

අචින්ත ඒ වෙලාවේ හිටියේ බැංකුවේ කළමනාකාරතුමා එක්ක සාකච්ඡා කරන ගමන්. ඒ, බැංකුවේම විදෙස් ශාඛාවකට අචින්තට ලැබුණු උසස්වීම ගැන. අචින්ත හිටියේ ගොඩක් සතුටින්. උසස් පෙළ කාලේ ඉඳන්ම ඔහු හීන මැව්වේත් පිටරටකට යන්න. තනියම නෙවෙයි, තමන්ගේ ආදරවන්තිය එක්ක. අනුන්ගේ පෞද්ගලික ජීවිතේ ගැන උනන්දු නොවෙන විදෙස් රටක ජීවිතේ අලුතින්ම පටන්ගන්න දෙන්නා කතාවෙලා හිටියා.

ඒත් ඒ සැලසුම මේ වෙද්දී වැරදීගෙන එන බව අචින්ත දැනගෙන හිටියේ නැහැ.

අචින්ත කළමනාකාරතුමා එක්ක කතා කරලා එළියට එද්දී හැමෝගෙම මුහුණු අමුතුවෙලා බව ඔහුට තේරුණා.

"මොකද බන්?" ඔහු ඇහුවේ සුපුරුදු කවටකමෙන්.

තාරුකීලා, මාලිකාලා අචින්තව නොදැක්කා වගේ අහක බලාගත්තා. අචින්ත හිටියේ සිද්ධ වෙන දේ මොකද්ද කියලා හිතාගන්න බැරිව.

"ආ බන්? උඹ අර හැමතිස්සෙම කියන උඹේ දෙවැනි අම්මා, දිස්නා ටීචර්. ඒකි උඹේ දෙවැනි අම්මා නම් මොකද මේ දෙන්නා බදගෙන?" කමල් අමුතු හිනාවක් මුහුණේ තියාගෙන ෆෝන් එක අචින්ත දිහාවට දිගු කළා.

"සිසුවා කෙළෙසූ නාකි ටීචර්." අන්න එහෙමයි මාතෘකාව තිබ්බේ. ඒ අචින්ත උසස් පෙළ කරලා ඉවර වුණු දවසේ ගත්තු ෆොටෝ එකක් බව අචින්තට මතක් වුණා.

"අනේ අචින්ත මගේ ෆෝන් එක නැති වෙලානේ." මීට ටික දවසකට කලින් දිස්නා ටීචර් තමන්ට එහෙම කියපු හැටි අචින්තට මතක් වුණා.

"අනේ අචින්ත ඔයා ගැන හිතන් හිටිය විදිය ගැන අපිටම ලැජ්ජයි." තාරුකී කිව්වා.

"තාරුකී, කටවහන් හිටපන් බන්. කොල්ලෝ එහෙම තමයි. අපිට දුක මූ අපිටත් ඒ ගැන හංගපු එක. අපිට කිව්වේ දිස්නා ටීචර් කියන්නේ දෙවැනි අම්මා කියලනේ. උඹට ඇත්තම කියන්න තිබ්බනේ. උසස් පෙළ කාලේ උඹේ සම්බන්ධයක් තිබ්බා කියලා ඒ ගැනි එක්ක. දික්කසාද ගැනියෙක්ලු නේද?" සුනන්ද ඇහුවේ හිනාවෙවී.

"උඹලට වැරදිලා. දිස්නා කියන්නේ මගේ දෙවැනි අම්මා තමයි. ඇයි මට මගේ වයිෆ්ට දෙවැනි අම්මා කියලා කියන්න තහනම්ද?" අචින්ත ඇහුවා.

"මොනවා. වයිෆ්. උඹ අපිටත් හොරෙන් බැන්දද?" කවුදෝ අහපු ප්‍රශ්නෙට උත්තර දෙන්න අචින්ත ප්‍රමාද වුණේ නැහැ. ඒ වෙනුවට ඔහු පිටතට ගිහින් දිස්නාට දුරකතන ඇමතුමක් ගත්තා.

දිස්නා හොඳටම බයවෙලා. අචින්තගේ තාත්තා දිස්නාගේ පාසල ගාවට ඇවිත් නරක වචන කියලා කෑගැහුවා කියලා දිස්නා කිව්වේ අඬමින්.

"ප්‍රින්සිපල්, අනිත් ටීචර්ස්ලා මම දිහා බැලුවේ අප්පිරියාවෙන් අචින්ත." දිස්නා කිව්වේ කඳුළු එක්ක.

"මොන දේ සිද්ධ වුණත් අපේ සැලසුමේ මුකුත්ම වරදින්න විදියක් නැහැ. ප්ලෑන් එකේ විදියටම ඔයා අද රෑට රට යන්න. ඔයාව මගේ යාළුවා එක්කගෙන යයි අපාර්ට්මන්ට් එකට. මම මෙහෙ වැඩ ඉවර කරලා සතියක් ඇතුළත එනවා." අචින්ත කිව්වා.

අචින්තගෙන් වුණේ මොකද්ද කියලා දැනගන්න හැමෝම හිටියේ නොඉවසිල්ලෙන්.

"කියන්න පුතා. ඔයා ඉස්කෝලේ යන කාලේ බලහත්කාරකමක් වුණාද? අපිට පුළුවන් එහෙනම් නීතිය ඉස්සරහට යන්න. මම සපෝර්ට් කරන්නම් පුතා." අචින්තගේ දක්ෂකම්වලට කවදත් ආදරය කළ කළමනාකාරතුමා කිව්වේ සංවේගයෙන්.

"අපෝ නැහැ සර්. ඒ මගේ ආදරේ." අචින්ත කියද්දී කළමනාකාරතුමාගේ මුහුණ වෙනස් වුණා.

අචින්ත වැඩ ඇරිලා ගෙදර යද්දී අචින්තගේ තාත්තා හිටියේ ආවේශ වෙලා.

"මොන ලැජ්ජාවක්ද මේ වුණේ? අපි කොහොමද ආයේ සමාජෙට මුහුණ දෙන්නේ." ඔහු හිටියේ කෑ ගසමින්.

"තාත්තට ඕවා හිතන්න තිබ්බේ ඒ කාලේ. ඒ කාලේදි ඔයාවත්, අම්මවත් මට ආදරේ කළාද? නැහැනේ. ලකුණු අඩුයි කියලා දෙස් කියපු එක, හේතුවක් නැතුව මට ගහපු එක ඇරෙන්න. අනිත් එක ඔයාලා දෙන්නා රණ්ඩු වෙවී හිටියා ඇරෙන්න මම කන්නේ බොන්නේ මොනාද කියලවත් හොයන්න ඔයාලට උවමනාවක් තිබ්බද? මම පොඩි ළමයෙක් විදියට මට ආදරේ ලැබුණු තැනට මම කිට්ටු වුණා." අචින්ත කිව්වේ ගාණක්වත් නැතුව.

"ඕකිව මම ම...රනවා." තාත්තා කෑ ගැහුවා.

"මම තව සතියකින් රට යනවනේ. එතකොට ඔය ඔක්කොම ඉවරයි. දිස්නා මිස්ට වද දෙන්න යන්න එපා." අචින්ත කිව්වා.

අචින්තගේ තාත්තා නිහඬ වුණේ ඒ කතාවට.

පුතා රට ගියාට පස්සේ, ලංකාවේ තනිවෙන දිස්නා ගැන බලාගන්නම් කියලා ඔහු හිතාගත්තා.

අචින්ත රට ගිහින් සමාජ මාධ්‍යවල දිස්නා එක්ක සතුටින් තුරුලු වෙලා ඉන්න ෆොටෝ එකක් දැම්මා.

"මම මගේ අයගේ ආදරේ නැතිව ගොඩක් දුක් විඳපු කාලෙක, ආදරේ දැනෙන තැනක නතර වුණා. එදා මට දුක් දීපු මිනිස්සුන්ගෙන්, එදා මම විඳපු දුක් දිහා අනුකම්පාවෙන් නොබලපු මිනිස්සුන්ගෙන්, මම හොයාගත්තු ආදරේ ඇද හොයන මිනිස්සුන්ගෙන් දුරස් වෙලා මේ ආදරේ විඳින්න ලැබුණු එක මගේ පෙර පිනක්." අචින්ත ඒ විදියට ලියලා තිබුණා.

■ සමාධි ඛයස්

හොරණ පුරවරයේ ඔබට අත්‍යාවශ්‍යම වූ අඩුව සපුරාලමින්

අමරසිංහ වෙද මැදුර

පාරම්පරික ආයුර්වේද රෝහල

කොතරම් ප්‍රතිකාර කළත් සුවයක් නැද්ද?

අංශභාග

ආතරයිටිස්
තුනටිය අමාරු
හන්දි වේදනා

ස්ථිරවම සුවකරගන්න...

නේවාසික හා බාහිර රෝගී සත්කාර සමඟින් ඉතාමත් කාරුණික උපස්ථාන සේවය

රජයේ පිලිගත් පාරම්පරික විශේෂ පළපුරුදු වෛද්‍යවරුන් හා චැනලින් සේවා

අමරසිංහ වෙද මැදුර
පාදුක්ක පාර, හොරණ
034 314 5600 | 074 184 4841 074 184 4841
Amarasinghe Weda Medura amarasinghewedamedura.lk

ඉංග්‍රීසි කතාකරලම පුරුදු වෙන්න.
රැකියා, විදේශගතවීම්,
උසස්වීම් සඳහා අංග සම්පූර්ණ

ඉංග්‍රීසි දැනුම

වර්තමාන ජීවන රටාව තුළ ඉංග්‍රීසි වතුර සහ ප්‍රියමනාප ලෙස කතාකිරීමට හැකිනම් අත්පත් කරගත හැකි වාසි සහ ජයග්‍රහණ සුලභ වටපිටාවක් සකස් වී තිබේ.

ගම්පහ නගරයට නුදුරු බෙම්මුල්ල, කඳඹිඵවාට සණස ශාලාව නවීන පහසුකම් වලින් සමන්විතයි.

උසස් ජීවන තත්ත්වයක් සඳහා අත්‍යාවශ්‍ය ඉංග්‍රීසි භාෂා හැකියාව සුවපහසු සරල ප්‍රතිඵලදායක ක්‍රම මඟින් ඔබ වෙත තිළිණ කර දීම අපගේ විශිෂ්ඨ හැකියාව පළපුරුද්ද හා සුදුසුකම් සහිත ගුරු මණ්ඩලයේ අවංක ප්‍රාර්ථනයයි.

(ගම්පහ කළමනාකරණ හා උසස් වෘත්තීය පුහුණු අභ්‍යාස ආයතනයේ හිටපු ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි භාෂා උපදේශක)
ප්‍රියංකර ගමගේ (077 110 1563)

නාග පිල්ලුවක් මගේ මහත්තයාගෙ පස්සෙන් එනවා

නාගයකුගේ හැවක් රාත්‍රී යාම තුනේ තුන්වර බැගින් දින හතක් එකදිගට ජීවම්කොට විනාශ කළ යුතු පුද්ගලයාගේ නමට ‘දපනේ’ දැම්මවූ පසු ඒ නාග පිල්ලුව එවෙලේම ඒ අදාළ පුද්ගලයා සොයාගොස් ඔහුට දෂ්ඨකොට ආපසු එනු ඇත

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

“නාග පිල්ලුව කියන්නේ මොකක්ද?”

එක්තරා විද්‍යුත් නාළිකාවක

නිවේදිකාවක් පසුගිය දිනයෙක දුරකතන ඇමතුමක් දී මගෙන් ඇසුවාය.

“පිල්ලුව, පිල්ලිය කියන්නේ මැරුණු කෙනෙක් හරි සතෙක් හරි අද්භූත බලයකින් නැවත පණ ගන්වලා හතුරන් විනාශ කරන්න යවන එකට. මෙහෙම යවන්න පුළුවන් කියන විශ්වාසය ලෝකය පුරාම තියෙනවා. මේ පිල්ලිය, පිල්ලුව කියන එකට ඉංග්‍රීසියන් කියන්නේ Zombie කියලා. ඒ කියන්නේ නාග පිල්ලුව කියන්නේ මැරුණු නයෙකුට පණ උපද්දවලා හතුරන් විනාශ කරන්න යවන එකට.” මම පිළිතුරු දුන්නෙමි.

“ඉතින් එහෙම ඇත්තටම යවන්න පුළුවන්ද?” ඒ සැනින් ඇය යළි ඇසුවාය.

“එහෙම යන්න පුළුවන් නම් ඉතින් රටකට ත්‍රිවිධ හමුදාවක් ඕනෙ නැහැ. තමන්ගේ හතුරන් ඉස්සරහට ඔය වගේ පිල්ලි ටිකක් ජීවම් කරලා යවලා යුද්ධයක් වුණත් දිනන්න පුළුවන්නේ.” මම යළි සිනාසෙමින් කීවෙමි.

“ඒකම තමයි මාත් කියන්නේ. ඒත් මගේ හොඳම යාළුවෙකුගේ හස්බන්ඩ්ගේ පිටිපස්සෙන් මෑතක ඉඳලා නාග පිල්ලුවක් ලූහු බඳිනවා කියලා එයා පුදුම බයකින්ලු ඉන්නේ. රෑට ගෙදරින් අඩියක් එළියට තියන්නේ නැතිලු. ඒ මදිවට හීනෙන් බයවෙලා කෑගහනවලු.” අනතුරුව එම නිවේදිකාව කීවාය.

“එහෙමනම් ඉතින් සේරටම කලින් එයාව මනෝ වෛද්‍යවරයෙකුට පෙන්නන එක තමයි කරන්න තියෙන්නේ. මොකද ඕක සමහර මානසික රෝගවලට පොදු මනෝ භ්‍රාන්ති තත්ත්වයක් වෙන්න පුළුවන්.” මම කීවෙමි.

“ඒත් ඒක එහෙමම කියන්නත් බෑ. මොකද මෙයා ඔය තත්ත්වෙට පත්වෙලා තියෙන්නේ එක මනුස්සයෙකුට කියලා කරවාගන්න ගිය ගුරුකමක් වැරදිලා.” එම නිවේදිකාව එසේ පවසත්ම ඒ සම්බන්ධයෙන් මා තුළ වූ කුතුහලය ලියලා වැඩෙන අයුරක් වැටහිණ.

“මට එයත් එක්ක පොඩ්ඩක් කතා කරන්න බැරිවේවිද? එහෙම වුණොත් කාරණේ හරියටම දැනගන්න පුළුවන් වේවි.” ඒ අනුව මම කීවෙමි.

“වැඩේ කියන්නේ යාළුවගේ හස්බන්ඩ් ඔය ගැන කිසිම කෙනෙක් එක්ක කතා කරන්න කැමති නැති එකනේ. එහෙමනම් මම මගේ යාළුවට කියන්නද තිලක් මහත්තයට කෝල් එකක් දෙන්න කියලා?” ඉන් අනතුරුව එම නිවේදිකාව ඇසුවාය.

“එහෙමනම් කතා කරන්න කියන්න. හැබැයි ඒ කතාවේ සමහර කොටස් වසන් කරලා කතාව වෙන වෙන පැතිවලට හරවලා කිව්වොත් එයා ඒ කතාව කියන එකෙන්වත් මම ඒ කතාව අහන එකෙන්වත් කිසිම ප්‍රයෝජනක් ලැබෙන එකක් නෑ කියන එකත් කියන්න.” මම ඇයට අවධාරණයකොට කීවෙමි.

ඒ අනුව ඇය හෙළිකළ සැමියා පසුපස ලූහුබඳින ‘නාග පිල්ලුව’ පිළිබඳ කතා ප්‍රවෘත්තියයි මේ.

මා වෙත දුරකතන ඇමතුම දුන් කාන්තාවගේ සැමියා ඉතා සුළුවෙන් ඇරඹූ ව්‍යාපාරය මේ දිනවල මහා පරිමාණ ව්‍යාපාරයක් තෙක් ප්‍රවර්ධනය කොටගත් දක්ෂයෙකි. මේ වනවිට හතළිස් නවවන වියේ පසුවන ඔහු කලින් එක් ධනවත් ව්‍යාපාරිකයකු යටතේ සේවයකොට ඇත. පසුව ඔහු යටතේ වැටුපට සේවය කිරීමෙන් තම ජීවිතයට අභිවෘද්ධියක් සිදුනොවන බව වටහාගත් ඔහු පසුකලෙක තම ව්‍යාපාර තනිව පවත්වාගෙන ගොස් තිබේ. ඒ අතරේ ව්‍යාපාරික පසුබෑමකට ලක්ව සිටි ධනවත් ව්‍යාපාරිකයා හදිසියේ මියයන ලදුව එම ව්‍යාපාරය ඔහුගේ වැඩිමල් පුතු විසින් අත්කරගෙන තිබේ. ඒ සමඟම ඔහු හා මෙම කාන්තාවගේ සැමියා අතර පැවති ව්‍යාපාරික තරඟය පසුව ඔවුනොවුන් අතරේ පවතින කෝන්තරයක් බවට පත්ව ඇත.

“අන්තිමට ඒ මනුස්සයා පාතාලයෝ දම්මලා මගේ මහත්තයාව මරවන තැනටම ආවා. අන්තිමේ බැරිම තැන තමයි මගේ මහත්තයා මේ වගේ දේකට පෙළඹුණේ. වෙන මොකකටවත් නෙවෙයි තමන්ගේ ජීවිතේ රැකගන්න.” මගේ හිතවත් නිවේදිකාවගේ යෙහෙළිය කීවාය.

සතුරන් මුළුමනින් විනාශකොට දැමිය හැකි මෙම ‘නාග පිල්ලුව’ නම් ගුරුකම පිළිබඳව ඔහු මුල්වරට දැනගෙන තිබුණේ අන්තර්ජාලයෙනි. එම මන්ත්‍රකරු කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඒ ඔහු එම සැමියාට හෙළිකොට ඇති අන්දමට ඉතා දුෂ්කර වෑයමකින් යුතුව නාගයකුගේ හැවක් රාත්‍රී යාම තුනේ තුන්වර බැගින් දින හතක් එකදිගට ජීවම්කොට විනාශ කළ යුතු පුද්ගලයාගේ නමට ‘දපනේ’ දැම්මවූ පසු ඒ නාග පිල්ලුව එවෙලේම ඒ අදාළ පුද්ගලයා සොයාගොස් ඔහුට දෂ්ඨකොට ආපසු එනු ඇත. වරු තුනේ සිට දින හතක් තුළ සිදුකෙරෙන මෙම කාර්යේදී ඒ පුද්ගලයා ඒකාන්ත වශයෙන් මියයනු ඇත. ඒ මරණ පරීක්ෂණයකදී පවා මරණයට හේතුව සොයාගත නොහැකි අන්දමකිනි. පසුව ඒ නාග පිල්ලුව යළි මන්ත්‍රකරු සොයා පැමිණෙන විට එය දමනය කොට එහි බලය නිශේධ කිරීමේ වගකීමද ඒ මන්ත්‍රකරු වෙත පැවරෙනු ඇත.

“කොහොමහරි ඒ ගුරුකමට යන දිවිමකුළු ලේ, ඇටිකුකුල් ඇස්, උණහපුළු කඳුළු වගේ දේවල් වගේම නයි හැවක් සොයාගන්න කියලා රුපියල් ලක්ෂයකුත් වැඩේට අත්තිකාරමක් හැටියට තව ලක්ෂ දෙකකුත් ඒ මනුස්සයා මහත්තයාගෙන් ඉල්ලාගෙන තියෙනවා. පස්සේ දවසක මහත්තයා ඒ මනුස්සයාගේ ගෙදර යනකොට ඉස්සරහා කාමරේ ඔය ගුරුකම කරන්න ලෑස්ති වෙලත් තියෙනවා. කොහොමහරි වැඩේ ඉවර වුණාම තව ලක්ෂ තුනක් ගෙවන්නත් ඒ මනුස්සයා අපේ මහත්තයාව පොරොන්දු කරගෙන.” එම කාන්තාව කීවාය.

එහෙත්, එහි අපූරුම සිද්ධිය එය නොවේ. දින හතක් තුළ සිදුකළ එම ගුරුකමින් පසු අදාළ ව්‍යාපාරිකයා වෙත යොමුකළ නාග පිල්ලුව වෙතින් ඊළඟ දින හත තුළ තමන්ට නියමිත ‘රාජකාරිය’ හරිහැටි ඉටු නොවීමය. කොටින්ම එම සැමියා පවසා ඇති අන්දමට එම නාග පිල්ලුව යැවීමෙන් තම සතුරාගේ සිරුරේ රෝම කූපයකටවත් හානියක් සිදුවී නැත.

“පස්සේ මහත්තයා මේ ගැන අහන්න අර මන්ත්‍රකාරයා හම්බුවුණාම තමයි කියලා තියෙන්නේ, ‘ඒක තමයි මාත් මේ දෙලෝ රත්වෙලා ඉන්නේ, ඒ නාග පිල්ලුව කොහේ ගියාද කියලා මටවත් හිතාගන්න බෑ. ඒත් සමහරවිට ඒ පිල්ලුව ආපහු හැරිලා අපි දෙන්නා පස්සේ වුණත් ලූහු බඳින්න බැරි නෑ’ කියලා. කොහොමහරි ඊටපස්සේ අපේ මහත්තයා ඒ නාග පිල්ලුවෙන් බේරෙන්න තව ලක්ෂ පහ හයක් ඒ මන්තරකාරයාට දීලා තියෙනවා. ඒත් මහත්තයාගේ හිතේ අර නාග පිල්ලුව ගැන තියෙන බය දවසින් දවසම වැඩිවෙනවා. ඒත් කොහොමද අපි මේ කතාව කාටහරි කියන්නෙවත්?” එම ව්‍යාපාරික බිරිඳ කීවාය. ඇය හෙළිකළ තොරතුරු අනුව මෙම නාග පිල්ලුවේ කතාව මුළුමනින්ම මිථ්‍යාවකි. එහෙත් ඒ ඔස්සේ ඇගේ සැමියා බරපතළ ලෙස මංකොල්ලකමින් ඔහු මානසික රෝගියෙකුගේ තත්ත්වයට ඇද දැමූ ‘මන්ත්‍රකරුගේ පිල්ලුව’ නම් අතිවිශාල සමාජමය උවදුරක් සිදුකරන බව ඒකාන්ත වශයෙන්ම කිව යුතුය. එබැවින් එවැනි ‘පිල්ලු’ දුරුකිරීමට හැකි සෑම උත්සාහයක්ම දැරීම අප කාගේත් පොදු සමාජ වගකීමකි.

පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අඟය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.

යක්කුන්ට දොළ පිදේනි දුන්නත් එකයි පවුල් ප්‍රශ්න පිටට දුන්නත් එකයි

ටිකක් කරදරයක් වෙච්ච වෙලාවට අපේ යාළුවෙක්, සහෝදරයෙක්, සහෝදරියක් අපි වෙනුවෙන් පෙනීහිටිනවාට අපි හැමෝම කැමතියි. විශේෂයෙන්ම අපි අසරණ වෙලා ඉන්න වෙලාවක, ජීවිතේ අමාරුම අවස්ථාවක අපි වෙනුවෙන් පෙනී හිටින්න කවුරුහරි ඉන්දැද්දී හිතට දැනෙන ශක්තිය කොහොමද කියලා අමුතුවෙන් කියන්න අවශ්‍ය නෑනේ. විවාහ ජීවිතේ ගෙවද්දී හෝ අදර සම්බන්ධයක් ඇතුළේ වුණත් එකිනෙකා වෙනුවෙන් පෙනීහිටීම අනිත් කෙනාට මොනතරම් මානසික සුවයක්ද කියන එක ඒ අත්දැකීම ලැබූ අය දන්නවා. හරියට අර නන්ද මාලනී මහත්මිය ගයනා කරන ගීතයේ තියෙනවා වගේ. 'ලොවම එපා වී ලොවම කළකිරී තැවී දැවී හිඳිනා වේලේ... ඔබේ දයාබර එකම වදනකින් මගේ ආත්මය සුවපත් වේ...' ඒක හරියට ඒ වගේ හැඟීමක්. වාසනාවකට වගේ මගේ මහත්තයා දහම්ගේ මං ප්‍රිය කරන එක ආදරණීය ගුණාංගයක් විදියට ඒ සුවය මට අඩුවක් නැතුවම ලැබෙනවා. අද ලිපියත් එහෙම සිදුවීමක් මූලික කරගත්තු එකක් ගැනයි.

'ධරණී' පුවත්පතට මගේ අත්දැකීම් ලියනවා වගේම සමාජ මාධ්‍යයේත් මම මගේ අත්දැකීම් ලියනවා. එහෙම ලියන්නේ තවත් කෙනෙකුට ඒවායින් මොනවහරි දෙයක් ජීවිතේට එකතු කරගන්න උදව්වක් වෙයි කියන බලාපොරොත්තුවෙන්. ඒ වගේම ගොඩක් අය ඒ දේවල් බොහොම ආදරෙන් වැළඳගන්නවා. ඒ නිසාම හොඳ ප්‍රතිචාරත් ලැබෙනවා. හැබැයි සමහර සීමිත පිරිසක් මම ලියන දේවල් විවේචනය කරනවා. ඒක ඒ අයගේ කැමැත්ත නිසා මට ඒ විවේචන දරාගන්න සිද්ධවෙනවා වගේම දරාගන්නත් පුළුවන්. එවැනි අවස්ථා කිහිපයකම මං අමතක කරලා දැපු මගේ අතීත සිදුවීම් කිහිපයක් නැවත මතක් කරමින් මාව වට්ටන්න උත්සාහ කරපු අයත් හිටියා.

ඉතින් ඒ හැම අවස්ථාවකම මම දහම්ව ඒ දේවල් ගැන දැනුවත් කරන්නත් අමතක කළේ නැහැ. එහෙම එක අවස්ථාවක දහම් මගේ අතින් අල්ලාගෙන මෙහෙම දෙයක් කිව්වා "මායි ඔයයි අමතක කරපු දේවල් ඔලුවේ තියාගෙන ඒවා මතුකරන්න උත්සාහ කරන්නේ ඊට වඩා කුණු තමන්ගේ ජීවිතවල තියාගෙන ඉන්න අයයි රෝසී. ඔයා හිනාවෙලා සතුටෙන් ඉන්න, මං ඔයාට ඉන්නවා."

මගේ මහත්තයා මගේ ඇස් දිහා බලාගෙන ඔහොම කියද්දී පුදුම ශක්තියක් මගේ හිතට ආවා. මගේ ජීවිතේ බෙදගන්න මං තෝරාගත්තු කෙනා ගැන සැනසීම පිරුණ හැඟීමක් හිතට දැනුණා. එයාට ඕනනම් මගෙන් පෙරළා ප්‍රශ්න කරන්න පුළුවන්කම තිබුණා. එක්කෝ එයාට කියන්න පුළුවන් සමාජ මාධ්‍යවල ලියන්න ගියානම් ඔයාට එන විවේචන ඔයාම බාරගන්න, ඒවා මට අදාළ නෑ කියලා. එහෙම නැත්නම් කියන්න තිබුණා අතීතයේ ඔයාගේ අතින් එහෙම වැරදි වුණු නිසානේ ඔයාට ඇඟිල්ල දික් වෙන්නේ, ඒවාට මට කරන්න දෙයක් නෑ කියලා. හැබැයි ඒ කිසිම වෙලාවක ඔයාගේ ප්‍රශ්න ඔයා විසඳගන්න කියලා මාව තනි නොකර එයා මං වෙනුවෙන් පෙනී හිටියා. මගේම අය ගාවදී මං තනිවුණ වෙලාවට මගේ යෝධ හෙවණැල්ල වගේ එයා මං ගාව හිටියා. මගෙන් වැරැද්දක් වුණත් තමන්ගේ එකකුස උපන් සහෝදරයන් දෙන්නාටවත් ඒ ගැන නොකියා, මාව එයාලා ඉස්සරහා හෑල්ලු නොකර හිටියා. ගොඩක් වෙලාවට දහම් මං වෙනුවෙන් පෙනීහිටියේ මං නැති තැන්වල. කාගෙන්වත් කිසිම දෙයක් අහන්නවත් කියන්නවත් එයා ඉඩ තියලා නෑ. ඉතින් තමන්ගේ සහකරුගෙන් සහකාරියගෙන් ලැබෙන්න ඕන එහෙම සැනසීමක් නෙවෙයිද?

මට මගේ මහත්තයාගෙන් ලැබෙන මේ සහයෝගයම ඇති මගේ හිතේ සැනසීම දවස පුරා තියාගෙන ඉන්න. මගේ පවුල් ජීවිතේ බිඳිලා යන්න තිබුණ තැනදි පවා රැකිලා තියෙන්න හේතුවෙන්න ඇත්තෙත් දහම්ගේ මේ ගුණාංගය කියලා මට හිතුණ අවස්ථා ගොඩාක් තිබුණා.

ගොඩාක් පවුල් ජීවිත ඇතුළේ ප්‍රශ්න රණ්ඩු සරුවල් තියෙනවා. නොතිබුණොත් ඒක පුදුමයක්. ඒ මොන දේ තිබුණත් පිටතැනකදි සැමියා හෝ බිරිඳ අසීරුතාවයකට පත්වෙද්දි, තමන්ගේ බිරිඳ හෝ සැමියා වෙනුවෙන් පෙනීහිටින එකම ඒ පවුලේ බැඳීම සුරක්ෂිත වෙන්න ප්‍රමාණවත් කියලයි මට හිතෙන්නේ.

බාහිර සමාජයට දැනෙන්න ගත්තම 'ගෑනිට මිනිහා නෑ මිනිහාට ගෑනි නෑ' කියන දේ, ඒවාගෙන් ප්‍රයෝජන ගන්න බලාගෙන ඉන්න මිනිස්සුන්ට හොඳ අවස්ථාවක් ලැබෙනවා. ඒ වගේ හිස්තැන් තිබුණාමයි යක්කු යකින්නියෝ පවුල ඇතුළට රිංගගෙන පැලපදියම් වෙන්නේ.

පිරිසක් එක්ක ඉන්න තැන සැමියා ගැන, බිරිඳ ගැන වැරදි කීම, නොසැලකිලිමත්කම් ගැන, මගහැරීම් ගැන කියද්දි වෙන්නේ අනිත් මිනිස්සුට ඒවාගෙන් අපේ ජීවිත විනිශ්චය කරන්න හේතු දෙන එක. අහන් ඉන්න අය ඒවා තැන් තැන්වල කියවන එක. වයිෆ්ට හස්බන්ඩ් ගැන වගේ වගක් නෑ, හස්බන්ට වයිෆ් ගැන ගාණක් නෑ කියලා මිනිස්සුන්ට දැනෙන්න හේතු අපෙන්ම දෙන එක. ප්‍රශ්න විසඳගන්න ඕනේ පවුල ඇතුළෙදි. හැබැයි ආදරේ බෙදන්න ඕනේ පවුලෙන් පිටටත් දැනෙන විදියට. අලුතෙන් කසාද බඳින්න ඉන්න හෝ බැඳපු පෝඩුවක් ඉස්සරහා අපිත් මේ වගේ ආදරෙන් ඉමු කියලා හිතෙන විදියට ජීවත්වෙන්න. මං කියන්නේ රඟපාන්න නෙවෙයි අවංකව ජීවත්වෙන්න. ආදරෙන් ජීවත්වෙන්න.

මං තදින්ම විශ්වාස කරනවා පවුල් ජීවිතේ ඇතුළේ නොගැලපීම් ගලපාගෙන ජීවිත ඉස්සරහට අරන් යන්න සැමියා බිරිඳ වෙනුවෙනුත්, බිරිඳ සැමියා වෙනුවෙනුත් පෙනීහිටීම ගොඩක් වටිනවා කියලා.

මේ ලෝකේ කිසිම පවුලක් සර්වසම්පූර්ණ නෑ. අනවබෝධයන්, වැරදි වැටහීම් තියෙනවා. ඒ නිසා ප්‍රශ්න ඇතිවෙනවා. නමුත් ඒ හැම අවස්ථාවකම තමන්ගේ කෙනා වෙනුවෙන් පෙනී හිටින්න. එහෙම පෙනී හිටින බව ලෝකයට දැනෙන්න දෙන්න. එතකොට ඇතිවෙලා තියෙන ප්‍රශ්න විසඳෙයි වගේම අලුතින් ප්‍රශ්න ඇතිවෙන එකත් සෑහෙන දුරට අඩුවේවි.

■ **හෂිණී මනමේන්ද්‍ර**

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක සජීවී සංගීතය සමඟින්
එකක මිල රු.455/=
ප්‍රයිඩ් රයිස් සළුදා
රයිස් ඇන්ඩ් කරී අඟහරුවාදා
කහ බත් බදාදා
රයිස් ඇන්ඩ් කරී බ්‍රහස්පතින්දා
බිරියානි සිකුරාදා
AA CEYLON Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත,කොළඹ 03.
විමසීම්: 077 - 4369013 (ක්‍රිෂෝන්)

පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා හෝ ප්‍රාථමික
අධ්‍යාපන ගුරු පුහුණු පාඨමාලාව
සඳහා බඳවා ගැනීම
වයස අවු: 16 වැඩි අ.පො.ස. සා.පෙළ සමත් හෝ මෙවර උසස් පෙළ පෙනී සිටි තරුණ, තරුණියන්ට අයදුම් කළ හැක.
පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු, පෙර පාසල් හා ප්‍රාථමික පාසල් සඳහා රැකියා ලබා දීමට කටයුතු පිළියෙල කර දෙනු ලැබේ.
(දෙස් විදෙස් පිළිගත් ඩිප්ලෝමා සහතිකයක් ද පිරිනැමේ.)
විස්තර හා අයදුම්පත ලබා ගැනීම සඳහා
පහත Whatsapp අංකයට ඔබගේ නම සහ ලිපිනය එවන්න.
Whatsapp: 071 3510169
දුරකථන 0115 768894 / 071 3510169
077 4736239 / 071 2508179
කර්මාන්ත හා වෘත්තිය පුහුණු මූලස්ථානය, පුෂ්පාරාම පාර, පහළ බියන්විල, තැ.පෙ. 02 කඩවත.
කොළඹ නුවර පාරේ 09 වෙනි සැතපුම් කණුව අසලින් (සෙලින්කෝ සසෙක්ස් කොලෙජ් අසල ඇති පාර)

ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ හයේ පාරවල් පිටිපස්සේ බිරින්දෑවරුන්ගේ කැපකිරීමත් තියනවා

ඩිල්ෂාන් මුණවීරගේ බිරිඳ සංජී මුණවීර

අනූව දශකයේ මැදභාගය වනවිට ලෝකයේ හොඳම ආරම්භක පිතිකරු යුගලය සිටියේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේය. ඒ සනත් ජයසූරිය සහ රොමේෂ් කළුවිතාරණයි. පසුව ජයසූරියට උපුල් තරංග එක්විය. ඔහුද හොඳම ආරම්භක පිතිකරු යුගලයේ වාර්තාව වෙනත් රටකට දෙන්නට කිසිදු අවස්ථාවක සූදානම් වූයේ නැත. ජයසූරිය ක්‍රිකට් පිටියට සමුදීමත් සමඟ එතැනට එන්නට බොහෝ ක්‍රීඩකයින් තරඟ කළද ඒ අවස්ථාව ලැබුණේ ටී.එම්. ඩිල්ශාන්ටය. ඔහුගේ වේගවත් පිතිහරඹ විලාසය උඩ ඔහුද ඊට නියම සුදුස්සෙකු බව ඔප්පු කළේය. එහෙත් එකම කාලවකවානුවක ඔවුන් දෙදෙනාම ක්‍රිකට් පිටියෙන් නික්මයාමත් සමඟ එතෙක් ලෝකයේ හොඳම ආරම්භක පිතිකරු යුගලය සිටි ශ්‍රී ලංකා කණ්ඩායම මහත් අර්බුදයකට මුහුණ දුන්නේය. ඒ වනවිට කුසල් ජනිත් පෙරේරා එක් පසෙකින් ආරම්භක පිතිකරු භූමිකාවට සුදුස්සෙක් වී සිටියද අනෙක් පසට නිත්‍ය ආරම්භක පිතිකරුවෙකු සොයාගැනීමට නොහැකි විය. එතැනට එන්නට නියම සුදුස්සෙක් මතුව සිටියද මොකක්දෝ අවාසනාවක් නිසා ඔහුට ඒ අවස්ථාව නොලැබී ගියේය. ඔහුව යොදාගත්තේ තරඟ කීපයකට පමණි. එහෙත් විදෙස් රටවලින් නම් ඔහුට දැඩි ඉල්ලුමක් නිර්මාණය වී තිබිණි. අදටත් එහි වෙනසක් නැත. ඔහු වෙන කවුරුත් නොව ප්‍රහාරාත්මක පිතිකරු ඩිල්ෂාන් මුණවීර ය. ඉතින් ඩිල්ෂාන් ගැන මේ කතාබහ ඔහුගේ ආදරණීය බිරිඳ සංජී මුණවීර සමඟිනි.

ඩිල්ෂාන් මුණවීරගේ බිරිඳ නිසා සංජී හරි ආඩම්බරෙන් ඇති නේද?

එහෙම නෑ කිව්වොත් බොරුවක්. ඇත්තටම ඩිල්ෂාන්ගේ බිරිඳ වෙන්න ලැබුණු එක ගැන මට ආඩම්බරයක් තියෙනවා. මොකද එයා රටක් ලෝකයක් ආදරේ කරන ක්‍රීඩකයෙක්. මං එයාගේ බිරිඳ වීම නිසා ඒ ආදරේ මටත් වෙනසක් නැතුව ලැබෙනවා. මං හිතන්නේ ඩිල්ෂාන් මගෙන් යාළුවෙන්න අහද්දි මං එයාට කැමතිවුණු එක තමයි මං ජීවිතේ ගත්ත හොඳම තීරණය. එදා ගත්ත තීරණය ගැන මට අදත් සතුටුයි.

ඔයා එයාට කැමතිවුණේ එයා ක්‍රිකට් ක්‍රීඩකයෙක් නිසාද?

අනේ නෑ. එයා ජාතික කණ්ඩායමට එන්නත් කලින් ඉඳන් අපි ආදරේ කළා. ඒ වෙනකොට ඩිල්ෂාන් ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරයි කියලා මං කීයටවත් හිතුවේ නෑ. හැබැයි අපි ආදරේ කරන කාලෙදිම එයා ජාතික කණ්ඩායමට තේරුණා.

සංජීට ඩිල්ෂාන්ව මුණගැහුනේ කොහොමද?

මම උසස් පෙළ කරලා ඉවරවෙලා උසස් අධ්‍යාපන ආයතනයකට ගියා. ඩිල්ෂානුත් ඒකට ආවා. ඒ අතරේ තමා අපිට අපිව මුණගැහුනේ. මුලින්ම දැන අඳුනගෙන අපි යාළුවෝ වුණා. අන්තිමේ ඒ යාළුකම ආදරේකට හැරුණා.

ඩිල්ෂාන් ඔයාව කැමති කරගත්තේ එයාම හඳුගත්ත ලොකු ප්ලෑන් එකකට අනුව කියන්නේ ඇත්තද?

(සිනාසෙමින්) කවුද ඒක කිව්වේ? ඇත්තටම මටත් එහෙම හිතෙනවා. මං ඒ කාලේ ඉගෙනීම් කටයුතුවලට මූලිකත්වය දුන්න කෙනෙක්. ඉතින් ආදරේ වගේ දේවල් පස්සේ ගියේම නෑ. ඒත් ඩිල්ෂාන්ගේ ප්ලෑන් එක ඉස්සරහා මට එයාට කැමති නොවී බැරිවුණා.

අපිත් ආසයි ඩිල්ෂාන් ඔයාව දැලේ දගන්න ගහපු ඒ ආදරණීය ප්ලෑන් එක ගැන දැනගන්න?

අපි යාළුවෝ විදියට ඉන්නකොට මුලින්ම එයා මාව හොඳටම කියෙව්වා කිව්වොත් හරි. ඉතින් එයාට තේරුණා එකපාරට කැමැත්ත ඇහුවොත් පොතපත එක්කම හිටපු මං එයාට බෑ කියනවා කියලා. ඒ නිසා එයා කළේ යාළුවෙක් විදියට මගේ ළඟින් ඉඳගෙන ආදරවන්තයෙක් විදියට මගේ ගැන හොයලා බලපු එක. ඒ හින්දම ටික කාලයක් යද්දි මට එයාව දැනෙන්න ගත්තා. එහෙම දැනෙන්න ගත්තට පස්සේ තමයි එයා මගෙන් කැමැත්ත ඇහුවේ. ඉතින් මට අකමැති වෙන්න හේතුවක් තිබුණේ නෑ. ඩිල්ෂාන් හරිම හොඳ ගතිගුණ තිබුණු සරලව හිටපු කෙනෙක්. ඉතින් මං එයාට කැමති වුණා.

මුලින් කියපු විදියට එයා ජාතික කණ්ඩායමට තේරෙන්නේ දෙන්නා ආදරේ කරන කාලෙමයි නේද?

ඔව් 2012 අවුරුද්දේ තමයි ඩිල්ෂාන් ජාතික කණ්ඩායමට තේරුණේ. එදා එයා පුදුම විදියට සතුටු වුණා. මගේ ජීවිතේ මට අමතකම නැති දවසත් එදා තමයි.

අපි දන්නවා ක්‍රිකට් ක්‍රීඩකයින්ට තරුණියන්ගේ ආකර්ෂණය දැඩි ලෙස තියෙනවා. ඉතින් ඔයාගේ ආදරවන්තයා ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරනකොට ඔය හිත ගැස්සුනේ නැද්ද?

ඒ වෙනකොට අපි අපිව හොඳටම තේරුම් අරන් හිටියේ. එයා හැමදේම මට කිව්වා. මමත් එහෙමයි. ඉතින් හිත ගැස්සෙන තැනට එයා වැඩ කළේ නෑ. වෙන ගෑනු ළමයෙක් එහෙම ඒ අත්දැකීමට මුහුණදුන්න නම් කොල්ලට ගොඩාක් කොන්දේසි දෑයි. ඒත් ඩිල්ෂාන් ගැන මට තිබුණු විශ්වාසයට මට එහෙම කරන්නවත් උවමනා වුණේ නෑ.

එතකොට දෙන්නගේ විවාහය සිද්ධවුණේ කොහොමද?

අපි අවුරුදු හතක් ආදරේ කරලා දෙන්නගේම ගෙවල්වල ආශීර්වාද එක්ක 2016 අවුරුද්දේ විවාහ වුණා.

මේ වෙනකොට ඩිල්ෂාන් එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?

මේ අවුරුද්දට අපි විවාහවෙලා අවුරුදු හතක් වෙනවා. දැන් අපිට පෙරපාසල් යන වයසේ දුවෙකුයි පුතෙකුයි ඉන්නවා.

ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳක් කියන වගකීම සංජීට දැනෙන්නේ කොහොමද?

ගොඩාක් අය හිතාගෙන ඉන්නේ ක්‍රිකට් ක්‍රීඩකයෙක්ගේ බිරිඳක් කිව්වම හැමදේම ලැබෙන වාසනාවන්ත පිරිසක් කියලා. ඔව් ඒක ඇත්ත. ඒත් එතැනින් එහා ලොකු වගකීමක් ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳකට තියෙනවා. ලොකුම වගකීම වෙන්නේ එයාව නිදහස් මනසකින් තරඟයට යවන එක. ඒ වෙනුවෙන් ලොකු කැපකිරීමක් කරන්න ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ බිරිඳකට සිදුවෙනවා. අනික තමයි එයාලගේ කාර්යබහුල බව. ගෙදර නැති දවස් තමයි වැඩි. ටුවර් එහෙම ගියාම මාස ගාණකින් දකින්න නෑ. දරුවන්ටත් තාත්තා ඕනේ. ඒ වෙලාවට ඉතින් දුකයි. ඒ හැමදේම අපිට දරාගන්න වෙනවා.

ඔයා වගේම පොඩි දෙන්නත් ඩිල්ෂාන්ගේ මැච් බලන්න හරි උනන්දුයි කියන්නේ ඇත්තද?

මං ඉස්සර ක්‍රිකට් ගැන කිසිම දෙයක් දන්නේ නෑ. ඩිල්ෂාන් තමයි මට හැමදේම කියලා දුන්නේ. පස්සේ මං ක්‍රිකට් ගැන උනන්දු වුණා. අදටත් ඩිල්ෂාන් ඉන්න මැච් එකක් මගඅරින්නේ නැතුව මං බලනවා. දැන් දරුවන්ටත් ඒ හුරුව ගිහිල්ලා. එයාලටත් තාත්තගේ මැච් එකක් යනවා නම් ඊට වඩා දෙයක් නෑ.

ලංකාව නියෝජනය කරපු ක්‍රීඩකයෝ එක්ක බැලුවම ඩිල්ෂාන් ටිකක් අවාසනාවන්ත ක්‍රීඩකයෙක් කියලා මං කිව්වොත්?

ඔව් එයාට ලංකාව නියෝජනය කරන්න අවස්ථාව ලැබුණේ හරි අඩුවෙන්. එයාගේ හොඳම කාලේ කණ්ඩායමට එයාව ගිලිහුණා. ඒත් ඩිල්ෂාන්ට කිසිම පසුතැවීමක් නෑ. මොකද එයාට ඕනකම තිබුණේ අපේ රට නියෝජනය කරලා එක මැච් එකක් හරි ගහන්න. ලංකාව වෙනුවෙන් එක හයක් හරි ගහන්න. ඉතින් එයා ඒක කළා.

හැබැයි ඩිල්ෂාන්ගේ වටිනාකම අනෙක් රටවල්වලට නම් හොඳටම දැනුණා නේද?

ඒක ඇත්ත. ලෝකේ වටේම තිබුණු ක්‍රිකට් තරඟවලට ක්‍රීඩා කරන්න එයාට අවස්ථාව ලැබුණා. ඒ හැම අවස්ථාවකදිම එයා හොඳින් ක්‍රීඩා කළා. එයාගේ රද්දමය වේගෙන් බෝලෙට ගහන එක. ඒ රද්දමය හැම තරඟයකදිම මං දැක්කා. මං එයාගේ ආසත් ඒ ගහන ස්ටයිල් එකට තමයි.

ක්‍රිකට් පිටියේ එහෙම වෙනකොට එයා ගෙදරදි කොයි වගේ කෙනෙක්ද?

ඩිල්ෂාන් කියන්නේ බිරිඳක් ප්‍රාර්ථනා කරන විදියේ සැමියෙක්. මං වෘත්තියෙන් මෝස්තර නිර්මාණකරණයේ යෙදෙනවා.

දුව ලැබුණට පස්සේ දුව "Princess" වෙලා මං "Queen" වුණා. ගොඩාක් වෙලාවට එයා මට කතා කරන්නේ "My Queen" කියලා.

ඉතින් එයා ගෙදර ඉන්න දවසට මගේ වැඩවලටත් ගොඩාක් උදව් කරනවා. උයන පිහන වැඩ, ගෙදර වැඩ, දරුවෝ නාවන වැඩ පවා එයා බෑ නොකියා කරනවා. ඉතින් මටත් ලේසියි. එයාගේ බිරිඳ වීම මං ජීවිතේ ගත්ත හොඳම තීරණය කියලා මට හිතෙනවා.

ඒ කියන්නේ ඩිල්ෂාන්ට රහට උයන්න පුළුවන්ද?

(සිනාසෙමින්) නැතුව නැතුව. හොඳටම උයන්න පුළුවන්. මං වෙලාවකට කියනවා "ඔයාට ඩිලූ හොඳ වෙග් කෙනෙකුත් වෙන්න තිබුණනේ" කියලා. ඒ විතරක් නෙවෙයි එයාට සැඟවුණු දක්ෂතා ගොඩාක් තියෙනවා. හොඳට ඉගෙනගන්න, සිංදු කියන්න එහෙමත් පුළුවන්.

එයාට සිනමාශාලාවලින් චිත්‍රපට බලන්නත් ලොකු හැකියාවක් තියෙනවා කියන්නේ ඇත්තද?

(සිනාසෙමින්) ඔව් ඔව්. අදටත් එයා චිත්‍රපට බලන විදිය මතක්වෙලා මට හිනායනවා. ඔන්න ආදරේ කරන කාලේ අපි දෙන්නා ෆිල්ම් එකක් බලන්න ගියා. ඒක ඇක්ෂන් ෆිල්ම් එකක්. ටික වෙලාවලින් මට ෆිල්ම් හෝල් එකේ කෙනෙක් ගොරවනවා වගේ ඇහෙනවා. ඉතින් ෆිල්ම් හෝල් එකෙත් නිදියන මනුස්සයෝ ඉන්නවද කියලා හිතින් හිනාවෙවී මං ෆිල්ම් එක බැලුවා. ඒත් හිතේ සැකේට මං ඩිල්ෂාන් දිහා බැලුවා. බලද්දි එච්චර වෙලා හොඳට නිදාගෙන ගොරවලා තියෙන්නේ එයා. අච්චර සද්දේ එන හෝල් එකෙත් නිදියන් ඉන්න හැටි දැක්කම මටත් හිනා. එදයින් පස්සේ ඊයේ පෙරේදා වෙනකල් ෆිල්ම් බලන්න නම් ගියේ නෑ.

එයා ඔයාට ආදරේට කියන්නෙත් "My Queen" කියලලු නේද?

ඒක නම් ඇත්ත. එයා ඉස්සර ඉඳන්ම මට කතා කළේ "Princess" කියලා. ඒත් දුව ලැබුණට පස්සේ දුව "Princess" වෙලා මං "Queen" වුණා. ගොඩාක් වෙලාවට එයා මට කතා කරන්නේ "My Queen " කියලා.

ජාතික කණ්ඩායමට සමුදුන්නට ඩිල්ෂාන් අදටත් ලෝකේ වටේම ක්‍රිකට් ගහනවා. බිරිඳ විදියට මේ මොහොතේ ඔයා එයාව දකින්නේ කොහොමද?

එයාට තාමත් හොඳට ක්‍රීඩා කරන්න පුළුවන්. ජාතික කණ්ඩායමට වුණත් ක්‍රීඩා කරන්න බැරිකමක් නෑ. එයා නිතරම කියන්නේ එයාට පුළුවන් කාලයත් වෙනකල් එයා ක්‍රිකට් ගහනවා කියලා. ඩිල්ෂාන් කොයි රටේ ක්‍රිකට් ගැහුවත් එයා නියෝජනය කරන්නේ අපේ ලංකාව. ඉතින් එයාගේ බිරිඳ විදියට මට ඩිල්ෂාන් ගැන ආඩම්බරයි.

■ රුවන් එස්.සෙනවිරත්න

විනාඩි විස්සට තේ දලු කිලෝ දහයක් නෙළූ සිදෙයිඅම්මා

සිදෙයිඅම්මාගේ සිතේ තිබුණෙත් අනෙක් බොහෝ අම්මලාගේ හිතේ ඇති බලාපොරොත්තුමය. දරු තිදෙනාට හොඳට ඉගැන්වීම ඇගේ ලොකුම බලාපොරොත්තුව විය. ඒ හීන වෙනුවෙන් දලු මත කඩිසරව වහා මෙහා දිවූ සිදෙයිඅම්මාගේ දෑතට පසුගියද සම්මානයක් හිමිවිය.

ඒ පසුගියද රදැල්ල වතුයායේදී පැවැත්වූ හොඳම තේ දලු නෙළන්නියට හිමි සම්මානයයි.

වතු කම්කරුවන් මෙරටට පැමිණ වසර දෙසීයක් පිරීම නිමිත්තෙන් එම ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් මෙම තරඟය සංවිධානයකොට තිබුණේ කැලණිවැලි, තලවකැලේ මෙන්ම හොරණ වැවිලි සමාගම් එක්වය.

දරුවන්ට හොඳට උගන්වනවා. ඉතිරි මුදල් පොතේ දානවා

එහිදී තිස්අට හැවිරිදි ආර්.සිදෙයිඅම්මා හතළිස් ගණනක් වූ තරඟකාරිනියන් අතරින් පළමුවැනියා බවට පත්විණි. ඒ විනාඩි විස්සක කාලයකදී දලු කිලෝ දහයකුත් ග්‍රෑම් හාරසිය පනහක් නෙළා ගනිමිනි. ඇයට හොඳම දලු නෙළන්නිය ලෙස රුපියල් ලක්ෂ තුනක ත්‍යාග මුදලක් ලැබුණු අතර, තලවකැලේ හොඳම දලු නෙළන්නිය ලෙස තවත් රුපියල් ලක්ෂයක මුදලක් ලැබිණි.

"වතු කම්කරු කාන්තාවක් හැටියට මට ලොකු බලාපොරොත්තු නෑ. හැබැයි උත්සාහය තිබුණොත් ජයග්‍රහණය කියන දේ අපිට ලබාගන්න පුළුවන්. හොඳම තේ දලු නෙළන්නිය වුණ එක ගැන මට ගොඩක් සතුටුයි. ඒ මොහොතේ මගේ හිතේ තිබුණේ මගේ දරුවන්ගේ අනාගතය ගැන බලාපොරොත්තුයි. එහෙම හිතෙද්දි මම ඉක්මනින් දලු නෙළුවා."

රස්සාවක ලොකු පුංචි කියා දෙයක් නැත. කැමැත්තෙන් එය කරනා තරමට, ලැබෙන ඇගයීමද අඩු නැති බව සිදෙයිඅම්මාගේ කතාව අපට කියාදෙන්නීය. ඒ අනුව ඇයට මෙම තරඟාවලියෙන් ලක්ෂ හතරක මුදල් ත්‍යාගයක් හිමිවුණි.

"වත්තේ වැඩ කරන අපේ ජීවිත ඊටම දියවෙලා යනවා කියනවා වෙනුවට, වැඩ කරලා අපිට වැඩි මුදලක් උපයගන්න, ඒ මුදලින් දරුවන්ගේ ඉගෙනුම් කටයුතු කරන්න පුළුවන්නම් ඒක වැදගත් කියලා මම හිතනවා. අපිට ආර්ථික ප්‍රශ්න තියෙනවා. සමහර දවසට දරුවෝ ඉස්කෝලේ යන්නේ රොටියක් කාලා. දරුවන්ගේ ඉගෙනුම් කටයුතුවලට යොදවනවා වගේම මෙම මුදල් ස්ථිර ගිණුමකට බැර කරලා දරුවන්ගේ අනාගතය වෙනුවෙන් වෙන් කරනවා. මගේ ලොකු දුව මෙවර සාමාන්‍ය පෙළ විභාගයට පාඩම් කරනවා. ඉතින් වත්තේ මහත්වරුත් මට කිව්වා මේ මුදල් හොඳ දෙයකට යොදවන්න කියලා. මගේ මහත්තයා එදිනෙදා කුලී වැඩ කරමින් පවුලේ ආර්ථිකය ශක්තිමත් කරන්න වෙහෙසෙනවා. ඔහුත් මේ ගැන සතුටුවේවි. ඒ වගේම හැමදෙනාම මේ වගේ ජයග්‍රහණ ලබාගන්න උත්සාහවන්ත වෙන්න ඕන."

සිදෙයිඅම්මා කියන්නේ, තමන් අත්විඳි මේ සතුට තම සහෝදර දලු නෙළන්නියන්ද දිනක අත්කරගන්නවා දකින්නට ඇය කැමති බවයි.

මෙම තරඟයේ අවසන් තරඟකාරිනියන් හතළිස් දෙදෙනා තෝරාගෙන ඇත්තේ, ඒ ඒ වතු ආශ්‍රිතව තරඟවට කිහිපයක් පැවැත්වීමෙනි. එහිදී මෙම තරඟයේ සමාගම් තුනේම ප්‍රථමයාත්, තලවකැලේ වතුයායේ ප්‍රථමයාත් සිදෙයිඅම්මා වෙද්දී, හොරණ වැවිලි සමාගමේ හොඳම තේ දලු නෙළන්නිය ලෙස එම් විග්නේෂ්වරීත්, කැලණිවැලි සමාගමේ හොඳම දලු නෙළන්නිය ලෙස එම්.ජෝතිමදිත් ලක්ෂයේ මුදල් ත්‍යාග ලැබීය. මෙහිදී දෙවන හා තෙවන ස්ථානයන් ලබාගත් ජයග්‍රාහිකාවන්ටද පිළිවෙළින් රුපියල් හැත්තෑපන්දහස බැගින් හා පනස් දහස බැගින් මූල්‍ය ත්‍යාග පිරිනමා තිබේ.

දිනකට රුපියල් දහසක වැටුපක් ලබන වතු කම්කරුවන් ඒ වෙනුවෙන් දිනකට තේ දලු කිලෝ දහඅටක් නෙළිය යුතුය. එවැන්නන් දිරිගැන්වීම වෙනුවෙන් සංවිධානය කළ මෙම වැඩසටහන සැබැවින්ම ප්‍රශංසාවට ලක්විය යුතුය.

■ දීපා වසන්ති එදිරිසිංහ

කාන්තා දිනය නිමිත්තෙන් පළවෙන විශේෂ ලිපියකි

මැස්සෙක්වත් වහලා නැති ගැනියෙක් තමයි මං කසාද බැඳින්නේ

මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

සියමන් නවගත්තේගමගේ ආන්දෝලනාත්මක නවකතාවක් තමයි 'සුද්දිලාගේ කතාව' කියන්නේ. ඔය කතාවේ ඉන්නවා එක දඹරකයෙක්. කතාවේ හැටියට ඔහු අවුරුද්දේ තුන්සිය හැටපස් දවසෙන් වැඩි හරියක් ඉන්නේ හිරගෙදර. එකවතාවක් හිරෙන් නිදහස් වෙලා ආපු ගමනක ගමේ ඉන්න අහිංසකම මනුස්සයෙක්ව මරලා දාන්න කියලා ඔහුට කොන්ත්‍රාත්තුවක් ලැබෙනවා. කොන්ත්‍රාත්තුව නිසා මේ දඹරකයා අර පුද්ගලයාව මරලා දානවා. ඊට ටික කාලෙකට පස්සේ මේ දඹරකයයි අර මරලා දාපු පුද්ගලයාගේ බිරිඳයි අතරේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවෙනවා. ඔය සම්බන්දේ ටිකෙන් ටික දුරදිග ගියාට පස්සේ දෙන්නා අඹුසැමියෝ විදියටත් ජීවත්වෙන්න පටන්ගන්නවා. ඔය අතරවාරෙදි අර පුද්ගලයාව මැරුවේ මේ දඹරකයා කියලා පොලිසියට ඔත්තුවක් යනවා. ඒ නිසා පොලිසිය විටින්විට මොහුව ලුහු බඳින්න පටන්ගන්නවා. හැබැයි ඒ වෙද්දිවත් අර කාන්තාව දැනගෙන හිටියේ නෑ තමන්ගේ කලින් සැමියාව ඝාතනය කළේ මේ දඹරකයා කියන විත්තියක්. පස්සේ මොවුන් දෙන්නා පොලිසියෙන් බේරිලා ජීවත් වෙන්න දුර පළාතකට පැනලා යමු කියලා කතාබහ වෙනවා. ඒ අනුව මොවුන් දෙන්නා බොහොම දුර පළාතකට පැනලා යනවා. ඔය යන අතරවාරෙදි දෙන්නම විඩා නිවාගන්න කියලා හිතාගෙන ගල්තලාවක් උඩට ගිහිල්ලා මහන්සි අරිනවා. ඒ ඉන්න අතරතුරේදී දෙන්නා දෙන්නගෙම ජීවිතවල යටගියාවල් ගැන කතා කරන්න පටන්ගන්නවා. අර කතාවකුත් තියෙනවනේ ආදරේ අන්ධයි කියලා. මේ මෝඩ දඹරකයාටත් වුණේ ඒ සන්තෑසියම තමයි. ටික වෙලාවක් යද්දි දන්නෙම නැතුව කතාවෙන් කතාවෙන් මොහු ඇගේ පහසට මත්වෙලා ඔහේ දෙඩවන්න පටන්ගන්නවා. කතාව අතරතුරේදී ඇගේ කලින් සැමියාව ඝාතනය කළේ තමන් බවත් ඔහු අර කාන්තාව ඉදිරියේ වමාරනවා. "බලන්නකෝ මම එදා ආවේ ඔයාගේ මහත්තයව මරන්න නෙවෙයි. ඒත් ඒ වෙලාවේ මගේ ඉලක්කේ වැරදිලයි ඔයාගේ මහත්තයට වෙඩි වැදුනේ" කියලා ඔහු කියනවා. ඒ බලාපොරොත්තු නොවුණ කතාවෙන් ඇගේ ස්වරූපය සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා යනවා. ක්ෂණිකව අර දඹරකයාගේ ඉනේ තිබුණ පිස්තෝලෙ උදුරගෙන ඇය ඔහුව ඉලක්ක කරගෙන මෙන්න මෙහෙම කියනවා.

"මගේ මිනිහා මළාට පස්සේ මම උඹට ආදරේ කළා තමයි. උඹත් එක්ක එක වහලයක් යට ජීවත්වෙලා එක ඇඳක නිදගත්තා තමයි. ඒත් එහෙම කළේ මෙහෙම දෙයක් නොදැන මිසක් මගේ කොන්ද පණ නැතිකමටවත් චපලකමටවත් නෙවෙයි. අනික උඹ මගේ මිනිහගේ මිනීමරුවා කියලා දැන දැනම තවදුරටත් උඹ එක්ක පවුල් කන්න තරම් මම බියගුලු ගෑනියෙකුත් නෙවෙයි. එදා උඹට උඹේ ඉලක්කේ වැරදුණාට අද උඹ බලාගනින් මගේ ඉලක්කේ කොහොමද කියලා."

ඔය විදියට කියන ඇය හරියටම ඉලක්කෙට වෙඩි තියලා ඒ දඹරකයාව එතැනදිම මරලා දානවා.

මොනම හේතුවක් නිසාවත් මිනීමැරීම අනුමත නොකළට මොකද ඔය කතාව කියවන ඕනම කෙනෙකුට ඇගේ නිර්භීත පෞරුෂය ගැන අනිවාර්යයෙන්ම පැහැදීමක් ඇතිවෙන්න පුළුවන්. මොකද ඇය ඒ වෙලාවේ මොන තත්ත්වෙක හිටියත් හැඟීම්වලට වහල් වෙලා කටයුතු කළේ නෑ. මැරුණ එකා මැරිලා ඉවරයි, දැන් ජීවත්වෙන මාව නඩත්තු කරන්න පිරිමියෙක් ඕනෙ කියලා හිතුවෙත් නෑ. කිසිම විදියට ඔහුට සමාවක් දීලා ආපහු සැරයක් ගෙට වද්දගත්තෙත් නෑ.

මෙන්න මේකත් ඒ විදියෙම කතාවක්.

ජාතක කතා පොතේ තියෙන 117 වැනි ජාතකය තමයි වට්ටක ජාතකය. ඔය කතාවේ ඉන්නවා උත්තර කියලා සිටු කුමාරයෙක්. සිටු සම්පත් තිබුණට මොකද ඔහු ගිහි ජීවිතයටවත්, කම්සැපවලටවත් වැඩිය ඇල්මක් තිබුණ කෙනෙක් නෙවෙයි. ඔහොම ඉන්නකොට ඉන්දියාවේ කාර්තික උත්සව කාලේ උදාවෙනවා. ඔය කාර්තික උත්සවය කියන්නේ හින්දු උදවියගේ නැකැත් කෙළියට. ඒක හරියට අපේ සිංහල අලුත් අවුරුද්ද වගේ එකක්. විශේෂයෙන්ම ඔය කාලෙට ඒ අය තම තමන්ගේ පවුල්වල උදවිය එක්ක එකතුවෙලා ගොඩක් සතුටෙන් සමාදානගෙන් කාලය ගත කරනවලු. එතකොට ඒ කාලෙදි සාමාන්‍ය ගෙවල්වල විතරක් නෙවෙයි සිටුමැදුරුවලත් නැටුම්, ගැයුම්, ප්‍රිය සම්භාෂණවලින් කිසිම අඩුවක් නෑලු. හැබැයි මේ කියන උත්තර කුමාරයා නම් ඔය දේවල් තරයේම ප්‍රතික්ෂේප කරපු කෙනෙක්. ඒ විතරක් නෙවෙයි ඔහු ගොඩක් වෙලාවට සිටුමැදුරට වෙලා භාවනායෝගීව ඉන්න තමයි කැමැත්තක් දක්වලා තියෙන්නේ. එක දවසක්ද උත්තරගේ සම වයසේ යාළුවෝ ටිකක් සිටුමැදුරට ඇවිත් ඔහුට මෙන්න මෙහෙම කතාව කියනවා.

"අයියෝ උත්තර, උඹ සිටු කුමාරයෙක් වෙලත් මේ වගේ කාලෙකදී විනෝද වෙන්න බැරිනම් ඒ ජීවිතෙන් ඇති පලේ මොකක්ද? උඹට කෙල්ලෙක් ඕනෙ නම් අපි හෙටම හොයලා ගෙනත් දෙන්නම්. උඹට තියෙන්නේ ඒ කෙල්ලත් එක්ක හොඳහැටි විනෝද වෙන්න විතරයි" කියලා.

ඊට පහුවෙනිදම උත්තරගේ මේ යාළුවෝ ටික ගිහිල්ලා හොඳ ලස්සන ගණිකාවක් හොයාගෙන එනවා. ඇයට සිද්ධිය විස්තර ඇතුව කියලා උත්තරව පොළඹවගන්න රහසින්ම සිටුමැදුරටත් ඇතුල් කරනවා. යාළුවොන්ගේ මේ නොහොබිනා වැඩේ ගැන දැනගත්තු උත්තර කුමාරයා ඇයට නිකම්ම මුදල් ගෙවලා සිටුමාලිගාවෙන් පිටත් කරලා යවනවා. හැබැයි ඉතින් අර ඌරෝ කැකුණ තලද්දි හබන් කුකුලන්ට රජ මඟුල් කියන්නා වගේ ඕක දැකපු ඇමතියෙක් රහසින්ම මේ ගණිකාව උස්සගෙන ඔහුගේ ගෙදරට අරගෙන යනවා. එතැන ඉඳන් ඇය ආගිය අතක් ගැන කාටවත් දැනගන්න ලැබෙන්නෙ නෑ. ඔය වෙද්දි කාර්තික උත්සවයත් ඉවර වෙලා. බලන් ඉඳලා බැරිම තැන ඇගේ අම්මා ඇවිල්ලා උත්තර කුමාරයාගෙන් අහනවා තමන්ගේ දුවට මොකක්ද කළේ කියලා. නමුත් ඇයට මුදල් දීලා පිටත් කරපු විත්තියක් ඇරෙන්න ඊට වැඩි යමක් කියන්න උත්තර කුමාරයත් දැනගෙන හිටියේ නෑ. අන්තිමේදී මේ කතාව රජතුමාගේ කනටත් යනවා. වෙලා තියෙන දේ ගැන මුල ඉඳන් අගට යනකල් හොයලා බලන රජතුමා මේ සිදුවීම සම්බන්ධයෙන් උත්තරව වැරදිකාරයා කරලා ඔහුට මරණ දඬුවම නියම කරනවා. හැබැයි ඊටපස්සේ උත්තරව මරන්න අරගෙන ගියේ අර ගණිකාව සඟවාගෙන හිටපු ඇමතියගේ ගෙදර ළඟින්මයි. ගණිකාවක් මරපු වරදට උත්තරගේ හිස ගසා දමන බව වදකයා ප්‍රචාරය කරද්දී ඔය කතාව ඇමතියගේ ගේ ඇතුළේ හිටපු අර ගණිකාවටත් ඇහෙනවා. එතකොටම ඇය ලැජ්ජාව බය පැත්තකින් තියලා අර හැමෝම ඉස්සරහට ඇවිත් ඒ කියන ගණිකාව තමා බවත්, තමා නිරුපද්‍රිතව සිටින බවත් පිළිගන්නවා.

ගණිකා වෘත්තිය ඉතිහාසයේ පරණම රස්සාව වුණත් අදටත් තමන් ගණිකාවක් කියලා ප්‍රසිද්ධියේ පිළිගන්න අය නැති තරම්නේ. මොකද කවුරු මොනවා කිව්වත් ඊටපස්සේ සමාජයෙන් විල්ලවෙන ප්‍රශ්නවලට මූණ දීගන්න අමාරු නිසා. ඒත් වට්ටක ජාතකයේ ඉන්න මේ ගණිකාවට ඊට එහා ගිය ආත්මශක්තියක් තිබිලා තියෙනවා. තමන් ගණිකාවක් වුණත් ඔව් මම ගණිකාවක් කියලා ප්‍රසිද්ධියේම කියන්න තරම් ඇයට පෞරුෂයක් තිබිලා තියෙනවා.

ඉතින් මුලින්ම ඔය කතා දෙක ගැන ටිකක් මතක් කරලා ඉන්න හිතුවේ අද අපි කතා කරන්න යන්නෙත් කාන්තාවන්ගේ පෞරුෂය ගැන නිසා.

කාන්තාවන් තමන්ගේ පෞරුෂය සකසාගත යුත්තේ කොයි ආකාරයටද?

ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා සමඟින්.

මෙදා පාර කාන්තා දිනය වෙනුවෙන් ඔවුන්ගේ පෞරුෂය හඳගන්න ඕන විදිය ගැන යමක් කතා කළොත් හොඳයි කියලා මට හිතුණා. මොකද පෞරුෂ වර්ධනයේ මදිකම නිසා නොයෙක් විදියේ ප්‍රශ්නවලට මුණදෙන කාන්තාවෝ වගේම තරුණ දූලාත් තාම අපි අතරේ ඕනතරම් ඉන්නවා.

මම මුලින්ම මගේ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවකට වුණ ඇත්තම සිදුවීමක් කියලා මේ කතාව පටන්ගන්නම්. මගේ දක්ෂ ශිෂ්‍යාවක් හිටියා සමාධි කියලා. ඇයට විශ්වවිද්‍යාලයේම තරුණයෙකුත් එක්ක ප්‍රේම සම්බන්ධයකුත් තිබුණා. අපි කවුරුත් දැනගෙන හිටිය විදියටනම් ඇයට ඔය කියන ප්‍රේම සම්බන්ධයට කලින් වෙනත් සම්බන්ධතා තිබුණ කෙනෙක් නෙවෙයි. හැබැයි ඇගේ පෙම්වතාට නම් වෙනත් සම්බන්ධතා හය හතක්ම වගේ තිබිලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි ඔහු කලින් හිටපු තරුණියන් එක්ක ලැගුම්හල්වලට ගිය හැටි පවා ප්‍රසිද්ධියේ කියවන සෙල්ලක්කාර තරුණයෙක් විදියටයි විශ්වවිද්‍යාලය පුරාවටම ප්‍රසිද්ධ වෙලා හිටියේ. හැබැයි අර දුව ඔහුව යහමාර්ගයට ගන්න වෙහෙසුණා ඇරෙන්න දමලා ගහලා යන්න ගියේ නෑ. නමුත් ඇය දවසක් මගේ ළඟට ඇවිල්ලා කිව්වා "සර් මම අර සම්බන්දේ නවත්තලා දැම්මා" කියලා. ඒ කියද්දි වුණත් ඇගේ මූණේ කිසිම දුකක් කණස්සල්ලක් පේන්න තිබුණේ නෑ. පස්සේ මම හීන්සැරේ එහෙම කරන්න හේතුව මොකක්ද කියලා ඇගෙන් අහලා බැලුවා. මේ දුව කියපු විදියට ඇය අර පිරිමි ළමයගෙන් අහලා තියෙනවා, මටත් ඔයාට වගේ වෙන සම්බන්ධතා ගොඩක් තිබුණොත්, මමත් ඔයා වගේ කාමර ගානේ ගිහිල්ලා අහුවුණොත්, ඒවට සමාව දීලා මං ඔයාව භාරගත්තා වගේ මාවත් භාරගන්නවද කියලා. ඒ ඇහුවට පස්සේ අර තරුණයා ගත්කටටම කියලා තියෙන්නේ, මම කවදහරි බඳිනවා නම් බඳින්නේ එක එකා එක්ක වටේ ගිහින් නැති පිරිසිදු කෙල්ලෙක් විතරයි කියලා. ඔය කතාව මට කියලා අර දුව මගෙන් අහනවා "එතකොට සර් මෙච්චර වැදගත් විදියට ජීවත් වුණ මම විතරක් මොකටද මේ වගේ නැතිනාස්ති වුණ සෙල්ලක්කාර කොල්ලෙක්ව කරගහන්නේ?" කියලා. "එච්චර වැරදි කරලත් එයාට පුළුවන්කමක් තියෙනවා නම් එයා භාරගන්නේ වැදගත් පිරිසිදු කෙල්ලෙක් විතරයි කියලා මගේ මූණටම කියන්න මෙච්චර වැදගත් විදියට ජීවත් වුණ මට ඇයි ඒ වගේ පිරිමියෙක් එපා කියන්න තරම් ආත්මශක්තියක් නැත්තේ" කියලා.

මේ කතාවෙන් මම කියන්න උත්සාහ කළේ කසාදෙකට කලින් කෙල්ලෝ කොල්ලෝ තමන්ගේ පිරිසිදුකම රැකගන්න ඕනෙ කියන අර සාම්ප්‍රදායික කතාවම නෙවෙයි. තමන්ගේ සැමියා ඉදිරියේ වේවා පෙම්වතා ඉදිරියේ වේවා තමන්ට ගෞරවයෙක් ලබලා දෙන්න, තමන් වෙනුවෙන් පෙනී හිටින්න තරම් අපේ දුවලට හොඳ ආත්මාභිමානයක්, පෞරුෂයක් තියෙන්න ඕන කියන එක.

ඕකෙම අනිත් කාරණාව තමයි මහා ලොකුවට වියදම් නොකළත් තමන් දීග යන දවසට නෑදෑ සනුහරේ මැද්දේ පෝරුවකට නැගලා වැදගත් විදියට පිටත්වෙලා යන්න අපේ දුවලා හැම කෙනෙක්ම හිතට ගන්න ඕන කියන එක. මොකද එහෙම හිතාගෙන ඉන්න දුවෙකුට නිකමට හරි පිරිමි ළමයෙක් හොරාට දීග යන්න කතා කළොත්, ලැගුම්හල් ගානේ යන්න කතා කළොත් ඒවා ප්‍රතික්ෂේප කරන්න තරම් හොඳ පෞරුෂයක් ගොඩනැගෙනවා.

> **මම එදා ආවේ ඔයාගේ මහත්තයව මරන්න නෙවෙයි. ඒත් ඒ වෙලාවේ මගේ ඉලක්කේ වැරදිලයි ඔයාගේ මහත්තයට වෙඩි වැදුනේ**

මේකත් ඔය විදියෙම තවත් කතාවක්. මේ කියන දුව මේ මහනුවර පළාතෙම මම හොඳට දන්න කියන ව්‍යාපාරික පවුලක කෙනෙක්. ඇයට වෙන සහෝදර සහෝදරියක්වත් හිටියේ නෑ. දෙමව්පියෝ වුණත් විසිහතර පැයේම ව්‍යාපාරත් එක්ක ඔට්ටු වුණ අය. ගොඩක් වෙලාවට ඇගේ තනි නොතනියට හිටියේ ගෙදර වැඩ කරපු අය විතරයි. ගෙදර රියදුරු වෙලා හිටියෙත් හොඳ ඇහැට කනට පේන කඩවසම් තරුණයෙක්. මේ දුවත් උදේ හවස ඉස්කෝලෙට, අමතර පංතිවලට පවා ගියේ ආවේ ඒ රියදුරා එක්ක. ඔහොම යන එන අතරතුරේදි මේ දුවයි ඒ රියදුරයි අතරේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවෙලා තියෙනවා. අන්තිමට පිට ලැගුම්හල්වලට යන එන තරමටම ඕක දුරදිග ගිහිල්ලාත් තියෙනවා. එහෙම ගිය දවසක දෙන්නා අතරේ වුණ හැමදෙයක්ම වගේ අර රියදුරා වීඩියෝගත කරගෙන තියෙනවා. ඊටපස්සේ දෙමව්පියන්ගෙන් මුදල් ඉල්ලලා නොදුන්නොත් ඒවා අන්තර්ජාලයට දානවා කියලා ඇයට තර්ජනය කරලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි ඔහුගේ නානාප්‍රකාර යාළුවෝ එක්කත් තැන් තැන්වලට යන්න කියලා බලපෑම් කරලා තියෙනවා. මේ දුව මට කියපු විදියට මුලින් මෝඩ විදියට කටයුතු කරලා තිබුණත් පස්සෙදි බොහොම උපක්‍රමශීලීව බය නැතුව කටයුතු කරලා තියෙනවා. ඇය ඔහුගේ වචනෙට බයවෙලා දෙමව්පියන්ගෙන් මුදල් ඉල්ලලා දීලාවත්, ඔහුගේ යාළුවෝ එක්ක ලැගුම්හල්වලට ගිහිල්ලාවත් නෑ. ඒ වෙනුවෙන් දීලා තියෙන එකම උත්තරේ තමයි එතැනින් එහාට ඔහු ඇතිකරන ඕනම ප්‍රශ්නෙකට මුණදෙන්න ඇයත් ලෑස්තියි කියන එක.

මේ කතාවෙන් මම කියන්න හැදුවේ ඒ දුව කළේ මහ ලොකු හපන්කමක් කියලා නෙවෙයි. තමන් අතින් වුණ වැරැද්දේ වගකීම භාර අරන් ජීවිත හානියක් කරගන්නේ නැතුව ඊට මුණදෙන්න තරම් ඇයට හොඳ පෞරුෂයක් තිබුණා කියන එක.

ඔය අපි දන්න කියන එක ප්‍රශ්නයක් දෙකක් විතරනේ. නමුත් අදටත් තමන්ගේ පෙම්වතා දලා ගිය පලියට, රැකියාව කරන තැන ප්‍රශ්නවලට මුණ දීගන්න බැරුව විතරක් නෙවෙයි ගෙවල්වල තියෙන ආර්ථික ප්‍රශ්න නිසාත් දිවි නහගන්න හදන, දිවි නහගත්තු තරුණ දුවලා, කාන්තාවෝ කොයිතරම් ඉන්නවද? මේ තත්ත්වෙට ලොකුම හේතුව තමයි පෞරුෂ වර්ධනය හීනවීම. අර සුද්දිලාගේ කතාවේ හිටපු කාන්තාවටත්, වට්ටක ජාතකයේ හිටපු ගණිකාවටත් බය නැතුව කියපු දේ කරන්නත්, කරපු දේ කියන්නත් තරම් හොඳ පෞරුෂයක් තිබුණා. අපේ තරුණ දුවලා වගේම කාන්තාවනුත් අන්න ඒ විදියේ හොඳ පෞරුෂයක් ඇති කරගත යුතුයි කියලයි අවසාන වශයෙන් මම කියන්නේ.

■ **ලිහිණී මධුෂිකා**

ඒ කොල්ලා දැක්ක තැන මේ අලියා පුරුෂ ලිංගය එළියට දානවලු

තොරතුරු
මහාචාර්ය අශෝක දංගොල්ල
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

වසර කිහිපයකට පෙර මහාචාර්ය දංගොල්ලට විශේෂ තොරතුරක් දැනගැනීමට ලැබිණ. ඒ, පිරිමි අලින්ගේ ශුක්‍රාණු එකතු කරගැනීමට හැකි බවත්, ඒවා කෘත්‍රිම සිංචනය කර මෙරට අලින්ට පිටරටවලදී ඒ ක්‍රමයට පැටවි ඉපදී ඇති බවත්ය. එය කදිම ආරංචියකි. ආරංචිය දැනගැනීමත් සමඟ මහාචාර්යවරයාගේ කුතුහලය ඉහළ ගියේය. එකෙනෙහිම අලියෙකුගේ ශුක්‍රාණු එකතු කිරීමට හෙතෙම කල්පනා කළේය. ඒ සඳහා ඔහු ගැළපෙන පිරිමි සතකු තෝරාගත්තේය. ඉගෙනගැනීමට කැමති ජවසම්පන්න පිරිමි ළමයෙකුද සොයාගත්තේ අලින්ගෙන් ශුක්‍රාණු එකතු කිරීම සඳහායි.

මහාචාර්ය දංගොල්ල ඒ පිළිබඳ තරුණයාට පුහුණුවක් ලබා දුන්නේය. අලියාගේ ගුද මාර්ගයට අත දමා එහි පතුල ක්‍රමයෙන් ස්පර්ශ කළ යුතු බව මහාචාර්යවරයා ඔහුට ඉගැන්වීය. හෙතෙම වැඩිදුරටත් දැනුම් දුන්නේ අඩ පැයක් පමණ ගතවනතුරු වය නැවත නැවත කළ යුතු බවයි. කාර්යය දිනපතා සිදුකෙරිණ. සෑම දිනකම උදෑසන හය වෙද්දී පිරිමි ළමයා අලියාට ළංව මේ කටයුත්ත කළේය. සතියක් පමණ ගෙවී ගියේය. අලියා හොඳට තරුණයාට හුරුවන බව මහාචාර්ය දංගොල්ලට වැටහෙමින් තිබිණි. සති දෙකක් පමණ ගෙවී ගිය විට පිරිමි ළමයා දුටු විගස කිසිඳු විධානයකින් තොරවම කකුල් ඇත්කර සිය පුරුෂ ලිංගය පිටතට දැමීමට අලියා හැඩගැසී සිටියේය. මේ දසුන දකිද්දී මහාචාර්යවරයාට සිනා නොවී සිටිය නොහැකි විය. කෙසේ වෙතත් රාජකාරිය සඳහා තමා තෝරාගෙන ඇත්තේ ගැළපෙනම අලියා සහ තරුණයා බව තහවුරු වීම ඔහුගේ සතුටට හේතු විය.

පිරිමි සතාගේ රාජකාරිය සාර්ථකව සිදුවන නිසා ගැහැනු සතකුද ඒ සමඟම සොයාගැනීමට මහාචාර්ය දංගොල්ල කටයුතු කළේය. ගැහැනු අලියාගේ යෝනි මාර්ගයට අත දමා බටයක් ඇතුල් කරගැනීමට හුරුකිරීමටත් ඔහු යොදගත්තේ ඉහත පිරිමි ළමයාමය. ඒ සඳහා අඩියක් පමණ උසැති සිමෙන්ති කණු හතරක් මතට ගැහැනු සතා නංවාගැනීම අවශ්‍ය විය. ක්‍රම ක්‍රමයෙන් ඈ ඊට හුරු වූවාය. සති දෙකක් පමණ ගත වූ විට කාර්ය අතිසාර්ථක මට්ටමක පැවතිණ. ඇයට පිරිමි ළමයා ඇස ගැටීම පමණක් වුවද ප්‍රමාණවත් විය. ඇතැම් අවස්ථාවල ඇත්ගොව්වාගේ අණ කිරීම පවා ඇයට අවශ්‍ය නොවීය. පිරිමි ළමයා දකිනවිටම ස්ව කැමැත්තෙන් දුවගෙන ගොස් කණු මතට ගොඩවී පිරිමි ළමයාට අවැසි දේට ඉඩ සැලසීමට ඈ ඉඩ දෙන ආකාරය මහාචාර්ය දංගොල්ලට සුපුරුදු දසුනක් විය.

රජනිකා ලියනගේ

පොලිසියේ බලපෑම නිසා බොරු කිව්වට මේ පුද්ගලයා මට ලිංගික අතවරයක් කළේ නෑ

දකුණේ ප්‍රාදේශීය දේශපාලනඥයෙකුට එරෙහිව ගිය ලිංගික අපචාර නඩුවේ ඇත්ත කතාව

"බබෙක් වෙන්න එපා."
"දන්නවද බොරු කිව්වොත් හිරේ යන්න වෙනවා."

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අබේවිට්ය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. නීතිය පිළිබඳව විවිධ කණ්ඩායම් දැනුවත් කිරීමටද හෙතෙම පසුබට නොවෙයි. තුදු අපරාධ විස්තරයකින් බම්බට ගොස් යම් නෛතික දැනුමක් පාඨකයාට ලබාදීමේ අරමුණින් ලියැවෙන මෙම ලිපියද ඔහුගේ මගපෙන්වීම, දැනුවත් කිරීම යටතේ සකස් වූවකි. මේ එවැනි ලිපි මාලාවක සයවැන්නයි.

පසුගිය කාලයේ බාලවයස්කාර දැරියකට ලිංගික අතවර කිරීමේ සිද්ධියක් සම්බන්ධව දකුණු පළාතේ ප්‍රාදේශීය දේශපාලනඥයෙකුට විරුද්ධව නඩුවක් විභාග වූ අතර මාධ්‍ය මඟින්ද විටින් විට එම සිදුවීම වාර්තා කළේය.

මෙම ප්‍රාදේශීය දේශපාලනඥයා, 14 හැවිරිදි දැරියක දූෂණය කළ බවට තිබූ චෝදනාවට වරදකරු වී මහාධිකරණයෙන් වසර 15ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම කරනු ලැබීය. නමුත් ඊට ටික කලකට පසු අභියාචනාධිකාරණය විසින් ඔහු නිදෙස්කොට නිදහස් කළේය.

එසේ වීමට හේතුව හරියටම පැහැදිලි කෙරුණේ, අභියාචනය විභාග කෙරෙද්දීය.

කිසියම් අපරාධයක් ගැන විමර්ශනය කිරීමේ මූලික පරමාර්ථය වන්නේ සත්‍යය හෙළිදරව් කරගැනීමයි. එනම් සැබෑ අපරාධකරු කවුරුන්දැ යන්න සොයාගැනීමයි. ඒ සඳහා පොලිසිය විසින් එක්රැස් කරන සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කෙරෙන්නේ සාක්ෂි ආඥා පනතේ විධිවිධාන අනුවයි.

නමුත් මෙහිදී පුදුමයට කරුණ නම් පොලිසිය විමර්ශන ආරම්භකොට තිබුණේ අදාළ දැරියගෙන් ප්‍රාදේශීය දේශපාලනඥයාට විරුද්ධව පැමිණිල්ලක් නොමැති අවස්ථාවක වීමය.

ඒ අනුව පොලිසියේ ඉහළ නිලධාරීන්ගෙන් ලද නියෝගයක් මත එම ප්‍රදේශයේ ජ්‍යේෂ්ඨ පොලිස් නිලධාරීන්යුක් ඇතුළු කණ්ඩායමක් දැරියව සොයාගොස් තිබිණි. ඉන්පසු ඇයගෙන් ප්‍රශ්න කළ පොලිසිය, දැරියගෙන් ප්‍රකාශයක්ද ලබාගත්තේය. අනතුරුව දැරිය ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යොමු කිරීමෙන් පසු එහිදී ඇය සිදුකළ ප්‍රකාශය වීඩියෝගත කර තිබිණි. එම වීඩියෝපටයේ ඇතුළත් ඇගේ ප්‍රකාශය පරිදි පෙනීගියේ ඉහත කී ප්‍රාදේශීය දේශපාලනඥයා ඇයට ලිංගික අතවරයක් සිදුකළ බවය. එමනිසා 2012දී නීතිපතිවරයා ඔහුට එරෙහිව නඩුවක් පැවරුවේය. නඩුව විභාග වන අතරතුර මේ සිදුවීමේ වින්දිතයා වූ 14 හැවිරිදි දැරිය සාක්ෂි ලබාදීමට අධිකරණයට පැමිණියාය. නමුත් සාක්ෂි කුඩුවට නැගීම පසු ඈ කළේ පෙර කී ප්‍රකාශයට වඩා හාත්පසින්ම වෙනස් එකකි. එනම් **"මේ විත්තිකරු මට මොකුත් කළේ නෑ. ඇත්තටම කියනවානම් කිසිම අතවරයක් වුණේ නෑ."**

සාක්ෂි කුඩුවට නැග දැරිය මෙලෙස ලබාදුන් සාක්ෂිය සුළුකොට තැකිය නොහැකිය. මක්නිසාද එසේ කළොත් එමඟින් පහර වදින්නේ නඩුවේ පදනමටයි. කිසියම් පුද්ගලයෙක් පොලිසියට ලබාදෙන ප්‍රකාශයක් කිසිම අවස්ථාවක අධිකරණය ඉදිරියේ සාක්ෂියක් වන්නේ නැත. එහෙත් පසුකලෙක උසාවි කුඩුවේ සිට සාක්ෂි ලබාදීමේදී දින වකවානු, ස්ථාන ආදී කාරණා අමතක වී තිබුණහොත් පොලිසියට කළ ප්‍රකාශයෙන් උපකාර ලබාගත හැකිය. අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාම එවැනි ප්‍රතිපාදන හඳුන්වා දී තිබේ. දරුවන් සම්බන්ධ කාරණාවලදී මෙම තත්ත්වය තවත් ලිහිල් කර ඇත. එනම් දරුවකු ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරියෙකුට හෝ කිසියම් වැඩිහිටියෙකුට ප්‍රකාශයක් කළ පසු, එය වීඩියෝගත කර ඇත්නම් නඩු විභාගයේදී එය ප්‍රවාරය කළ හැකිය. එවැනි අවස්ථාවක පැමිණිල්ලේ නීතිඥයා විසින් වින්දිත දරුවාගේ සාක්ෂිය මෙහෙයවන්නේ නැත. එහෙත් විත්තියේ නීතිඥයාට හරස් ප්‍රශ්න ඇසීමේ අයිතියක් පවතී.

දැරියගේ වීඩියෝ සාක්ෂිය අධිකරණයට ඉදිරිපත් කිරීමේදී ඇය කර තිබුණේ මෙවැනි ප්‍රකාශයකි.

"මගේ අම්මා වැඩ කරන්නේ මේ ප්‍රාදේශීය දේශපාලනඥයාට අයත් ෆැක්ටරියක. ඔහු මාව අරන් ගිහින් දූෂණය කළා."

එය ප්‍රවාරය කිරීමෙන් අනතුරුව පැමිණිල්ලේ නීතිඥයා දැරියගෙන් විමසුවේ වීඩියෝවේ සඳහන් කරන දේශපාලකයා ඒ මොහොතේ අධිකරණයේ පෙනී සිටින තැනැත්තාමද යන්නයි. එහිදී ඇය දුන්නේ වෙනස්ම පිළිතුරකි.

"මේ තැනැත්තාව මම දන්නවා. මගේ අම්මා වැඩ කරන්නෙ ඔහු ගාව. හැබැයි මොහු මට කිසිම කරදරයක් කළේ නෑ."

දැන් මේ සාක්ෂිය සහ වීඩියෝ සාක්ෂිය අහසට පොළොව මෙනි. කෙසේ වෙතත් නීතියේ ප්‍රතිපාදන අනුව සාක්ෂි කුඩුවේ සිට ලබාදෙන සාක්ෂිය සහ වීඩියෝ සාක්ෂිය අතර පරස්පරයක් පවතින විට නඩුව ඔප්පු කිරීමට වීඩියෝ සාක්ෂිය ප්‍රයෝජනයට ගත හැකිය. එහෙත් ඒ සඳහා ස්වාධීන සාක්ෂි මඟින් වීඩියෝ සාක්ෂිය තහවුරු කළ යුතුය. ස්වාධීන සාක්ෂි නම් ඇයව පරීක්ෂා කළ වෛද්‍යවරයා ලබාදෙන ප්‍රකාශය, ඇයව කිසියම් ස්ථානයකට රැගෙන ගියේනම් ඒ බව දකින කෙනෙකු දෙන සාක්ෂිය, අදාළ ස්ථානය පිළිබඳ දැරිය කරන විස්තරය, අතවරය වූ ස්ථානයෙන් ලබාගන්නා විවිධ සාම්පල (කෙස්, නිය, ශුක්‍රාණු වැනි) ආදියයි. කෙසේ වෙතත් එලෙස ස්වාධීන සාක්ෂි මඟින් වීඩියෝව තහවුරු කිරීමට හැකි වන්නේ අධිකරණයේ ලබාදෙන සාක්ෂියේ පරස්පරතා දින වකවානු, අනුපිළිවෙල ආදී දේවල්වලට අදාළ වනවිටයි. එහෙත් ඇය සාක්ෂි කුඩුවේ සිට පැවසුවේ තමා දූෂණයට ලක් නොවූ බවයි. එය පරස්පරතාවකට වඩා නඩුවේ සමස්ත හරයට බලපාන ප්‍රකාශයකි.

කෙසේ වෙතත් වීඩියෝ සාක්ෂිය මත නඩුව පවත්වාගෙන යාමට ඉඩ හිමි විය. එහෙත් එම චෝදනාව තහවුරු කිරීමට පැමිණිල්ල විසින් ස්වාධීන සාක්ෂි කිසිවක් නිවැරදි අයුරින් ඉදිරිපත් කර තිබුණේ නැත. පෙර හැසිරීම, පසු හැසිරීම සහ විද්‍යාත්මක සාක්ෂි කිසිවක් එහි තිබී නැත. දැරිය මෙම සිදුවීම ගැන අධිකරණ වෛද්‍ය නිලධාරියාට, පරීවාස නිලධාරියාට සහ මනෝ වෛද්‍යවරයකුට පවසා තිබිණ.

පැමිණිල්ල විසින් එම තැනැත්තන් සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කරන ලදි. ඔවුන් පැවසුවේ දැරිය මේ සිදුවීම වූ බව තමන්ට කියූ බවයි. එහෙත් නීතියට අනුව වින්දිතයා සිදුවීම සියදෙනෙකුට පැවසුවද ඒවා ස්වාධීන සාක්ෂි නොවේ.

වෛද්‍යවරයා කළ පරීක්ෂාවේදීද එවැනි අතවරයක් සිදුවූ බවට සාක්ෂි ලැබී නොතිබිණි.

කෙසේ නමුත් දැරිය සාක්ෂි කුඩුවේ සිට කළ ප්‍රකාශය නිසා ඇය වෙනුවෙන් පෙනී සිටි රජයේ අධිනීතිඥවරයාට තරමක් කේන්ති ගියේය.

"බබෙක් වෙන්න එපා."

"දන්නවද බොරු කිව්වොත් හිරේ යන්න වෙනවා."

ඔහු දැරියට තදින් කතා කළේය. එසේම නඩු වාර්තාවට අනුව ඔහු දැරියගෙන් පිටු 50ක පමණ හරස් ප්‍රශ්න අසා ඇත. පාර්ශවකරු විසින් තමන්ගේම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසනු ලබන්නේ නම් ඒ සඳහා සාක්ෂි ආඥා පනතේ 154 වගන්තිය අනුව විනිසුරුගෙන් පූර්ව අනුමැතියක් ලබාගත යුතුය. එහෙත් මෙහිදී පැමිණිල්ලේ නීතිඥයා සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න කර ඇත්තේ එවැනි අවසරයකින් තොරවය. විනිසුරුවරයාද ඒ මොහොතේ ඒ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් දක්වා නිබුණේ නැත. අවසානයේ වීඩියෝ සාක්ෂිය මත පමණක් පදනම්ව 2020 ජනවාරි මාසයේදී විත්තිකරු වරදකරු කිරීමට කොළඹ මහාධිකරණය පියවර ගත්තේය. වසර 15ක බරපතළ වැඩ සහිත සිර දඬුවමකට අමතරව රුපියල් 25,000ක දඩයක් සහ රුපියල් 250,000ක වන්දියක් ගෙවන ලෙසටද ඔහුට නියෝග කෙරිණ.

ඉන්පසුවයි මෙම තීන්දුවට එරෙහිව හෙතෙම අභියාචනාධිකරණය හමුවට ගියේ. එහිදී අභියාචක වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් වීඩියෝ සාක්ෂිය වෙනත් ස්වාධීන සාක්ෂි මඟින් තහවුරු නොකිරීම ආදී අඩුපාඩු රැසක් පෙන්වා දුන්හ. ඊට අමතරව ඔවුන් අභියාචනාධිකරණයට පෙන්වා දුන්නේ මෙම සිදුවීම පිටුපස අදිසි හස්තයක් ක්‍රියාත්මක වී ඇති බවයි. ඊට ප්‍රධානම සාධකය වූයේ 2019 ජූනි 12 වනද ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීරණය කෙරුණු SCFR NO. 677/2012 මූලික අයිතිවාසිකම් නඩුවයි.

ඉහත සිදුවීමට ආසන්න කාලයකදී වූ සිදුවීමක් මෙම මූලික අයිතිවාසිකම් නඩුවට හේතු වී තිබිණි. ඉහත සිදුවීමේ විමර්ශනය භාර වූ ඉහළ පොලිස් නිලධාරිනිය එම කාලයේදීම දකුණු පළාතේ තවත් දැරියකගේ නිවසකට කණ්ඩායමක් සමඟ කඩාවැදී තිබුණි. ඒ, අදළ දැරිය සාමාන්‍ය පෙළ විභාගය අවසන් කළ දිය. ඇය දැරියගෙන් විමසා තිබුණේ, ඉහත කී දේශපාලකයා ඇයට අතවර කළා දේද යන්නයි. එහෙත් දැරිය එවැන්නක් සිදුනොවූ බව කියා තිබුණි. පොලිස් නිලධාරිනියගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කෙරෙ නිසාවෙන් කේන්තිගත් පොලිසිය, දැරිය රැගෙන ගොස් රැයක් අනිතිකව සිර මැදිරියක රැඳවීමට ක්‍රියා කළේය. ඇය සමඟ යාමට ඉඩ දී තිබුණේ මිත්තණියට පමණි. කෑමබීම සපයා නැති අතර දෙමාපියන් හමුවීමටද අවස්ථාව දී නැත. අනතුරුව ඇයව දින 8ක් රෝහලක රඳවා තබා ඇත. එහිදී වෛද්‍යවරුන් සඳහන් කළේ ඇය දූෂණයකට ලක්ව නොමැති බවයි. පොලිස් ආරක්ෂාව යටතේ අඛණ්ඩව ඇය රෝහලේ රඳවාගෙන තිබුණේ එවැනි තත්ත්වයක් යටතේය. දින 8කට පසුද රෝහලෙන් පිටවීමට ඇයට ඉඩ ලැබුණේ දෙමාපියන් මානව හිමිකම් කොමිසමට කළ පැමිණිල්ලක ප්‍රතිඵලයක් ලෙසිනි. මේ සිදුවීම දැරියට මෙන්ම ඇගේ පවුලටද ගෙන ආවේ බරපතළ කම්පනයකි.

එබැවින් දැරිය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරුවාය. නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම, නිදහස අහිමි කිරීම, මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකර අසාධාරණ ලෙස රඳවා තබාගැනීම් සහ අවමින් සහගතව සැලකීමට ලක්කිරීමෙන් ආදී ලෙස දැරියගේ මූලික අයිතිවාසිකම් කඩ කළ බවට ඉහළ පොලිස් නිලධාරිනියට චෝදනා එල්ල විය. අදළ ප්‍රාදේශීය දේශපාලකයා තමන්ට අතවර කළ බව පිළිගන්නා ලෙස දැරියට කිහිපවතාවක් එම නිලධාරිනිය බලපෑම් කර තිබෙන බවද මූලික අයිතිවාසිකම් නඩු විභාගය අතරතුර හෙළිව තිබේ. දැරියට සලකා ඇත්තේ වින්දිතයකුට වඩා අපරාධකරුවකු ලෙසට බව අධිකරණය ප්‍රකාශ කළේය. එමෙන්ම නීතිය ක්‍රියාත්මක කරන ආයතන බලය අයුතු ලෙස භාවිත කිරීමේ සිදුවීම් ගැනද ශ්‍රේෂ්ඨාධිකරණය අවධානය යොමු කළේය. ඉන්පසු අදළ නිලධාරිනියට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළේ දැරියට රුපියල් ලක්ෂයක වන්දියක් ගෙවන ලෙසයි. එමෙන්ම දරුවන් සම්බන්ධ විමර්ශන කිරීමට අදළ මාර්ගෝපදේශ නොමැතිනම්, ඒවා සකස් කරන ලෙස පොලිස්පතිවරයාටද නියෝග කෙරිණ.

මේ නඩුව සම්බන්ධයෙන් මහාධිකරණ නඩු විභාගය අතරතුරද විත්තිය කරුණු දක්වා තිබිණ. එහෙත් එයට මහාධිකරණයේ අවධානය හිමි වී නැත. ඒ ගැනද අභියාචනාධිකරණයේ අවධානය යොමු විය. අභියාචක වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් පෙන්වා දුන්නේ, එකම කාල වකවානුවක මෙම සිදුවීම් දෙකම වූ ආකාරය මඟින් කිසිවකුගේ බලපෑමක් මත එය සිදුව ඇති බව පෙනී යන බවයි. ඉහත ඉදිරිපත් වූ කරුණු සියල්ල සලකා බලා අභියාචනාධිකරණය විත්තිකරු නිදෙස්කොට නිදහස් කිරීමට තීරණය කළේය.

දෙපාර්ශවයටම සවන් දීම යනු ස්වභාවික යුක්ති මූලධර්මයකි. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇත්තේ නීතිය ඉදිරියේ සියල්ලන් සමානයින් ලෙස සැලකිය යුතු බවයි. ඔවුන්ට නීතියේ ආරක්ෂාව ලබාදිය යුතු බවද දැක්වේ. සාධාරණ නඩු විභාගයක අත්තිවාරම වන විමර්ශනය සාධාරණ විය යුත්තේ එනිසාය. විමර්ශකයින් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීමට යොමු වුවහොත් යුක්තිය ඉටු කිරීමට ඉඩ නොලැබෙනු ඇත.

එමෙන්ම ඉහත සිදුවීම් සැලකූ විට පොලිසිය නීතිය අවභාවිත කරන අවස්ථා සේම නීතිය පිළිබඳ නිසි දැනුවත් වීමක් නැති බවද පෙනී යයි. නීතිය ක්‍රියාත්මක කිරීමේදී පුද්ගලයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමට නිලධාරීන් උනන්ද යුතුය. අනෙක් අතට අධිකාරණයට ඉදිරිපත් කරන සාක්ෂි තහවුරු කරන ආකාරය ගැන මූලික මට්ටමේ හෝ දැනුමක් ඒ සම්බන්ධව ක්‍රියා කරන නිලධාරීන්ට තිබිය යුතුය. මක්නිසාද යත්, නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවන බැවිනි. ඒ නොදැනුවත්කම නිසා වන අඩුලුහුඬුතා මත සැබෑම අපරාධකරුවකු වුව නීතියේ රැහැනින් ගැලවී යාමට ඉඩ තිබේ.

■ නීතිඥ රණිකා ලියනගේ

සමහර පිරිමි දාන මායම් එක්ක ගෑනුන්ට හැරෙන්නත් බෑ

පිං අතේ වැඩ කෙරෙන තැන්වල බැලුවොත් ඇත්නම් ගෑනුමනේ ඉන්නේ. විශේෂ හේතුවක්වත් තියෙනවද?

විශේෂ හේතුවක් නම් නෑ. හැබැයි බුද්ධ කාලෙත් එහෙමලු.

ඒ කියන්නේ බුදුන්ගෙන් බණ අහන්නත් වැඩිපුරම ගිහින් තියෙන්නෙ කාන්තාවොද?

එහෙම නෙමෙයි. ඒ කාලෙත් ගෑනු උදවිය බුද්ධ ශාසනෙත් එක්ක හරි එකතුයිලු. සමහරවිට තාමත් ඒ පුරුද්ද වෙන්නැති ඔය තියෙන්නෙ. හැබැයි ඔය ගෑනු උදවිය ශාසනෙත් එක්ක තිබුණු ඇඟෑලුම්කම වැඩි නිසා දවසක් ආනන්ද හාමුදුරුවන්ට ලොකු ප්‍රශ්නයක් මතු වුණාලු.

මොකක්ද?

බුදුන් නැති කාලෙක කොහොමද මේ උන්දැලත් එක්ක ගනුදෙනු කරන්නේ කියලා.

ඉතින්..?

ඉතින් බුදුහාමුදුරුවො විවේකීව වැඩ ඉන්න වෙලවක ආනන්ද හාමුදුරුවෝ ගිහින් ඇහුවලු 'ස්වාමීනි, ඔබවහන්සේ නැති දවසක අපි කාන්තාවන් කෙරෙහි පිළිපදින්න ඕන කොහොමද?' කියලා.

ඊටපස්සේ?

ඊටපස්සෙ බුදුහාමුදුරුවෝ උත්තර දුන්නලු 'ආදස්සනං ආනන්ද ආදස්සනං' කියලා.

ඒ කිව්වෙ?

ඒ කිව්වෙ, 'කාන්තාවෝ නම් ආනන්ද නොදැක ඉන්න තරමට හොඳයි' කියලා. ඊටපස්සේ ආනන්ද හාමුදුරුවෝ ඇහුවලු 'ස්වාමීනි බැරිවෙලාහරි දැක්කොත් මොකද කරන්නෙ' කියලා.

ඉතින්?

ඊටපස්සෙ කිව්වලු 'අනාලාපෝ ආනන්ද' කියලා. ඒ කියන්නේ 'දැක්කට කමක් නෑ ආනන්ද කතවට යන්න එපා' කියලා. ඊටපස්සෙ ආනන්ද හාමුදුරුවෝ ඇහුවලු 'ඒත් ස්වාමීනි ඒ අය අපිත් එක්ක කතාවට ආවොත් මොකද කරන්නෙ' කියලා.

ආනන්ද හාමුදුරුවොත් වැඩේ අතෑරලා නෑ ඒ කියන්නේ. ඉතින් ඒකට මොකද කියලා තියෙන්නේ?

එතකොට බුදුහාමුදුරුවො කිව්වලු 'එහෙම ආවොත් හොඳට සිහිය පිහිටුවාගෙන කතා කරන්න' කියලා.

කොහොමද එහෙම කරන්නෙ?

ආනන්ද හාමුදුරුවොත් ඔය විදියටම ඇහුවලු, 'ඒ කොහොමද ස්වාමීනි එහෙම කරන්නෙ' කියලා. එතකොට බුදුහාමුදුරුවො කිව්වලු 'ආනන්ද තමන්ට වඩා වැඩිමල් කෙනෙක් තමන් එක්ක කතාවට ආවොත් මේ කතා කරන්නේ මගෙ අම්මා එක්කයි කියලා සිහිය පිහිටුවාගන්න. කතාවට එන්නෙ සම වයසෙ කෙනෙක් නම් මේ කතා කරන්නෙ මගේ සහෝදරියක් එක්ක කියලා හිතන්න කියලා. බැරිවෙලාහරි තමන්ට වඩා වයසින් බාල කෙනෙක් කතාවට ආවොත්, මේ මගේ නංගි වගේ කෙනෙක්, දුව වගේ කෙනෙක් කියලා හිතලා සිහිය පිහිටුවගෙන කතා කරන්න' කිව්වලු. ඔය කතාව තියෙන්නෙ මාතුපුතු කියන සූත්‍රයේ. ඒ සූත්‍රය දේශනා කරලා තියෙන්නෙත් හේතුවක් ඇතුව.

මොකක්ද හේතුව?

බුදුහාමුදුරුවො වැඩ ඉන්න කාලෙම එකම පවුලෙ අම්මයි, පුතයි දෙන්නෙක් සැවැත්නුවර පැවිදි වෙලා හිටියලු. පස්සෙ වස්කාලෙ ආවම මේ දෙන්න වස් සමාදන් වෙලා තියෙන්නෙත් එකට. ඉතින් ඔහොම ඉන්නකොට මේ අම්මට හැමදෙම ඕනවුණාලු පුතාව දකින්න. පුතාටත් ඕනලු අම්මව දකින්න.

ඊටපස්සෙ?

පස්සෙ ඉතින් මේ දෙන්නා නිතර නිතර මුණගැහෙන්න ගත්තලු. තමන්ගෙ කියලා කාත් කවුරුත් නැති තැනක තමන්ගේ කියලා දැනෙන එක මනුස්සයෙක් හරි මුණගැහෙන එක මාර සහනයක්නේ.

ඉතින් මොකද වෙලා තියෙන්නේ?

ඉතින් මෙහෙම නිතර දකිද්දි මේ අම්මට ටිකෙන් ටික අමතක වුණාලු මේ ඉන්නේ මහා සංඝරත්නයේ ගුණ දරණ බුද්ධ ශ්‍රාවකයන්වහන්සේ නමක් කියලා. දෙවනුව මේ අම්මට අමතක වුණාලු මේ ඉන්නෙ මම කුසින් වදපු පුතා කියන එක.

අම්මට අමතක වුණා කියමුකෝ. ඒත් පුතාට මතක තියෙන්න ඇතිනේ?

ඒකනේ වැඩේ කියන්නෙ. අවාසනාවට පුතාටත් ඒ ටික අමතක වුණාලු. එකක් මේ ඉන්නෙ භික්ෂුණියක් කියන එක. අනිත් එක දස මාසයක් කුසේ දරාගෙන ලේ කිරි කරලා පොවපු අම්මනෙ මේ ඉන්නේ කියන එක.

ඊටපස්සේ මොකද වෙලා තියෙන්නෙ?

ඊටපස්සෙ ඉතින් මේ දෙන්නා අසත් ධර්මයේ හැසිරුණා කියලා තමයි කියන්නෙ. ඒ කාරණාව මුල්කරගෙන තමයිලු බුදුහාමුදුරුවො මේ සූත්‍රය දේශනා කරලා තියෙන්නෙ.

හැබැයි ඔය කතාව අහද්දි මට මෙහෙම හිතෙනවා.

මොකක්ද?

දැන් ඔය ප්‍රශ්නෙ ගිහින් බුදුහාමුදුරුවන්ගෙන් ඇහුවෙ ආනන්ද හාමුදුරුවොනේ. සමහරවිට රහත් භික්ෂුණියක් හෝ වෙනත් භික්ෂුණියක් ගිහින් ඔය කාරණාවෙම අනිත් පැත්ත බුදුහාමුදුරුවන්ගෙන් ඇහුවනම්?

ඒ කියන්නෙ ස්වාමීනි ඔබවහන්සේ පිරිනිවන් පෑවට පස්සෙ අපි පිරිමි කෙරෙහි පිළිපදින්න ඕන කොහොමද කියලා?

ඔව්.

ඒකටත් උත්තරයක් ඔය සූත්‍ර දේශනාව ඇතුළෙම තියෙනවා. බුදුහාමුදුරුවො කියනවා 'ආනන්ද කඩුවක් ගත්ත වධකයෙක් ඔබව මරන්න ඇවිත් ඉන්නවා කියලා හිතන්න. ඊළඟ මොහොතෙ ඔහු ඔබව මරනවා. ඒ වුණත් ඔබ ඔහුට හොඳින් කතා කරන්න. විෂඝෝර සර්පයෙක් ඇඟේ දවටගෙන හරි කමක් නෑ ඇසුරු කරන්න.

බුදුන් වැඩ ඉන්න කාලයක් වුණා නම් දැන් ඉන්න පිරිමි දැකලා මාතුපුතු සූත්‍රයේ අනිත් පැත්ත දේශනා කරන්නත් තිබුණා

වැඩිම වුණොත් ඌ දෂ්ට කරලා ආනන්ද ඔබ මැරෙයි. හැබැයි තනියම ඉන්න පුරුෂයෙක් කවදාවත් තනියම ඉන්න කාන්තාවක් එක්ක නම් කතාවට යන්න එපා කියනවා.

හේතුව විදියට මොකක්ද කියන්නෙ?

හේතුව තමයි තනියම ඉන්න පිරිමියෙක් තනියෙම ඉන්න ගෑනු කෙනෙක් එක්ක කතාවට ගියොත් තමන්ගෙ හිනාවෙන්, කතාවෙන්, බැල්මෙන් ඒ පිරිමියාව වසඟයට ගන්න ගෑනු කෙනෙකුට පුළුවන්ලු. අන්න ඒකයි බුදුහාමුදුරුවො කියන්නෙ සර්පයෙක් අතට අරන් හුරතල් කළත් තනියම ඉන්න ගෑනියෙක් එක්ක නම් කතාවට යන්නෙපා කියලා.

ඉතින් ඕකෙම අනිත් පැත්ත වෙන්න බැරිද?

මොකක්ද අනිත් පැත්ත?

මම නම් කියන්නෙ තනියම ඉන්න ගෑනියෙක්, තනියම ඉන්න පිරිමියෙක් නෙවෙයි කොයි පිරිමියත් එක්ක කතාවට ගියත් ගෑනුන්ට වෙන්න ඕකෙ අනිත් පැත්ත. මායම් දන්නෙ ගෑනු කිව්වට මොකද සමහර පිරිමි ගාව ගෑනු ළඟ තියනවට වඩා මායම් තියෙනවා.

ඒ කතාවෙ ඇත්තක් නැතුවම නෙවෙයි. ගෑනු පිරිමින්ව වසඟයට ගන්න හිනාව, කතාව පාවිච්චි කළාට, පිරිමි ගෑනුන්ව තමන්ගෙ වසඟෙට ගන්නෙ අනුකම්පාව ඇති කරලා. එක්කො වයිෆ් තමන් ගැන බලන්නේ නෑ කියයි. නැත්නම් ගර්ල් ෆ්‍රෙන්ඩ්ගෙ ප්‍රශ්න කියයි. මොකද පිරිමි දන්නවා ගෑනුන්ගෙ හිත් හරි ඉක්මනට උණු වෙනවා කියලා. ඒ දන්න හින්දම ඒකෙන් වාසි ගන්න පිරිමි දක්ෂයි.

මට මුහුණුපොතේ තිබුණු කවියක් මතක් වුණා.

මොකක්ද?

'රත්වුණු සැනින් තැටියේ පුච්චනා රොටී.. ඇත්තම කිව්වොතින් ඒ පිරිමින්ගේ හැටී..' ඕක ලියලා තිබුණේ ඩිල්ෂාන් පතිරත්න.

ඇත්තටම මේක අබුද්ධස්ස කාලෙ හින්ද හොඳයි. බුදුන් වැඩ ඉන්න කාලයක් වුණා නම් දැන් ඉන්න පිරිමි දැකලා මාතුපුතු සූත්‍රයේ අනිත් පැත්ත දේශනා කරන්නත් තිබුණා.

අනික බුදුහාමුදුරුවො ආනන්ද හාමුදුරුවොන්ට කිව්වෙ තනියම ඉන්න ගෑනු එක්ක කතාවට යන්න එපා කියලනේ. හැබැයි ඕක ගැහැනුන්ට අදාළ කරගත්තම මටනම් කියන්න තියෙන්නේ වෙන කතාවක්.

මොකක්ද?

ගෑනු කෙනෙක් ඇත්තටම තනියම ඉන්න පිරිමියෙක් එක්ක කතාවට ගියත් කමක් නෑ. මොකද ඒ මනුස්සයා තනිකඩයිනේ. හැබැයි පිරිමින්ට ඔය දුක මාකට් කිරීමේ හැකියාව තියෙනතාක් තනියම ඉන්න ගැනියෙක් කිසිම වෙලාවක කසාද බැඳපු පිරිමියෙක් එක්කනම් කතාවට යන්න නරකයි. ඒක අර බුදුහාමුදුරුවෝ කිව්වා වගේ සර්පයෙක් අතට අරන් හුරතල් කරනවට වඩා භයානකයි.

ඕන යකඩ යකෙක් මට්ටු කරන්න අපි දෙන්නම ඔට්ටුයි

අපි දෙන්නටම බැකෝ එළවන්නත් පුළුවන්

එකදස් නවසීයේ මුල වෙද්දිත් ඇමරිකාවේ ගෑනුන්ට ඡන්ද අයිතිය තිබුණේ නැහැ. ඒ විතරක්ද පිරිමින්ගෙ ගාණටම වැඩ ගත්තත් ඒ අයට ලැබුණේ සොච්චම් පඩියක්. මේ අසාධාරණේ ඉවසන්න බැරිම තැන නිව්යෝර්ක් නගරයේ කම්හල් සේවිකාවෝ පහළොස් දහකට වැඩි පිරිසක් 1909 පෙබරවාරි 28 වැනිදා උද්ඝෝෂණේකට පාරට බැස්සා. වැඩ කරන පැය ගාණ අඩු කරලා ඒකට සරිලන වැටුපක් එක්ක ඡන්ද අයිතිය ලබාදෙන්න කියන එකයි එදා ඔවුන්ගේ ඉල්ලීම වුණේ. එදා ගෑනු කරපු ඉතිහාසගත පෙරළිය වෙච්චි දවස ලෝකේ මුල්ම කාන්තා දිනය විදියට හඳුන්වනවා. හැබැයි 1975 මාර්තු 08 වැනිදා ලෝක කාන්තා දිනය විදියට නම් කළා.

ඒ කාලේ ඉඳලා ලෝකේ පුරා ගෑනුන්ට වෙන තරමක් වුණේ කෙනෙහිලිකම්නේ. ඉතින් කාන්තා දිනයක් වෙන්කළ පලියට පිරිමින්ට ලැබුණ වරප්‍රසාද ගෑනුන්ට ලැබුණේ නැහැ. ඉතින් ඒ වරප්‍රසාද දිනාගන්න ලෝකේ පුරා ඉන්න ගෑනු අරගල කළා. ඉල්ලීම් කළා. සංස්කෘතියට එපිටින් ගිහින් ජීවිත පූජා කළා. ඔය දේවල ප්‍රතිඵලයක් විදියට 1995 දී රටවල් 189ක් එකතුවෙලා කාන්තාවන් වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කළා. ලෝකේ ඕනම කාන්තාවකට අධ්‍යාපනය ලබන්නත්, තමන්ගේ අභිමතය අනුව ඕනෑම දේශපාලන මතයක් දරන්න වගේම තමන් කැමති පරිසරයක ජීවත්වීමේ අයිතියත් ඔය ගිවිසුමෙන් තහවුරු කෙරුණා.

ඒ අරගලවලින්, ගිවිසුම්වලින් යුරෝපයේ කාන්තාවන්ට සම්පූර්ණ ස්වාධීනත්වය ලැබුණත් ආසියාතික රටවල ජීවත්වෙන කාන්තාවෝ බහුතරයක් තවමත් ඉන්නේ පසුගාමී තැනක. හැබැයි ඉදිරියට ඒක වෙනස් වෙයි කියලා හිතෙන සාධක අපිට අද ඕනතරම් හම්බෙනවා. ලෝක කාන්තා දිනය දවසේදී මේ කියන්න යන්නෙ එහෙම කතාවකට උදාහරණයක්.

දිල්කි මදුෂිකා සහ තරුණි සත්සරණිව අපිට මුණගැහුනේ කටුබැද්ද ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේදී. ගෑනුන්ට උරුම සියුමැලි හීන විතරයි කියලා හිතන සමාජෙක යකඩ හීන එක්ක ඔට්ටු වෙන්න ඉගෙනගන්න මේ කෙල්ලෝ දෙන්නා විශේෂයි කියලයි අපිට හිතුණේ.

"පුංචි කාලේ ඉඳන් හීන දැක්කේ වෛද්‍යවරියක් වෙන්න. ඒත් සාමාන්‍ය පෙළ සමත්වෙලා උසස් පෙළට යද්දි ඉංජිනේරුවරියක් වෙන්න ආසා හිතුණා. පස්සේ මං උසස් පෙළට 'තාක්ෂණවේදය' කළා. හැබැයි උසස් පෙළට මම බලාපොරොත්තු වුණ තරම් ප්‍රතිඵල තිබුණේ නැහැ. පස්සේ මම කටුබැද්ද ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ පාඨමාලාවකට සම්බන්ධ වුණා."

කතාබහේ ආරම්භය ගත්තේ 24 හැවිරිදි දිල්කි මදුෂිකා. ඇය කුරුණෑගලත් අනුරාධපුරයත් අතරමැද තියෙන අඹන්පොල පැත්තේ තරුණියක්. මහව මහා විජයබා ජාතික පාසලෙන් ඉගෙනගත්තු දිල්කි ඇය හදුරණ පාඨමාලාව ගැන කිව්වේ මෙහෙම.

"යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව, නඩත්තුව හා වෑල්ඩුම් ශිල්පය වගේ දේ ගැන උගන්වන පාඨමාලාවක් තමයි මම කරන්නේ. ලංකාවෙන්ම මේ පාඨමාලාව තියෙන්නේ කටුබැද්ද ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ විතරයි. අපේ බැච් එකේ ළමයි 50ක් ඉන්නවා. ඒ අතරින් ගෑනු ළමයි දෙන්නෙක්ට ඉන්නේ අපි දෙන්නා විතරයි. ඉතින් පිරිමි කරන හැම වැඩක්ම අපිත් ඉගෙනගන්න ඕනේ. ඇත්තටම කෙල්ලෙක්ට ඒක ලේසි නැහැ. උදාහරණයක් විදියට බැකෝ එකක් ගත්තොත් අපට ඒක එළවන්න පවා ඉගෙනගන්න වෙනවා. මොකද අලුත්වැඩියාව කළාට පස්සේ වැඩේ හරියට වුණාද කියලා බලන්නත් එපැයි."

"විතකොට දැන් දිල්කිට බැකෝ එළවන්නත් පුළුවන්ද?" ඇඟපතින් පුංචි වුණත් ගතේ හයිහත්තියෙන් දිල්කි පුංචි නැති බව හිතන ගමන් මම ඇහුවා.

"මොකද බැරි? හොඳට පුළුවන්. අපේ ටෙක් එකේ බැකෝ එකක් තියෙනවා. ඒකෙන් තමයි පුරුදුවුණේ."

එහෙම කියපු දිල්කි දුරකතනයෙන් බැකෝ පදින වීඩියෝවක් පෙන්නුවා. ඒ වීඩියෝ එක පහුගිය ටිකේ සමාජ මාධ්‍යවල හුවමාරු වුණ බවත් ඇය කිව්වා.

"මේ පාඨමාලාව කරනවට ගෙදරින් කැමති වුණා. හැබැයි ඒකට මාව කොළඹට එවන්න අම්මලා කැමති වුණේ නෑ. ඉතින් ගෙදරින් අවසර ගන්න ලොකු මහන්සියක් ගත්තා. හැබැයි දැන්නම් මගේ ගැන එයාලත් ආඩම්බරයි. ඇත්තටම මේක තමයි මගේ ජීවිතේ මම ගත්තු හොඳම තීරණේ. මගේ අනාගතය දැන් පැහැදිලියි. දැනටමත් විවිධ ආයතනවලින් මාව ඒ අයගේ ආයතනවලට සම්බන්ධ කරගන්න අහනවා. මේ අවුරුද්දෙන් පස්සේ මට මේ ක්ෂේත්‍රයෙන්ම හොඳ වැටුපකට රැකියාවක් කරන්න පුළුවන්."

දිල්කිත් එක්ක පාඨමාලා කරන අනෙක් තරුණිය 23 හැවිරිදි තරුෂි සත්සරණි. ඇය ගාල්ල බද්දේගම. පොඩි කාලේ ලෝයර් නෝනා කෙනෙක් වෙන්න හීනයක් තිබුණත් උසස් පෙළ කරද්දි ඒ හීනේ වෙනස් වුණාලු.

"මම ඉගෙනගත්තේ ගාල්ල ශාන්ත අන්තෝනි මහා විද්‍යාලයෙන්. ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, අයියයි, නංගියි. තාත්තා කරන්නේ වෑල්ඩින් වැඩ. ඉතින් අයියව මේ ක්ෂේත්‍රයට යොමුකරන්න තාත්තට ලොකු ආසාවක් තිබ්බා. ඒත් අයියා කැමති වුණේ නෑ. තාත්තගේ ආශාව ඉෂ්ට කරන්න මම මේ පැත්තට යොමු වුණා. අනික මාත් මේ පැත්තට කැමතියි. මම මෙහෙම පාඨමාලාවක් කරන්න යනවා කියලා දැනගත්තම 'ගෑනු ළමයෙක්ට ඔය වැඩ හරියන්නෙ නෑ' කියලා සමහරු කිව්වා. පස්සේ මං ඉස්කෝලේ ගුරුවරුන්ගෙන් ඇහුවා. මේ ක්ෂේත්‍රයට වැඩිය ගෑනු ළමයි නොවන නිසා ඉදිරියට යන්න හොඳ අවස්ථාවක් තියෙනවා කියලයි එයාලා කිව්වේ."

උසස් පෙළට ඉංජිනේරු තාක්ෂණවේදය කරපු තරුෂිගේ ඉදිරි බලාපොරොත්තුව මේ ක්ෂේත්‍රයෙන්ම ඉදිරියට ගිහින් ඉංජිනේරුවෙක් වෙන එකලු. හැබැයි කාන්තා නියෝජනය අඩු පිරිමි වැඩි ක්ෂේත්‍රයක වැඩ කිරීම තරුණියක් විදියට ලොකු අභියෝගයක් කියලයි ඇය කිව්වේ.

"ඇත්තටම මේක අභියෝගයක්. මොකද අපිට හැප්පෙන්න තියෙන්නේ යකඩ එක්ක. බොරු කියන්න ඕන නෑ මුල් කාලේ එපාවුණු වෙලාවලුත් තිබුණා. හැබැයි මේ පාර තෝරගත්තු එක ගැන දැන් නම් ආඩම්බරයි. මගේ දෙමව්පියෝ, මගේ ගුරුවරු, මගේ බැච් එකේ යාළුවෝ මේ වෙලාවේ මතක් කරන්නම ඕනේ. ඒ අයගේ උදව් මට ලොකු ශක්තියක්."

කතාබහ අවසානයේ සාම්ප්‍රදායක රැකියා රාමුවෙන් එළියට ගිය තරුණියක් විදියට 'ධරණී' කියවන ලංකාවේ තරුණියන් වෙනුවෙන් මෙහෙම කතාවක් කියන්නත් ඇය අමතක කළේ නෑ.

"මේ වගේ ක්ෂේත්‍රවලට එන්න කැමැති ගොඩාක් ගෑනු ළමයි ඉන්නවා. සමාජයෙන් ඇහෙන කතා නිසා ඒ අයගේ හිත්වල චකිතයක් තියෙනවා. ඒ අයට මං කියන්නේ බය නැතුව මේ ක්ෂේත්‍රයට එන්න. එහෙම එන ඕන කෙනෙක්ට තමන්ගේ අනාගතය හදාගන්න පුළුවන්. ගැහැනු රස්සා පිරිමි කරන රස්සා කියලා නෑ. හිතේ හයිය තියෙනවා නම් ගෑනු අපිට ඕනම දෙයක්

■ රුවන් එස්.සෙනවිරත්න

ඡායාරූප - ප්‍රදීප් දඹරගේ
පසුතලය - ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, කටුබැද්ද

අවසරයි

බියංකා නානායක්කාර ලියයි

111 කොටස

හිතට ළඟ අය ප්‍රශ්න ඇති කරනකොට ජීවිතේ ප්ලෑන් අවුල්වෙනවා...

ඔහු දුරකතන ඇමතුමක සිටිනු දුටු නිසා අංජනා ඇල්ලේපොල හිත දෙගිඩියාව නැතිකර ගන්නට හිතට ආ දෙය නාහාම ඔහුට ළං වුණාය. ඇඳට ආසන්න වූ අංජනා ඇල්ලේපොලගේ දකුණතින් තේනුක අල්ලාගත්තේ හිතාමතාමය. අම්මාගේ ප්‍රශ්න කිරීම් ඉදිරියේ ඈ කොතරම් අපහසුතාවයට පත්වන්නට ඇත්දැයි මොහොතකට පෙර ඔහු සිත ඇතිවූ සිතිවිල්ල ඔහු සිත පතුලේ තිබුණි.

ඈ දකිත්ම එය ප්‍රේමනීය සිතුවිල්ලක් වී හිත උඩට ආවේය.

"අපේ අම්මා කෝ නංගී..?"

ඈ පිළිබඳ හිතේ වූ අමනාපයන් පසෙක තබමින් තේනුක ඇසුවේය.

"නැන්දම්මා ඉන්නවා. එයාගෙ ෆෝන් එකට ගන්න බැරිද..?"

ඔහු කතා කළාට හිත යටින් සංතෝෂවෙමින් චතුමිණී රාජපක්ෂ කීවාය.

"ඒක ගන්නෙ නැති හින්දෑ තමා අහන්නේ... අම්මට මොකද වෙලා තියෙන්නේ..? තමුන් අම්මත් එක්ක මොනව හරි කිව්වද?"

හිටිහැටියේ වූ සෙනෙහෙලතා මැණිකේගේ වෙනසට එකම සැකය සේ තේනුකගේ ඔලුවේ කැරකුණේ එයයි.

"අනික කවුද ඔය ඇවිත් ඉන්නේ.. මගේ කෝල් එකට කතා නොකරන්න තරම්..?"

"මං කිව්වේ මේනක අයියාගෙ යාළුවෝ කියලා. අනික අයියා මං නැන්දම්මාට මොනා කියන්නද... කියනවනම් ඒ දවස්වලම කියලා ඔයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් ගැන. අනික ඕකට මාත් එක්ක චිල්ලිලා හරියන්නෙ නෑ. නැන්දම්මටම කතා කරලා අහගන්නකෝ..."

"එයා මාත් එක්ක ගානට කතා කරන එක තමයි ප්‍රශ්නෙ... මා එක්ක කොච්චර කතා කරපු අම්මද."

මැණිකේගේද කටහඬ ඇසෙද්දීය. දුරකතනය එහෙමම ඇඳට අතහැරි තේනුක තෙන්නකෝන්ගේ හිතට අසරණබවක් දැනුණි. ඒ හැඟීම මුහුණින් පන්නා සිනාසෙන්නට හදමින් ඔහු අංජනාගේ මුහුණ දෙස බැලීය.

"ප්‍රශ්නයක්ද?"

ඔහු ඉන්නේ ප්‍රශ්නයක බැව් දැනුණොත් ඇය ඇසුවේ ඒ හිස මත අතක් තබමිනි.

"ප්‍රශ්න නැති ජීවිතයක් නෑ. ඒත් හිතට හුඟක්ම ළඟ අය ප්‍රශ්න ඇති කරනකොට ජීවිතේ ප්ලෑන් අවුල්වෙනවා. ඒතකොට තමයි ඒ ප්ලෑන් පැත්තකට දාලා වෙන ප්ලෑන් හදන්න වෙන්නේ.."

ඔහු කීවේ බොහෝ සිතුවිලි හිතට එද්දීය.

"ප්‍රශ්නෙ අම්මා එක්ක නේද? ඒ මං හින්දෑ නම් ඒ ගොල්ලො නැති කරගන්න එපා... ඔයා කියලා තියෙන ඒවයින්ම මට දැනෙන විදියට ඔයාගෙයි අම්මගෙයි තියෙන්නේ ලොකු බැඳීමක්නෙ... ඒ හින්දෑ එකට අම්මා, දෙකට මං තියාගන්න..."

හදවතට එවැන්නක් හිතීමත් අමාරුවෙද්දී වුව අංජනා ඇල්ලේපොල තේනුකට කීවේ ඇත්තටමය. ගැහැනියක ජීවිතයට කොහොම හොයාගන්නට පුළුවන් වුවත් අම්මෙකු හමුවන්නේ ජීවිත කාලයටම එක්කෙනෙකි. තේනුකට අංජනාගේ ඒ නීරස කතාව නවතන්නට ඕනෑ විය. ඔහු දෑත ඈ පසට විහිදූ ඇගේ ඉඟ වටා පටලවා ගනිද්දී අංජනාට කාමරයේ දෙර දෙස බැලුණේය. තේනුක තෙන්නකෝන්ගේ ඇමතුම විසන්ධි වෙත්ම චතුමිණී සමන්තිනීට ඇමතුමක් ගත්තාය. සෙනෙහෙලතා මැණිකේගේ හා තේනුකගේ අමනාපය චතුමිණීගේ හිතේ සතුට උතුරා යන්නට කාරණාවකි. තේනුක තෙන්නකෝන් ප්‍රතික්ෂේප කරන්නට කරන්නට චතුමිණීට උවමනා වූයේ කෙසේ හෝ ඔහුගේ ආදරය දිනාගන්නටයි.

"මෙදා පූජාව නම් හොඳට වැඩ කරලා වගේ..."

සමන්තිනීගේ කටහඬ ඇසෙත්ම චතුමිණී කීවේ සතුටු හඬින්මය.

"ඒ තරම් ඉක්මනට!"

සමන්තිනී රාජපක්ෂ පුදුම වෙමින් ඇසුවාය.

"ඔව් අම්මා... දැන් අම්මලා පුතාලා විරසකයි වගේ... මේ දැන් තේනුක මගේ ෆෝන් එකට කතා කරලා කිව්වෙ ඒක... දන්නවද, ඒකට සැක කරන්නෙ මාව. මං නැන්දම්මට මොනවද කිව්වෙ කියලා අහනවා..."

චතුමිණී සිනාසුණත් ඒ කතාවට සමන්තිනීගේ හිත බය වුණේය. ඒ හැමදෙයක්ම කළ හැකි වන්නේ ඒ නිවසේ සිටියොත් පමණි. ඔය සැකය සෙනෙහෙලතා මැණිකේට පැමිණ ඒ නිවසින් පිටමං වන්නට වුවොත් සියල්ල අවසන්ය. ඊට පෙර ගුරු දේව කිවූ ලෙස මතුරවා ගත් රන්පත ඔහුට පළන්දන්නට හැකි නම් සියල්ල හරිය. එය ටක්කෙටම ඇන්නා සේ හරියන ගුරුකමක් බව එතැනට පැමිණ සිටි කීපදෙනෙක්ද කියනු ඇය අසාගෙනය.

"මොකද දුව කියන්නේ..?"

ඇයට කතා කළේ චතුමිණී බව දැනගෙනම නිශ්ශංක බිරිඳගෙන් ඇසුවේය. සමන්තිනී සැක සිතින් ඔහු දෙස බැලුවේ ඊට දෙන්නට උත්තරයක් ඇහිදින ගමන්ය.

"කතා කරපුවා නම් ඇහුනෙ නෑ. ඒත් ඔයා කතා කළේ දුවත් එක්ක කියලා මං දන්නවා..."

ඇගේ හිත දැනගත්තා සේ ඔහු කීවෙන් සමන්තිනීගේ හිතට සැහැල්ලුවක් දැනුණි.

"මේ ළමයා එක්කෝ රටම හිටියනම් හොඳයි කියලා මට හිතෙනවා. ලංකාවට ආවා කියලා ඇති වැඩක් තියෙනවද? ගෙදරත් නෑ. ඊටත් වැඩක් ඇති දේකටද ඔය කොළඹ නටන්නේ?"

දියණිය කරන වැඩවලට තමන් සහයෝගය නොදෙන වග පෙන්වන්නට ඇය කීවාය.

"ඔය තව ටික දවසනෙ."

නිශ්ශංකගේ වචන කීපය ඇගේ හිත සෙලෙව්වේය. ඔහු මොකක් කරන්නට හිත තබාගෙන ඉන්නවාද කියා ඇයටත් හිතාගන්නට බැරිය.

"ඇයි ඔයා එහෙම කිව්වේ?"

පොඩි හරි ඉඟියක් දැනගන්නට සමන්තිනීට අවැසි වූවාය.

"ඊටපස්සෙ එයා වැඩ කරන්න ඕනි මං කියන විදියට. මං එයාට හිතෙන් කාලයක් දීලා තියෙනවා මැණිකේ... ඒ කාලෙදි එයා ඔය සියල්ල අවසන් කරන්න ඕනෑ..."

නිශ්ශංක කීවේ ස්ථිරවය.

"එයා මේ කාලේ හොඳ විදියට ජීවිතේ පොත ලියාගත්තොත් ඒ පොතේම පිටු පෙරළගන්න එයාට පුළුවන් මැණිකේ. නැත්තම් මං එයාගෙ ජීවිතේ පොත එතැන ඉඳලා පෙරළන විදිය ලියනවා..."

නිශ්ශංක රාජපක්ෂගේ වචන සමන්තිනීගේ හිතේ තිගැස්මක් ඇතිකළේ හේතු කාරණා කීපයක්ම නිසාය.

ලබන සතියට

"ආ ඒවා මං දන්නෙ නෑ."

ඇය කීවේ හිත යටින් සිනාවෙමිනි. සෙනෙහෙලතා මැණිකේ හා තේනුක අතරේ අමනාපයක් ඇතිව ඇති වග චතුමිණී රාජපක්ෂට අලුත් ආරංචියකි. ඊයේ සමන්තිනී ආයෙමත් ජ්‍යෝතිෂවේදියාගේ ගෙදර ගිය බව චතුමිණීට කීවේ උදේය. එහිදී මොකද්දෝ යාතිකාවක් කර පොල් ගෙඩියක්ද ගැසූ බව ඇය කීවාය.

"ළඟ ළඟම සුබ පෙරනිමිත්තක් පෙන්නයි කිව්වා. ඊටපස්සෙ ඉතින් ඔයා අතේ තමා ඉතුරු වැඩ තියෙන්නේ..."

සමන්තිනී රාජපක්ෂගේ ඒ වචන ටිකට සතුටුවෙමින් සිටි චතුමිණීට මේ සිද්ධවෙන දේවල් අගනේය කියා සිතුණි. මේ වැඩ කරන්නේ ඒ යාතිකාවේ ප්‍රතිඵල කියාද ඇයට සිතුණි.

"නැන්දම්මට ෆෝන් එක දෙන්නද අයියා..?"

ඇය ඇසුවේ ආදරණීයවය.

"ඔයා ඔහොම ලයින් එකේ ඉන්නකෝ..."

ඇය සෙනෙහෙලතා මැණිකේ ළඟට යන්නට සැරසෙමින් කීවාය.

"එපා. එපා. එයාට මට කතා කරන්න බැරිනම් ඔයාට කතා කරලා එයාට කතා කරන්න ඕනි නෑ..."

ඔහු ඇමතුම විසන්ධි කළේ පිරිසේ හඬවල් අතරින් සෙනෙහෙලතා මැණිකේගේ "අපි ඉක්මනට අර සුරේ වැඩෙත් කරගමු. හැබැයි ඉතින් ඕක ඒ දරුවගෙ කරට දැන්නෙ කොහොමද? කොහොම හරි නැන්දම්මා ලව්වා තමා ඒක කරගන්න පුළුවන් වෙන්නේ."

"අම්මා ඒක හදවන්නකෝ... අපි දැමු කොහොමහරි. ආ එයාගේ උපන්දිනේ ළඟයි කියලා නැන්දම්මා කිව්වා. අම්මා ඒ සුරේ අපි ලස්සන හතරැස් ලොකට් එකක් ඇතුළට දලා ලොකට් එකේ එක පැත්තකට නැන්දම්මගෙයි අනිත් පැත්තට තේනුකගෙයි ෆොටෝ දම්මමු. සල්ලි ටිකක් වැඩිපුර යයි. ඒත් මට ඕනි කොහොම හරි මේ වැඩේ ඉවර කරන්න..."

සමන්තිනී සිනාසුණාය. තාමත් ඇයගේ සිතුවිලි පොඩි කාලයේ වගේය. පොඩි කාලෙත් මොකක් හෝ ඕනෑ නම් ඇය පස්ස බලන්නේ එය දිනාගෙනය. අම්මාට උපදෙස් දුන් චතුමිණී ඇමතුම අවසන් කරද්දී නිශ්ශංක රාජපක්ෂ සමන්තිනී අසලට ආවේය .

මෙදා පූජාව නම් හොඳට වැඩ කරලා වගේ...

පොල් කඩනවට අමතරව මම දැන් තැඹිලිත් බානවා

නිකී ඇන්ට්‍රම් යනු පීම් නම් ආබාධිත දරුවෙකු සමඟ තනිවුණු ඔස්ට්‍රේලියානු ජාතික මවකි. ඇය මව් පදවිය ලැබුවේ වයස අවුරුදු 17දීය. දරුවා බිහිකර දෙතුන් මාසයක් ගතවෙද්දී එක්වරම පීම්ගේ ඇස් අන්ධ විය. ප්‍රතිකාර සොයා නිකී රෝහලක් රෝහලක් ගානේ ඇවිද ගියද පීම්ගේ පෙනීම නැවත ලබාදෙන්නට ඇයට හැකිවුණේ නැත. ඔය අතරම දරුවාට අපස්මාර රෝගයද වැළඳුනි. එහි ප්‍රතිඵලය ලෙස පුංචි පීම් ඇවිදගැනීමට බැරි ආබාධිත දරුවෙක් බවට පත්විය.

දරුවෙකුගේ පුංචි සීරීමක් වුවද අම්මෙකුට එය මහා හිසරදයකි. ඒ අම්මලාගේ හැටිය. පීම්ගේ අසනීප තත්ත්වය නිසා නිකීගේ හිතත් හොඳටම පෑරී තිබිණි. එලෙස පෑරුණු හිත සනසාගැනීමේ අටියෙන් ඇය දරුවා ඉදිරියේ පොරොන්දුවක් වූවාය. එනම් කොතරම් දුෂ්කරතා මැද වුවද ඔහු සතුටින් තැබීමට කටයුතු කරන බවයි. අනතුරුව පීම්ව පිටේ රුවාගෙන රට වටේ ඇවිදිමින් ඈ ඒ පොරොන්දුව ඉටු කළාය.

"ඔව් මට මහන්සියි. ඒත් මං මගේ දරුවා වෙනුවෙන් පුළුවන් කාලයක් මෙහෙම කරනවා. අම්මෙකුට දරුවෝ වෙනුවෙන් කරන්න බැරිදෙයක් නෑ."

ඇය පවසන්නේ කුසින් වැදූ දරුවකුගේ බර කිසිදිනෙකවත් අම්මෙකුට බරක් නොවෙනා බවයි. ඒ බව සනාථ කළ තවත් මවක පිළිබඳව කතාවක් පසුගියදු අපට දැනගන්නට ලැබුණි. ඒ අම්බලන්තොට, නෝනාගම ප්‍රදේශයෙනි. රෝහිණී මල්ලිකා නම් වන මේ මවට වයස අවුරුදු 28කි. දරු දෙදෙනෙකි.

පෙදරේරු රැකියාවේ නිරත වූ ඇගේ සැමියා ඉදිකරමින් තිබූ ගොඩනැගිල්ලක ඉහළ මාලයෙන් ඇද වැටී මීට අවුරුදු දහයකට ඉහතදී මියගොසින්ය. දිවි තොර කරගන්නට තරම් හිත වේදනා තිබියදීත් දරුවන් දෙදෙනා සමඟ දිවි ගැටගහ ගන්නට රෝහිණී සැමවිටම උත්සාහ කළාය. දසඅතේ රැකියා සෙව්වද අකුරු නූගත් ඇයට රැකියාවක් දෙන්නට කිසිවෙකුගේත් හිත් උණුවුණේ නැත.

"මං ඉගෙනගත්ත කෙනෙක් නෙවෙයි. ඒ හින්ද ඉතින් අකුරු ලියන්න කියන්න එහෙම

බෑ. එහෙම කෙනෙක් වැඩට ගන්න කවුරු වුණත් කැමති නෑනේ. ඉතින් දරුවන්ගේ අනාගතේ ගැන හිතලා මං තීරණය කළා කාටවත් බරක් නොවී මට පුළුවන් විදියේ රස්සාවක් කරන්න."

ඇගේ තෝරාගැනීම වූයේ පොල් කඩන රස්සාවය. පිරිමින්ට සින්නක්කරව ලියාදී නොතිබුණද මෙතෙක්කල් පොල් කඩන රස්සාව කළේ පිරිමිය. ඒ නිසා රෝහිණීට මුලදී වැඩ ලැබුණේ නැත. ඒ ගමේ උදවියගේ ගස්වල කඩන්නට පොල් නොතිබූ නිසාම නොවේ. ගැහැනියක් පොල් ගසකට නංවා එක හිතකින් ඒ දෙස බලා ඉන්නට තිබූ නොහැකියාවද ඊට හේතු වූවා විය හැකිය. නමුත් පුරුදුකාරියක මෙන් රෝහිණී ඇගේ වත්තේ ගස්වලට නැග පොල් කඩා විකුණන්නට පටන්ගත් නිසාවෙන් ගම්මුන්ගේ බිය සැක සංකා තුරන් වී ගියේය.

"ගමේ ගොඩේ හැදුනු වැඩුනු නිසා පොඩි කාලේ ඉඳලා මට පුවක් ගස්, පොල් ගස්වලට බඩගාලා පුරුදුයි. ඒ හින්ද ආයෙත් පුරුදුවෙන්න දෙයක් තිබුණේ නෑ. දැන් මම පොල් කඩනවට අමතරව තැඹිලි බාන එකත් කරනවා. දැන් මං මේ රස්සාව කරන්න අරන් අවුරුදු කීපයක් වෙනවා. මමයි දරුවෝ දෙන්නයි කාලා ඇඳලා ඉන්නේ මේ රස්සාව නිසා. ඒ විතරක් නෙවෙයි මගේ නංගිට ටිකක් අසනීපයි. ඉතින් එයයි එයාගේ දරුවා ගැනයි බලන්නෙත් මං තමයි."

දරුවන් අතේ, කරේ එල්ලාගෙන, දහසකුත් එකක් නැතිබැරිකම් කියාගෙන සිඟමන් යදින මව්වරුන් බහුල යුගයක රෝහිණී වැන්නවුන් පසසන්නට අප දන්නා වචන ප්‍රමාණවත් නැත. මතු යම් දිනෙක බුදුබව ලබනු ඇතැයි කියන්නේද නිසැකවම එහෙම අම්මලා විය යුතුය.

■ රුවන් එස්.සෙනවිරත්න

චිකන් රසට කැමති ඔබට

චිකන් සොසේජස්

අවශ්‍ය ද්‍රව්‍ය

- කටු නැති කුකුල් මස් ග්‍රෑම් 300
- මිරිස් කුඩු මේස හැඳි 1
- ගම්මිරිස් කුඩු මේස හැඳි 2
- පාන්පිටි ස්වල්පයක්
- ලුණු රස අනුව
- ඇලුමිනියම් ෆොයිල් කොළ 1
(තවද තමන් කැමති ඕනෑම තුනපහ වර්ගයක් මෙයට එක්කරගත හැකිය.)

සාදන ක්‍රමය

- කුකුල්මස් සෝදා ඊට මිරිස් කුඩු, ගම්මිරිස්, පාන්පිටි හා ලුණු කුඩු එක්කර හොඳින් බ්ලෙන්ඩ් කරගන්න. (මෙයට පාන්පිටි ස්වල්පයක් එක්කරන්නේ ඉහත මිශ්‍රණය ලිහියාම වැළැක්වීමටයි.)
- දැන් එම මිශ්‍රණය සොසේජස් හැඩයට අතින් රෝල් කරගන්න.
- මෙසේ සකසාගත් සොසේජස්, ෆොයිල් කොළ කැබලි ගෙන එහි දවටාගන්න. (ෆොයිල් කොළ දෙපස ටොෆි හැඩයට නවාගන්න.)
- දැන් බඳුනකට වතුර එක්කර එය උතුරද්දී මෙම සොසේජස් දමා විනාඩි 30ක පමණ කාලයක් හොඳින් තම්බාගන්න.
- පසුව එය නිවෙන්නට තබා ෆොයිල් කොළයෙන් ඉවත් කොට තෙලේ බැදගන්න.
- මෙය ඉතා රසවත් අතර අඩු වියදමින් ගෙදරදිම හදු රස බලන්නට හැකි ආහාරයකි.

කේරල ක්‍රමයට කුකුල්මස් වැංජනයක්

අවශ්‍ය ද්‍රව්‍ය

- කුකුල් මස් ග්‍රෑම් 500
- කොත්තමල්ලි කුඩු තේ හැඳි 1
- මිරිස් කුඩු තේ හැඳි 1
- ගරම් මසාලා තේ හැඳි 2
(කොත්තමල්ලි, ගම්මිරිස්, සූදුරු, මාදුරු, කුරුඳු, කරාබුනැටි, එනසාල් එක්කර සාදාගන්නා තුනපහ විශේෂයක් වන අතර ඉන්දීය ආහාර සැකසීමේදී යොදාගනී.)
- කහකුඩු තේ හැඳි 1/2
- සූදුරු තේ හැඳි 1/2
- බී ලූනු ගෙඩි 1
- සුදුලූනු බික් 6/7
- පොල්කිරි කෝප්ප 1
- අමුමිරිස් කරල් 2
- පොල්තෙල් ස්වල්පයක්
- රම්පේ, කරපිංචා
- ලුණු, ගම්මිරිස් අවශ්‍ය පමණට

සාදන ක්‍රමය

- භාජනයක් ලිප තබා ඊට තෙල් එක්කර, සිහින්ව කපාගත් ලූනු, සුදුලූනු, ලුණු එක්කර තෙම්පරාදු කරගන්න.
- ඉන්පසු ගරම් මසාලා හා කොත්තමල්ලි හැර අනෙකුත් කුළුබඩු වර්ග ඊට එක්කරන්න.
- එය හොඳින් කලවම් කර සෝදා කපාගත් කුකුල් මස් කැබලි ඊට එක්කර හොඳින් තෙම්පරාදු කරගන්න.
- දැන් ඊට ගරම් මසාලාද එක්කර කලවම් කරගන්න.
- අනතුරුව එයට පොල්කිරි කෝප්පය එක්කර විනාඩි පහක් පමණ වැඩි ගින්දරේ පිසගන්න.
- දැන් ලිපේ ගින්දර අඩු කර තවත් විනාඩි පහළොවක් පමණ පිසගන්න.
- වැංජනය ලිපෙන් බෑමට ආසන්නයේ කොත්තමල්ලි කුඩුද එක්කරගන්න.

චිකන් චාසිව්

අවශ්‍ය ද්‍රව්‍ය

- කටු නැති කුකුල් මස් ග්‍රෑම් 300ක පමණ කැබැල්ලක්
- සෝයා සෝස් මේස හැඳි 1
- ඔයිස්ටර් සෝස් මේස හැඳි 2
- මී පැණි හෝ පැණි මේස හැඳි 4
- බ්ලෙන්ඩ් කරගත් ඉඟුරු, සුදුලූනු පේස්ට් මේස හැඳි 2
- ගම්මිරිස් තේ හැඳි 1
- සීනි මේස හැඳි 1
- රතුපාට කලර්න් ස්වල්පයක්
- ලුණු අවශ්‍ය පමණට
- ෆොයිල් කොළ කැබැල්ලක්

සාදන ක්‍රමය

- බඳුනක් ගෙන ඊට සෝස් වර්ග, ඉඟුරු සුදුලූනු පේස්ට්, ලුණු, පැණි හා ගම්මිරිස්, සීනි, කලර්න් එක්කරගන්න.
- දැන් එය හොඳින් කලවම්කොට, සෝදා කටු ඉවත්කළ කුකුල් මස් කැබැල්ල මිශ්‍රණයේ ගිල්වා හොඳින් පදම් කරගන්න.
- එසේ පදම් කළ මස් කැබැල්ල පැය දෙළහක් පමණ ශීතකරණයේ තිබෙන්නට හරින්න.
- දැන් පදම් කරගත් මස් කැබැල්ල ෆොයිල් කොළයක් දැමූ බේකිං තැටියක දමා සෙන්ටිග්‍රේඩ් අංශක 200ක උෂ්ණත්වයෙන් විනාඩි 15ක් රෝස්ට් කරගන්න.
- අනතුරුව චිකන් පදම් කරගැනීමට ගත් මිශ්‍රණයේ ද්‍රාවණය රත්කර රෝස්ට් කරගත් චිකන් කැබැල්ල මතට එක්කරන්න.
- මෙය චීන ජාතිකයින් ඉතාම ප්‍රිය කෑමක් වන අතර, පැණි රසට කැමති ඔබටද මෙය විශේෂ වූවකි.

විධායක සූපවේදී
දුමින්ද අබේසිරිවර්ධන
B.B.Q. on Wheels, **කැන්බරා**
ඔස්ට්‍රේලියාව

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා
පාඨමාලා උපදේශිකා

නිළි රැජින හැඩවෙලා තියෙන්නේ ඒනිස් අයියගේ කිව් කිව් බෝල සබන් ගාලා

'සුවඳ සබන් ඇඟ ගාලා හායි හායි
කුඹුකේ ළිඳෙන් දිය ඇදලා නාලා...'

'රාජකපුරු' වේදිකා නාට්‍යයේ එන බොහොම ප්‍රසිද්ධ ගීතයක් ඒක. හැබැයි ඉතින් හායි හායි ගගා සබන් පෙන පිඹ පිඹා ලතාවට සුවඳ සබන් ඇඟ ගෑවේ ඉස්සර. සබන් මිල අහස උසට ගියාට පස්සේ කට්ටිය සබන් ගාන්නෙත් හූල්ල හූල්ල. මොකද දැන් සබන් කෑල්ලක් දියවෙන එකයි රත්තරං වතුරේ යන එකයි අතරේ ලොකු වෙනසක් නැහැනේ.

බොහොම ඉස්සර අපේ උදවියට සබන් තිබිලා නැහැ. ඒ අය ඇඟේ ගාලා තියෙන්නේ පෙනෙළ කොළලූ. පෙනෙළ කොළ මිටක් හොඳට තලලා ඒකේ සාරුව අරගෙන වතුර ටිකකට දැම්මයින් පස්සේ පෙණ එනවා. ඒ පෙණ ගාලා ගල්පොත්තෙන් ඇඟපත ඇතිල්ලුවම කුණු යනවලූ.

අපේ අයට සබන් ගාලා නාන්න උගන්නලා තියෙන්නේ සුද්දෝ. ඒ අය ලංකාවට ගෙනා මුල්ම සුවඳ කැටේ නම 'පැමෝරා'. සව්කොළවල ඔතාපු බෝල හැඩේ ගත්තු මේ සබන්වලට අපේ උන්දැලා කිව්වේ 'බෝල සබන්' කියලා. පැමෝරා සබන් කැටේ දැන් සබන්වලට වඩා බොහෝම පුසුඹලූ.

මුල් කාලේ බෝල සබන් ඇඟේ ගාලා තියෙන්නේ කුමාරිහාමිලා විතරයි. "අපිට කොයින්දෑ බෝල සබන්" කියලා ගමේ සාමාන්‍ය කෙලි ගැටිස්සියෝ හිත් හදාගත්තලූ. ගෑනු මනාප බව දන්න නිසා ඒ කාලේ පෙම්වත්තු පෙම්වතීට තෑග්ගට දීලා තියෙන්නේ රත්තරං මුතු මැණික් නෙමෙයි. බෝල සබන්.

පස්සේ ලංකාවේ උදවියත් සුවඳ සබන් හදන්න පටන් අරන්. ඉතින් කාලෙකදි සබන් මිනිස්සු අතර සාමාන්‍ය වෙළඳ භාණ්ඩයක් වෙලා. 1950 ඉඳලා සබන් විකුණන්න නානාප්‍රකාර වෙළඳ දැන්වීම් පවා හදලා තියෙනවා.

වෙළඳ දැන්වීම් ගැන කියද්දී නිළි රැජින මාලනී ෆොන්සේකා මහත්මිය මාධ්‍ය සාකච්ඡාවකදී කිව්ව කතාවක් මතක් වුණා. මාලනී ෆොන්සේකාගේ මහගෙවල් තියෙන්නේ කැලණි පළාතෙ. සිනමා නළු විමල් කුමාර ද කොස්තා මහත්තයත් ඒ පළාතෙමයි. ඒ කාලෙදි මාලනී කැලණි කල්‍යාණිය වුණාලූ. ඒ උත්සවේ අනුග්‍රාහක ඇඩ්වර්ටිස්මන්ට් කියවන්න ඉඳලා තියෙන්නේ විමල් කුමාර ද කොස්තා. තිරයේ වගේම ඔහු හැබෑවටමත් හරි විහිළුකාරයලූ. ඇඩ්වර්ටිස්මන්ට් කියවන අතරේ ඔහු මාලනී වගේ කතා කරන්න පටන්ගත්තලූ.

"මම වැඩියෙන්ම ගාන්නේ ඒනිස් අයියගේ සව් කිව් කිව් බෝල සබන්..."

එහෙම කිව්වහම මාලනීට හුස්ම හිර වෙනකල් හිනා ගිහින්. ඒ පැත්තේ ඒනිස් කියලා මුදලාලි කෙනෙක් හිටියලූ. ගමටම බෝල සබන් හදලා තියෙන්නේ උන්දෑ.මාලනී ගාලා තියෙන්නේත් ඒනිස්ගේ බෝල සබන්. ඒ නිසාලූ විමල් අරම විහිලූ කළේ.

ඔය කියන කාලේ කොයි කවුරුත් ගාලා තියෙන්නේ අපේ උදවිය නිෂ්පාදනය කරාපු සබන්. විවෘත ආර්ථිකේට පස්සේ පිටරටින් සබන් ගෙන්නන්න පටන්ගත්තහම අපේ සුවඳ සබන් කර්මාන්තේ කඩාවැටිලා. හැබැයි ඩොලර් දීලා පිටරටින් ගෙන්නන සබන්වල ගාණ දවසින් දවස වැඩිවෙන්න ගත්තු ද, ඉඳලා ගොඩක් උදවිය සුළු වශයෙන් නිෂ්පාදනය වෙන දේශීය සබන් ගැන ආයෙත් හිතන්න ගත්තා. ඒ නිසා අදටත් ස්වයං රැකියාවක් විදියට සබන් අලෙවි කරලා හොඳ ලාබයක් උපයන්න පුළුවන්.

සබන් නිෂ්පාදනය කරනවා නම් SLS ප්‍රමිති සහතිකය ගන්න එක වැදගත්. සමහරු මේ කිසිම සහතිකයක් නැතිව වාණිජ අරමුණුවලින් හෝම්මේඩ් සබන් විකුණනවා. ඒ වගේ දේවල් කරලා සාර්ථක වෙන්න බැහැයි කියන එකයි අපි නම් කියන්නේ.

මුලින්ම සබන් කැට 10ක් හදලා වැඩේ පටන්ගමු. ඒකට මේ අමුද්‍රව්‍ය මේ ප්‍රමාණවලින්ම ගන්න. ඉලෙක්ට්‍රික් තරාදියකින් මැනලා ගන්න පුළුවන් නම් වැඩිය හොඳයි.

කෝස්ටික් සෝඩා 87g, වතුර 175ml, සුදු පොල්තෙල් 495g, සුරියකාන්ත තෙල් 5g, කස්තුරි කහ 5g, ෂියා බටර් (ෂියා ශාකයේ නිස්සාරණයකි. සම සිනිඳු කර පැහැපත් කරයි) 2g (shea butter), ග්ලිසරින් 5g (සමේ තෙතමනය ආරක්ෂා කරයි) සුවඳ වර්ගයක්, ටැල්ක් (සුමුදු බවක් ලැබේ) 25g, විටමින් E කරලක්, අවශ්‍ය නම් පමණක් පාට. මේ සේරම බඩු පිටකොටුව බංගසාල වීදියෙන් අඩු මිලට ගන්න පුළුවන්.

ජලය වෙනුවට වෙනිවැල්ගැට තැම්බුව වතුර, දස්පෙති මල් නිස්සාරණ, වදමල් නිස්සාරණ, කොහොඹ නිස්සාරණ යොදගන්න පුළුවන් නම් සමට තවත් හොඳයි.

පියවර 1

ප්ලාස්ටික් භාජනේකට වතුර ටික දගෙන කෝස්ටික් සෝඩා ටිකෙන් ටික එකතු කරන ගමන් හොඳට දියකරගන්න. එහෙම හදපු මිශ්‍රණේ පැය 48ක් වහලා තියන්න.

පියවර 2

දවස් දෙකකට පස්සේ පොල්තෙල් සහ සූරියකාන්ත තෙල් භාජනේකට දාලා යන්තමින් රත් කරන්න. කලින් හදගත්තු කෝස්ටික් සෝඩා මිශ්‍රණය මේ මිශ්‍රණයට එකතු කරන්න. ඔය අතරේ ෂියා බටර් ටික ඩබල් බොයිල් ක්‍රමේට දියකරගන්න.

කස්තුරි කහ, ග්ලිසරින්, සුවඳ, ටැල්ක්, විටමින් E, පාට පිළිවෙලින් අර මිශ්‍රණය එකතු කරන ගමන් එකම අතකට ඉක්මනින්ම මිශ්‍ර කරන්න. අච්චුවලට දාලා සෙට්වෙන්න තියන්න.

ස්වයං රැකියා කරන අයට ගන්න පුළුවන් සිලිකන් සබන් අච්චු වෙළඳපොළෙන් ගන්න පුළුවන්. හදගත්තු සබන් දවස් 21ක් තියලා ඇසුරුම් කරන්න. වැඩි විස්තර දැනගන්න මේ අංකයට කතා කරන්න 0714766819.

කුර්දිය වෙනුවෙන් දිවි පිදූ රෝස කුසුම ආසියා

ආසියා රාමසාන්
Asia Ramazan

සිරියාවත් තුර්කියත් අතර මායිමේ පිහිටලා තියෙන කුර්දි කඳු නිසා ඒ ප්‍රදේශයේ තියෙන්නේ අමුතුම ලෝකයක් කිව්වොත් හරි. ඒ අමුතු ලෝකේ අස්සේ ගුප්ත ලස්සනක් තියෙනවා කියලා සමහරු කතාවට කියනවා. හැබැයි ඇත්තටම කුර්දි කඳු පළාත ලස්සන වෙන්න ඒ හැමදේටම වඩා වෙන ලොකු හේතුවක් තිබුණා. ඒ තමයි පෙනුම අතින් ලස්සනම ලස්සන කෙල්ලෝ මේ ප්‍රදේශයේ ජීවත්වීම.

ආසියා රාමසාන්, ඇයත් මේ කියපු කුර්දි ප්‍රදේශයේ කමිශ්ලි කියන කුඩා ගම්මානයේ ජීවත්වුණු හැඩකාර කුර්දි දැරියක්. ආසියා කොච්චර ලස්සනද කිව්වොත් ආසියාගේ රූපෙට වශීවුණු තරුණයෝ මලකින් රොන් ගන්න එන බඹරු වගේ ඈ වටේ කැරකුණා. වයසත් එක්කලා ආසියාට නම් ආදරය ගැන හිතන්න උනන්දුවක් තිබුණේ නෑ. හැබැයි ඇයට එහෙම ඉන්න ලැබුණෙත් ටික කාලයයි. උපන්දා ඉඳලා තමන්ගේ පවුලට උරුමවෙලා තිබුණු දුප්පත්කම නිසා වැඩි වයසක් යන්නට කලින් ආසියාට විවාහවෙන්න සිද්ධ වුණා. එතකොට ඇයට අවුරුදු පහළොවයි. ඒත් ඒ විවාහය සාර්ථක එකක් වුණේ නෑ.

"ඒ මිනිහා සතුටින් හිටපු කෙනෙක් නෙවෙයි. ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් පිරිච්ච යකෙක්. ඒ නිසා මට ඒ කසාදේ එපා වුණා. ඒනිසා මම ඒ මිනිහගෙන් අයින් වුණා."

දික්කසාදයෙන් පස්සේ ආසියා ආයෙත් ගෙදර ගියා. අයිසිස්, ඩයේෂ් වගේ භීෂණකාරී සංවිධාන එළියට බහින්න පටන්ගත්තෙත් ඔය කාලේ. ආසියා ඉන්න ගම්මානය අයිති කලාපයේ ඉස්ලාමික රාජ්‍යයක් පිහිටුවන එකයි ඔවුන්ගේ අරමුණ වුණේ. කොහොමහරි ඔවුන් ඒ ප්‍රදේශයේ භීෂණය පැතිරුවා.

හැබැයි අයිසිස්ලට අරමුණ ජයගන්න ඒ තරම් ලේසි වුණේ නැහැ. මොකද මේ වගේ සංවිධානවලට මුහුණදෙන්න කුර්දි ජනතාව ඒ වෙනකොටත් හමුදාවක් හදාගෙන හිටියා. ඒ කුර්දි හමුදාවේ හිටපු ළාබාලම කෙල්ල වුණේ දික්කසාද වෙලා ගෙදර ආපු ආසියා.

"කුර්දි හමුදාවට එකතුවෙච්ච මුල් කාලේ මං කළේ ගම වටේ අගල් කපපු එක. පස්සේ මටත් අවි පුහුණුවක් දුන්නා. ටික කාලෙකින් හැම ආයුධයක්ම පාවිච්චි කරන්න මට පුළුවන් වුණා. ඒ දක්ෂතාවය නිසා ඒ අය මාව හමුදාවේ ඉදිරිපෙළ සෙබළියක් කළා."

ඔය කාලේ දවසක් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය එක්ක කුර්දි ප්‍රදේශයට ඡායාරූප ශිල්පියෙක් ආවා. අවි අතදරන් හිටපු හැඩකාර ආසියාව ඡායාරූප ශිල්පියාගේ ඇස ගැටුණේ එතකොට. ගොඩක් ලස්සන නිසා ආසියා නිතරම අනිත් අයට වඩා කැපිලා පෙනුණා. අවියක් අතේ තියන් ඉන්න ලස්සන කෙල්ලගේ ෆොටෝ එකක් නොගහා ඉන්න ඡායාරූප ශිල්පියාට පුළුවන් වුණේ නැහැ. ඒ නිසා ආසියාට හොරා ඔහු ඇයගේ ඡායාරූප කීපයක්ම අරන් විරටේ ප්‍රසිද්ධ පුවත්පත් ආයතනවලට දුන්නා. ඒ ඡායාරූප පුවත්පත්වල පළවුණත් එක්කම ආසියාත් නොදැනීම ආසියා ප්‍රසිද්ධ වුණා. කොටින්ම කිව්වොත් ඇය එකරැයින් තරුවක් වුණා. ආයිසාගේ ලස්සන නිසාම ලෝක ප්‍රසිද්ධ නිළියකගේ නමක් ගාවලා 'කුර්දි ඇන්ජලීනා ජොලී' කියලා නමකුත් පටබැඳුනා.

"මම තරුවක් වගේ ජනප්‍රිය වුණා. හොලිවුඩ්වල අධ්‍යක්ෂවරු මට රඟපාන්න කතා කළා. ඒත් ඇමරිකාවේ තරුවක් වෙන්න මට ඕනේ නැහැ. යුද්ධ කරලා අපේ ගම බේරගන්න විතරයි මට ඕනේ."

ඒද 2016 අගෝස්තු 30. ඒක යුද්දේ වැඩි කාලයක්. අයිසිස් සංවිධානෙට අයත් මරාගෙන මැරෙන වාහන තුනක් කුර්දි ආරක්ෂක වළල්ල පැත්තට එනවා අසියා දැක්කා. එතකොට ආසියාට අවුරුදු 18යි. ආසියාගේ හිතට තමන්ගේ උන් ගැන ලොකු කැක්කුමක් දැනුණා. ඇයට හිතන්න වෙලාවක් තිබුණේ නෑ. අතේ තිබුණු ගිනිඅවියෙන් ආසියා එතැනින් ගිය වාහන දෙකක්ම පුපුරවලා විනාශ කළා. එකක් ඉතුරුයි. දිගින් දිගටම වෙඩි තිබ්බත් ඉලක්කේ අසාර්ථක වුණා. තවත් බලන් ඉන්න බැරි තැන මරාගෙන මැරෙන වාහනය කිට්ටුවටම ගිහින් වෙඩි තියන්න ආසියා තීරණය කළා. ආසියා වාහනේට වෙඩි තියනවා. ආසියාවත් කෑලි කරගෙනම වාහනේ පිපුරුණා.

"ආසියා නිර්භීත කෙල්ලෙක්. අපිට ඇය ගැන ආඩම්බරයි. කර්දිය බේරගන්නයි ඇයට ඕන වුණේ. නැත්නම් අවුරුදු 15දී කැමැත්තෙන් හමුදාවට බැඳෙන්නේ මොන කෙල්ලද? හැබැයි අවාසනාවකට ඇයට යන්න වුණා. හැබැයි නිකන් නෙමෙයි ඇය ගියේ වීරවරියක් විදියට."

තමන් වෙනුවෙන් ජීවිතය දන් දුන් ආසියා ගැන කුර්දි මිනිස්සු කියන්නේ එහෙමයි. ආසියා ජීවිතයෙන් සමුඅරන් මේ වෙනකොට වසර හතක්. හැබැයි අදටත් කුර්දි ගමට ආසියා වීරවරියක්.

■ රුවන් එස්.සෙනවිරත්න

ධරණී

ජාත්‍යන්තර කාන්තා දිනය 2023

"හිතේ හයියෙන් ජීවිතය දිනන්නම වෙර දරන ඔබට"

විශේෂ දැන්වීම් අතිරේකය

ආතරයිටීස් රෝගයෙන් මිදීමට හෝමියෝපති ප්‍රතිකර්ම

වර්තමානයේ බොහෝ දෙනා මුහුණ පානු ලබන රෝගී තත්ත්වයක් වන රූමැටික් ආතරයිටීස් රෝගය පිළිබඳව ශ්‍රී ලංකා රජයේ සහතික ලත් පෙර අපරදිග වෛද්‍ය චිකිත්සක ගරු සභාපති ලංකා හෝමියෝපති පදනමේ වෛද්‍ය එස්.ඩී.පී. පෙරේරා වෛද්‍යතුමා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරින් සැකසූ ලිපියකි.

රූමැටික් ආතරයිටීස් රෝගය යනු පුද්ගලයෙකුගේ ශරීරයේ ඇති ස්වාභාවික ප්‍රතිශක්තීකරණ පද්ධතියේ සිදුවන දුර්වලකමක් හෙවත් පුද්ගලයකුගේ ජීවබලය ඌණ වූ විට එම ස්ථානයේ ඇතිවන රෝගාබාධ තත්ත්වයකි. මෙහිදී වෛද්‍යවරු හෝමියෝපති වෛද්‍යක්‍රමය නිර්දේශ කරනු ලබන අතර හෝමියෝපති ඖෂධයක් මඟින් දුර්වල වූ ජීව බලය නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කරනු ලබයි. එනම්, රෝගියාගේ දුර්වල වූ ප්‍රතිශක්තිය වැඩිකිරීම හෝමියෝපති වෛද්‍යක්‍රමයේ මූලික සිද්ධාන්තය වන නිසාය.

හෝමියෝපති ප්‍රතිකාර කිරීම සඳහා දැනට ශ්‍රී ලංකාවේ රජයේ පිළිගත් වෛද්‍යවරුන් 183ක් පමණ සේවයේ යෙදී ඇති අතර එවන් පිළිගත් වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාරගත යුතු හේතු කිහිපයකි. රෝගියාගේ රෝග ඉතිහාසය සොයා බැලීම මෙතෙක් කලක් භාවිත කළ ඖෂධ පිළිබඳ විමසීම අවශ්‍ය පරීක්ෂණයන් සිදුකිරීම ඒ අතරින් ප්‍රධාන වේ.

හෝමියෝපති ප්‍රතිකාර සඳහා යොමුවුවන්ට මූලික වශයෙන් සිදුකරනු ලබන පරීක්ෂණ කිහිපයකි. එනම් ආතරයිටීස් රෝගියකුගේ සාමාන්‍ය පරීක්ෂණ සම්පූර්ණ රුධිර පරීක්ෂණයක් අක්මාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණයක් වකුගඩු ක්‍රියාකාරිත්වය පිළිබඳ මුත්‍රා හා රුධිර පරීක්ෂණයක් ආදියයි. බෑසෘ CDR RF බැක්ටීරියා හා ප්‍රතිදේශ විවිර රුධිරයේ යූරියා අම්ලය ලසිකා තරල පරීක්ෂණය ANT-CT සහ MRI ස්කෑන් පරීක්ෂණ ආතරයිටීස් කොපි පරීක්ෂණය පටක පරීක්ෂණය ආදියද අවශ්‍ය නම් මෙම වෛද්‍යවරයකු යටතේ පරීක්ෂා කර ගත හැකිය. ඖෂධයක් යනු රෝගියාගේ රෝගයට ප්‍රතිකාර කළ පසු අතුරු ආබාධයක් ඇති නොවිය යුතු දෙයකි. නමුත් හෝමියෝපති ඖෂධ ලබා ගැනීමෙන් පසු කිසිදු අතුරු ආබාධයකට ලක් නොවන බැවින් රූමැටික් ආතරයිටීස් රෝගය සඳහා සුදුසුම ප්‍රතිකාරය වන්නේ හෝමියෝපති ඖෂධයයි. මෙහිදී රෝගියාගේ රෝග ලක්ෂණ අනුව එයට සුදුසු ඖෂධය තෝරා ගැනීම හෝමියෝපති



වෛද්‍ය එස්.ඩී.පී. පෙරේරා

වෛද්‍යවරයාට අයිති කාර්යයකි. රෝග ලක්ෂණයට නියමිත ඖෂධ වර්ගය ලබා ගත් විට එම මොහොතේම රෝගියාට සුවය ලබා ගැනීමේ හැකියාවක් ඇතිවේ. මෙහිදී ඖෂධ තෝරා ගැනීමේදී රෝගියාට සුදුසු බලය යෙදවූ ඖෂධය තෝරා ගත යුතු වේ. හෝමියෝපති ඖෂධ වශයෙන් එම රෝගයට ප්‍රතිකාර කිරීමේදී පොටෑසියම් යන ඖෂධ බලය උපකාරී වේ. මෙම රෝගයට හෝමියෝපති ඖෂධ 50ක් පමණ හෝමියෝපති ඖෂධ නිගන්ඩුවේ සඳහන් වේ.

මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ එස්.ඩී.පී. වෛද්‍යතුමා පැවසූයේ මෙම රෝගී තත්ත්වය සඳහා අවශ්‍ය ප්‍රතිකාර කිරීමේදී රූමැටික් ආතරයිටීස් රෝගයෙන් පෙළෙන රෝගීන් සඳහා විශේෂිත තෙල් වර්ගයක් ආලේප කර ව්‍යායාම කිරීමට සලස්වමින් ඒ තැන්වල ඇති දුබලතාව මගහරවාලීමට කටයුතු කරන බවයි. එසේම රෝගියාගේ රෝගී තත්ත්වය හඳුනා ගනිමින් ඉහත දැක්වූ ඖෂධ හා ප්‍රතිකාර මඟින් පළපුරුදු හෝමියෝපති වෛද්‍යවරයකුට ආතරයිටීස් රෝගියකුගේ රෝගය සුව කිරීමේ හැකියාවක් ඇති බවද මෙම වෛද්‍යතුමා වැඩිදුරටත් පැවසීය.

ඔබත් මෙතෙක් කල් නිවරදි ප්‍රතිකාරවලට යොමු නොවී රූමැටික් ආතරයිටීස් රෝගයෙන් පීඩා විඳින්නෙක් නම් ඉන් මිදී ඔබගේ ජීවිතය නිරෝගීව ගත කිරීමට අවශ්‍ය සැබෑ ප්‍රතිකර්මයක් ඔබට ගෙනෙන සුව පියසක් බදු G.T.C. වෛද්‍ය මධ්‍යස්ථානයට පියනගන්න.

හමුවීම :
G.T.C. අංක 14, දුම්රියපළ
ඉදිරිපිට, ජා ඇල
011 223 6250 / 011 224 2804
00 224 1312
077 399 5134 / 072 226 5099

ආතරයිටිස් රෝගයට (විශේෂ ප්‍රතිකාර)

ජා ඇල ජී.ටී.සී. වෙත එන්න

අවුරුදු 55ක පළපුරුදු වෛද්‍යවරයෙක් හමුවී ඔබගේ රෝගය සුව කර ගන්න

සන්ධිවාත හෙවත් ඔස්ටියෝ සන්දි ප්‍රදාහය, ශරීරයේ සියලුම සන්ධි ආබාධ වලට ප්‍රතිකාර, පටක ගෙවී යාම, දණහිස්, උකුල් හා ඇඟිලි වල සන්ධි ප්‍රදාහය, උරහිසේ හා කොන්දේ කැක්කුම, සන්ධි නැවීමට නොහැකි වීම, සියලු සන්ධි ආබාධ, සන්ධිවල පටක ඉදිමීම හා ගෙවීම්වලට සුවය ලබා ගැනීමට ප්‍රතිකාර අප සතුව ඇත.

පොතු කබර, සුදු කබර, දද, කුෂ්ඨ, සමේ ඇතිවන පරණ තුවාල, ලප කැලැල් ඇතුලු සමේ ඇති වන සියලුම චර්ම රෝග සඳහා විශේෂ ප්‍රතිකාර අප සතුව ඇත.

කාන්තාවන්ගේ දරුඵල නැතිවීම සම්බන්ධව ද ප්‍රතිකාර කරනු ලැබේ.

ගෑස්ට්‍රයිටිස්, අක්මාවේ තෙල් බැඳීම, වකුගඩුවල හා මූත්‍රාශයේ ගල් ඇතිවීමට (මූත්‍රාශයේ ඇති වන ගල් දියකර හැරීමට විශේෂ ප්‍රතිකාර ඇත.

දියවැඩියා රෝගය නිසා ඇති වූ ස්නායු දුර්වලතාවයන් සම්බන්ධව ද විශේෂ ප්‍රතිකාර කරනු ලැබේ.

ගෑස්ට්‍රයිටිස්, අක්මාවේ තෙල් බැඳීම, වකුගඩුවල හා මූත්‍රාශයේ ගල් ඇතිවීමට (මූත්‍රාශයේ ඇති වන ගල් දියකර හැරීමට විශේෂ ප්‍රතිකාර ඇත.

ඇදුම, පීනස, තරුණ අයගේ අකලට හිසකෙස් යාම, අකලට හිසකෙස් පැසීම

දේශීය ආයුර්වේද, රස වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති (ජර්මන් ප්‍රතිකාර) බයෝකෙමික්ස්, පෙර අපරදිග ප්‍රතිකාර

ස්ත්‍රී පුරුෂ සියලුම ලිංගික දුර්වලතා හා සමාජ රෝග සඳහා ප්‍රතිකාර

දුර බැහැර රෝගීන් දුරකථනයෙන් දිනයක් සහ වේලාවක් ලබා ගෙන පැමිණෙන්න.
රෝග පරීක්ෂණය : පෙ.ව. 9.45 සිට ප.ව. 4.30 දක්වා විවෘතව පවතී

ඉරිදා දින හා පෝය දිනවල, රජයේ නිවාඩු දිනවල වසා ඇත.

හමුවීම : **G.T.C අංක 14, දුම්රියපළ ඉදිරිපිට, ජා ඇල**

0112 236250/ 0112 242804/ 0112 241312
0773 995134/ 0722 265099

ප්‍රතිකාර සඳහා ජා ඇල දුම්රියපළට ඇතුළුවන දොරටුවට ඉදිරියෙන් දකුණු පසින් ජී.ටී.සී වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටා ඇත.

Sandani Cream

GTC HERBAL

For all Skin

පුරාණයේ රාජකුමාරියෝ භාවිතා කළ ස්වභාවික ඖෂධ භාවිතා කර තමන්ගේ රූප ස්වභාවය ආරක්ෂා කර ගැනීමට දේශීය වෛද්‍ය ක්‍රමයේ ඖෂධ වට්ටෝරුවක් අනුව නිෂ්පාදනය කරන ලද සඳනි ආලේපය මුහුණට මෙන්ම ශරීරයටම භාවිතා කළ හැක. මෙහි කිසිදු රසායනික ද්‍රව්‍යයක් අඩංගු නැත.

- **සම වියලීම නවතා තෙතමනය රැකදෙයි.**
- **කුරුලෑ ළප කැළල් නැති කරයි.**
- **හිරු කිරණින් ආරක්ෂා කරයි.**
- **සම පැහැපත් කරයි.**

භාවිතය: මුහුණ හොඳින් සෝදා තෙතමාත්තු කර සඳනි ආල්පනය ආලේප කරන්න. හවසට සෝදා හරින්න.

No. 14, G.T.C, Ja-Ela, Sri Lanka Tel: 011 2236250

දිරිය ඔබට ලිය සවියයි
ජීවිතයම කළ එළියයි

RDB ලිය සවිය
දැයේ දිරිය ලියන්ට... Plus

- ආකර්ෂණීය පොළී අනුපාතයක්.
- ශේෂය මත මුදල් ත්‍යාග.
- ඔබගේ අවශ්‍යතා සඳහා මූල්‍ය පහසුකම් සමඟ මූල්‍ය ප්‍රදානයන්.
- ව්‍යවසායකත්වය දියුණු කිරීමට විශේෂ පුහුණු වැඩමුළු.
- "දිරි අභිමානී" හොඳම ව්‍යවසායිකාව තේරීමේ තරඟයට සහභාගී වීමේ අවස්ථාව.

දිවයිනේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව

* කොන්දේසි සහිතයි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

HOTLINE 011 2 425 262
www.rdb.lk

දණහිස් ආබාධ වලින් දුක්විඳින්නේ ඇයි?

වයසට ගියාම බස්තම් පාවිච්චි කරන්නත් ලක්ෂ ගණන් වියදම් කර ශල්‍යකර්ම කරන්නත් අවශ්‍ය වෙන්නේ නැහැ

කායික ආබාධ තත්වයක් යනු අපට මානසික වශයෙන් ද අවතැන් කරන්නකි. මේ නිසා අපගේ දෛනික රිද්මය වෙනස් වීම අපට ජීවිතය සම්බන්ධයෙන් අනිකරුනු ලබන්නේ පරාජිත මානසිකත්වයකි. මේ තත්වයෙන් මිදීම සඳහා ඔබ නිවැරදි ප්‍රතිකාර නිවැරදි කාලය තුළ ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ වගේම නිවැරදි ප්‍රතිකාර සඳහා නිවැරදිම ස්ථානයක් වෙතම යාම ඔබ සතු මූලිකම වගකීමකි. මේ ඒ සඳහා ඔබට ලබාදෙන මගපෙන්වීමකි.

දණහිස් ආබාධ

මෙවැනි ආබාධ ඇති ඔබ තරබාරු කෙනෙක් හෝ නිතර ඇවිදින කෙනෙකු විය හැකි ය. විශේෂයෙන් මෙවන් අය දණහිස් වේදනාව නිසා අපහසුතාවයට ලක්වේ. මේ නිසාම බොහෝවිට මෙවැනි අය තාවකාලික සුවය ගෙනදෙන වේදනා නාශක වලට යොමු වේ. මෙහෙදී අප විසින් දීර්ඝකාලීන සුවය ගෙන දෙන, අතුරු ආබාධ නැති දේශීය, භෞතික හා නිල චිකිත්සා ඔස්සේ ප්‍රතිකාර කරනු ඇත.

මම තරබාරු කෙනෙක්. මට තිබුණේ ඉතා වේදනාකාරී දණහිස් ආබාධයක්. ඇවිදින්න, පඩි නඟින්න බහින්න, එදිනෙදා වැඩකටයුතු කරගන්න අපහසුතාවෙන් දුක් වින්දා. නොයෙක් තැන් වලින් බෙහෙත් කලා. පත්තරේ සහ ටීවීවිකේ දැක්ක ලංකාවේ සහ පිටරටවල් වල අධික මල ගණන් වල බොන බෙහෙත් සහ තේල් වර්ග හරියට පාවිච්චි කලා. සනීප වුනේ නෑ.

මේ සායනයට ඇවිත් ප්‍රතිකාර වාර කීපයකින් මට සුවය ලැබූ බව පවසන්නේ ඉතාමත් සතුටින්. නිවැරදි විදිහට තෙල් ගෑම, දෙන උපදෙස් නිවැරදිව පිළිපැදීම අනිවාර්ය වෙනවා. විශේෂයෙන් දණහිසට කරන ව්‍යායාම කරන්න ම ඕනෑ. ඒවගේම දණහිසට හොඳ Guard එකක් දාන්නත් ඕන.

මේ ප්‍රතිකාර වලින් මම තේරුම්ගත්ත දේ තමයි. තරුණ හෝ මැදිවයේ අවධියේ දී දණහිස් වේදනාවන් තිබුණාම අපි පුරුදුවෙලා ඉන්නේ වේදනා නාශක, තෙල් හෝ බාම් වර්ග පාවිච්චි කරලා තාවකාලික සුවයක් ලබන්න. එහෙම කලාට අපි වයසට යනකොට නොදැනුවත්වම කාටිලේජ ගෙවෙන්න පටන් ගන්නවා. විශේෂයෙන් අපි තරබාරු නම් කාටිලේජ හොඳටම ගෙවිලා දණහිස් අස්ථි එකට වදින්න බලනවා. හුඟක් වෙලාවට මේ වගේ අය කෘතිම දණහිස් දාන්න ගොඩක් මුදල් වියදම් කරන්න වෙනවා. ඉතින් එහෙම නොවී සනීප වූ කෙනෙක් හැටියට මම කියන්නේ, වේදනා විඳින්නේ නැතිව පසුකාලීනව අධික වියදම් නොකර, ඉක්මනින් සුව කර ගැනීමටා හැදුන මුල් අවධියේදී ම මේ ප්‍රතිකාර වලට යොමුවීමෙන් මා වගේ සුවය ලබාගන්න.

පී. ආර්. මල්ලිකා මිය. රාජගිරිය. 0702480241

තුනටියේ වේදනාව හා පාදය දිගේ වේගනාව, හිරිවැටීම නිසා ඇතිවන තත්වය දරුණු වුවහොත් ශල්‍යකර්ම පවා කිරීමට සිදුවේ

මම මගේම ලොරි රථයක් පදවන කෙනෙක්. මට තිබුනා කාලයක ඉදන් තුනටියේ වේදනාවන් සමඟ කකුල දිගට එන වේදනාවක් හා හිරියක්. පුදුම අපහසුතාවෙන් තමයි හිටියේ. වැඩ කරගන්නත් අපහසුයි. බොන බෙහෙත් ගත්තට එවේලෙට අඩුවෙනවා විතරයි. මගේ නිවස ලඟම තමයි මේ සායනය තියෙන්නේ. මම මුලින්ම මේ සායනයට ගියාට පස්සෙ මට මගේ රෝගය ගැන ඉතා හොඳ පැහැදිලි කිරීමක් කලා.

ප්‍රතිකාර වලින් දැනුනේ පුදුම සුවයක්. අනිවාර්යයෙන්ම කොන්දාට බෙල්ට් එකක් දාන්න ඕනෑ. ඒ වගේම පරිස්සම් වෙන්නත් ඕන. මට දැනුන දේ තමයි මේ රෝග තත්වය හරිහැටි හඳුනාගැනීම සහ ඒ සඳහා නිවැරදි ප්‍රතිකාර ලබා ගැනීම වගේම පරෙස්සම් වීම තමයි වැදගත්ම දේ කියන එක. නැත්නම් පසුවට ශල්‍යකර්ම කරන්නත් වෙනවා. මෙතුමට පිංසිද්ධවෙන්න දැන් මට දැන් හොඳයි.

එස්. සරත් මහතා, හිඹුටාන

දියවැඩියාව නිසා ඇතිවන හිරිවැටීම්, වේදනාව,දැවිල්ල, දුර්වලතා ඇති රෝගීන් සුවපත් කරන්න පුලුවන්.

ආබාධ වලින් වලක්වන්නත් පුලුවන්.

මම දියවැඩියා රෝගයට කාලයක් සිට බෙහෙත් බොනවා. කකුල් වල හිරිය, දැවිල්ල, ඉදිකටු වලින් අනිනවා වාගේ වේදනා නිසා ඇතිවූ ගටලු අපමණයි. හුගක් දිනවල රාත්‍රි නිදි නැති තරම්. විවිධ අන්දමේ ප්‍රතිකාර කළත් සුවයක් නම් ලැබුනේ නෑ.

මෙම සායනයේ දී සීනි පාලනය කරන්න නිවැරදි උපදෙස්ද ද ලැබුනා.

පළමු දිනයේ දී කළ පාද සත්කාරය කකුල් වල යටිපතුල් හිරිය නිසා දැනුනේම නෑ. නමුත් දෙවන, තෙවන දින වන විට යටිපතුල් ප්‍රතිකාරය හොඳින්ම දැනෙන්න පටන්ගත්තා.

ප්‍රතිකාර හේතුවෙන් යටිපතුලේ සිනිඳු ගතිය ක්‍රමක්‍රමයෙන් නැතිවෙමින් තිබෙන අතර, සෙරෙප්පු නැතිව ටයිල් පොළොවේවත් යන්නට පවා නොහැකි වුන මට දැන් සෙරෙප්පු නැතිව ඇවිද යාමට හැකි බව ඉතා ඔබට කියන්නේ ඉතාමත් සතුටින්.

වාර කිහිපයක් පමණයි ප්‍රතිකාර ගත්තේ, කියාගන්නට බැරි අපමණ සතුටක් දැනුනේ. දැන් මට නම් හොඳටම සුවයි. තොරතුරු අවශ්‍ය නම් කතාකරන්න. වෛද්‍යතුමාට බොහොම පිං!

ඒ.එම්.ජී. මැණිකේ මහත්මිය, හොරම්පැල්ල, මිණුවන්ගොඩ. 0706167953/ 0707167953

අවුරුදු ගණනාවක් තිස්සේ නිතර නිතර හැදෙන බෙල්ලේ සහ උරහිසේ වේදනාවක් මට තිබුණා

මට දියවැඩියාවත් මාස 6ක් විතර ඉදන් තිබුණා. වසර ගණනාවක්ම නිතර නිතර සෑදෙන බෙල්ලේ හා උරහිස මෙන්ම උරපතු ප්‍රදේශයේ වේදනාවක් සෑදුනා. මේ සැරේ ඒ වේදනාව ඉතාම දරුණු විදිහට දැනුනා. ඒ විතරක් නොවේ, අතේ ඇඟිලි දක්වා ඒ වේදනාව දැනුනා. රෝහල් වලින් විවිධ සායන වලින් ප්‍රතිකාර ගත්තත් අඩුවුනේ නෑ. මම මේ සායනය ගැන දැනගත්තේ රට පසුවයි. මම ගිය බොහෝ තැන්වල දී ඒ අයට මගේ ලෙඩේ හරියට හඳුනාගන්න බැරිවුනා. ඒ වගේම මෙතුමන් වගේ සැලකිල්ලෙන් පරීක්ෂා කරලා බැලුවෙත් නෑ. ලැබුණු උපදෙස් පිළිපදිමින්, නියමිත ආකාරයට ප්‍රතිකාර ලැබුණු නිසා හොඳ සුවයක් ලබා ගැනීමට හැකිවුනා. MRI වගේ අධික වියදම් යන පරීක්ෂන වලට යොමුවී ශල්‍යකර්ම කරන්න එපා කියල තමයි මට කියන්න තියෙන්නෙ.

අද වෙනකොට මගේ සුවවීම නිසා මම වගේම ගෙදර හැමදෙනාමත් සතුටින් ඉන්නේ. දැන් මට ඉතාමත් සැහැලුවක් වගේම මානසික නිදහසකුත් දැනෙනවා. මගෙන් ඔබට තොරතුරක් අවශ්‍යනම් මේ අංකයට ඇමතුමක් ලබා දෙන්න. ස්තුතියි.

කඩුවෙල පදිංචි සුජීවා මහත්මිය, 0773152862

සායනික තොරතුරු

ඔබත් මෙවැනි සංකූලතා වලින් පෙළෙන්නේ නම් ඔබට සාර්ථක ප්‍රතිකාර සඳහා 468/10A, සල්මල් උයන, හිඹුටාන යන ලිපිනය දරණ ස්ථානයේ පිහිටි ETON HEALTH CARE සුව වෙද මැදුර ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් සාර්ථක උපදෙස් සහ ප්‍රතිකාර ලබා ගැනීමේ අවස්ථාව ඇත. දශක ගණනාවක් පුරා දහස් ගණන් රෝගීන් සුවපත්කළ ප්‍රතිකාර කර්යයේ නිරත දේශමාන්‍ය, වෛද්‍යශූරී කේ.එම්. රංජිත් මහතාගෙන් මේ සම්බන්ධයෙන් සාර්ථක උපදෙස් හා ප්‍රතිකාර ලබාග හැකිය.

Google map ys ETON HEALTH CARE, Salmal Uyana, Hubutana. සෙවීම ඔස්සේ ඉහත ලිපිනය දරණ ප්‍රතිකාර මධ්‍යස්ථානය මධ්‍යස්ථානය වෙත පහසුවෙන් ලඟාවිය හැකිය. එමෙන්ම 0771893001/ 0764802302 යන දුකරථක අංක ඔස්සේ වැඩිදුර තොරතුරු ලබාගත හැක. පැමිණීමට පෙර දිනයක් වෙන්කරවා ගන්න.

ධරණී

ජාත්‍යන්තර කාන්තා දිනය 2023

"හිතේ හයියෙන් ජීවිතය දිනන්නම වෙර දරන ඔබට"

විශේෂ දැන්වීම් අතිරේකය

Vanitha Vasana 30th ANNIVERSARY

මහජන බැංකුවේ වනිතා වාසනා සමඟ ඉතිරි කර ජීවිතය ජයගන්න...

ආදරණීය මවක, දියණියක, යෙහෙළියක, සොහොයුරියක ලෙස විවිධ භූමිකාවන් ඔස්සේ සිය පවුලේ ස්ථාවරත්වය නඟා සිටුවීමට දිරිය දෙන ඇය, තවත් විටෙක නායකත්වය සපයන්නියක, ව්‍යවසායිකාවක, බුද්ධිය මෙහෙයවන්නියක, තීරණ ගන්නියක ලෙස රටෙහි ආර්ථිකය නඟා සිටුවීමට ද උරදෙයි.

එසේ පවුලේ, සමාජයේ මෙන්ම මාතෘ භූමියේ ද හෙට දිනය වෙනුවෙන් නිරන්තරයෙන් තම ශ්‍රමය කැපකරන ශ්‍රී ලාංකීය කාන්තා පරපුර විසින් සිදුකරන අමිල මෙහෙවරට ගෞරව ප්‍රණාම දැක්වීමට මාර්තු 08 දිනට යෙදෙන ජගත් කාන්තා දිනය සමරමින් මහජන බැංකුව ද එක්වෙයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (පුද්ගල කේන්ද්‍රිය බැංකු කටයුතු) රේණුකා ජයසිංහ මහත්මිය

'සකසුරුවම දෝතින්ම උරුම කරගත් ශ්‍රී ලාංකීය කාන්තා පරපුරට ඉතිරි කිරීම් තවදුරටත් ප්‍රගුණ කරන්නට ඉඩ ප්‍රස්ථා සලසා දෙමින් 1993 වසරේදී ජගත් කාන්තා දිනයට සමගාමීව වනිතාවන් වෙනුවෙන් 'වනිතා වාසනා' ඉතුරුම් ගිණුම මහජන බැංකුව විසින් හඳුන්වා දුන්නා. ඒ අනුව මේ වසරේදී වනිතා වාසනා ගිණුමට තිස් වසරක් සම්පූර්ණ වීමත් විශේෂත්වයක්.

මෙරට වාණිජ බැංකුවක් කාන්තාවන් සඳහාම විශේෂයෙන් හඳුන්වා දුන් ප්‍රථම ගිණුම වන්නේ වනිතා වාසනා ගිණුමයි.

එතැන් පටන් වනිතා ඉතුරුම් දිරිගැන්වීමෙන් මෙන්ම විවිධ ණය පහසුකම් ලබාදීමෙන් දේශයේ කාන්තාව නැංවීම හා එමඟින් පවුලේ ආර්ථිකය නගා සිටුවීමට ද, රටේ ආර්ථික නවෝදයට ඉතුරුම් තුළින් ප්‍රබල දායකත්වයක් ලබාදීමට ද 'වනිතා වාසනා' ඉතුරුම් ගිණුම තුළින් මහජන බැංකුවට හැකිවුණා. මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් මෙන්ම වනිතා වාසනා ගිණුමට තිස් වසරක් සපිරීම නිමිත්තෙන් 'හෙට ලොවට මං සදන අසමසම ඇයට' යන තේමාව ඔස්සේ වනිතා වාසනා ගිණුමින් සුවිශේෂී ප්‍රතිලාභ රැසක් පිරිනැමීමට මහජන බැංකුව සූදානමින් සිටිනවා.'

මහජන බැංකුව මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන්ම 'වනිතා වාසනා High Interest' ඉතුරුම් ගිණුම හඳුන්වා දී තිබේ. කාන්තා ඔබේ අභියෝග ජයගන්නට අත්වැලක් සපයන නම්‍යශීලී හා සුරක්ෂිත ඉහළ ප්‍රතිලාභ හිමි ආයෝජනයක් වන මේ තුළින් 12% දක්වා අසමසම පොලියක් පිරිනැමේ. මීට අමතරව ප්‍රථමයෙන් ගිණුම් විවෘත කරන ඔබට සුවිශේෂී තිළිණ පිරිනැමීමටද මහජන බැංකුව කටයුතු යොදා ඇත.

එමෙන්ම වනිතා වාසනා ගිණුමට සමගාමීව අරපිරිමැස්ම ඔස්සේ වනිතා පරපුරේ ආර්ථික ශක්තිය ක්‍රමානුකූලව ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් වනිතා වාසනා *Money Planner* ආයෝජන සැලසුම් පුංචි සිට්ටුවද හඳුන්වා දී ඇත. වසර අවසානයේ ඔබ ඉතිරිකිරීමට බලාපොරොත්තු වන මුදල අනුව රු.25,000/=, රු.50,000/=, රු.100,000/=, රු.250,000/=, රු.500,000/= වටිනාකමින් යුත් මෙම ආයෝජන සැලසුම් තුළින් 10.5%ක ආකර්ෂණීය පොලියක් පිරිනැමේ. කාර්ය බහුල ඔබට ස්ථාවර නියෝග මගින් වුවද වාරික ගෙවීමේ පහසුකම ලබා ගත හැක. මීට අමතරව සෑම පුංචි සිට්ටුවකටම තිළිණයක්ද පිරිනැමේ.

එමෙන්ම ජාත්‍යන්තර කාන්තා දිනයේ දී එනම් මාර්තු 08 වැනි දින 'වනිතා වාසනා High Interest' ඉතුරුම් ගිණුම හා Money Planner ආයෝජන සැලසුම් විවෘත කරන ඔබ වෙනුවෙන් දිවයිනේ ප්‍රමුඛතම දෘෂ්ටි විශේෂඥ ආයතන, නිමි ඇඳුම්, සුපිරි වෙළෙඳසැල්, ස්වාර්ණාභරණ,

රේණුකා ජයසිංහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි
(පුද්ගල කේන්ද්‍රිය බැංකු කටයුතු)

පිඟන් භාණ්ඩ, රෝහල් සහ වෛද්‍ය රසායනාගර මෙන්ම අන්තර්ජාල මිලදී ගැනීම් සඳහා සුවිශේෂී වට්ටම් පිරිනැමේ.

මීට අමතරව වනිතා වාසනා ගිණුම වෙනුවෙන්ම සන්නාමය කරන ලද විශේෂ හර කාඩ්පතින් (Branded Debit Card) දිවයිනේ ප්‍රමුඛතම වෙළෙඳසැල් සඳහා 50%ක් දක්වා සුවිශේෂී වට්ටම් හිමිවේ. එමෙන්ම වනිතා වාසනා ගිණුම් හිමියන්ට 'මහජන බැංකුවේ ස්වර්ණ ප්‍රදීප' උකස් ණය සඳහා 0.5%ක පොලි සහනයක් හිමිවීම විශේෂත්වයකි.

මෙම ප්‍රතිලාභ පිළිබඳ වැඩි විස්තර 1961 ඔස්සේ මහජන බැංකුවේ ක්ෂණික දුරකථන සේවාව ඇමතීමෙන්ද දැනගත හැක.

නිසි සැලසුමක් අනුව ක්‍රමවත්ව ඉතිරි කළහොත් අනාගත මූල්‍ය සුරක්ෂිතතාවය සලසා ගැනීමට මෙම ඉතුරුම් ක්‍රම හරහා මහඟු අත්වැලක් සැලසේ. විශේෂයෙන්ම උසස් අධ්‍යාපනයට, විදේශගතවීමට, ස්වයංරැකියාවකට, වෙළෙඳ ව්‍යාපාරයකට හෝ පවුලේ හදිසි අවශ්‍යතාවයකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා මුදලක් තමා සතු වේ නම්, එය වනිතාවන්ගේ ආත්ම විශ්වාසය තවදුරටත් ඉහළ නංවන්නකි. ක්‍රමවත් සැලසුමකට ඔබ ඉතිරිකරන මුදල පිවන මංපෙතේ ඔබ මුහුණදෙන කවර අභියෝගයකට වුවද නොසැලී මුහුණදීමට හැකි ආත්ම විශ්වාසයක් ඔබ හද තුළ ජනිත කරන බව නිසැකය.

මහජන බැංකුව කාන්තා ඔබ වෙනුවෙන්ම වනිතා වාසනා ගිණුම හඳුන්වා දී ඇත්තේ ඔබගේ ඉතිරිකිරීමේ සිරිත දිරිගැන්වීම සඳහාමයි. අනාගතය දෙස සුබවාදීව බලන කාන්තා ඔබටත් වනිතා වාසනා ගිණුම සමග එක්වී, ඔබේ සිහින සැබෑ කරගෙන ලෝකයම ජයගන්නා මෙන් මහජන බැංකුව ගෞරවයෙන් ආරාධනා කර සිටී.

දිවයිනේ ප්‍රමුඛතම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන මහජන බැංකුව, දිවයින පුරා විහිදුණු ශාඛා හා සේවා මධ්‍යස්ථාන 743 කින් සහ 8000 කට අධික කාර්ය මණ්ඩලයකින් සමන්විතය. හැට එක් වසරක අභිමානවත් ඉතිහාසයක් හිමි මහජන බැංකුව, මිලියන 14.5 කට අධික ගනුදෙනුකරුවන් පිරිසකට සේවා සපයමින් මිලියන 19 කට අධික ගනුදෙනුකාර සම්බන්ධතාවයන් සහිතව දිවයිනේ විශාලතම මූල්‍ය සේවා සපයන්නා බවට පත්ව ඇත.

PEOPLE'S BANK

Vanitha Vasana 30th ANNIVERSARY

හෙට ලොවට මං සදන අසම සම ඇයට

ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන්
වනිතා වාසනා HIGH INTEREST
ඉතුරුම් ගිණුම සඳහා
12% දක්වා අසම සම පොලියක්

වනිතා වාසනා
money planner
ආයෝජන සැලසුම

වනිතා වාසනා
Branded
Debit Card
සඳහා සුවිශේෂී
වට්ටම්

ඔබ සිදුකරන තැන්පතු සඳහා සුවිශේෂී තෑග්ග

රු.100,000/- ට වැඩි තැන්පතු සඳහා

රු.500,000/- ට වැඩි තැන්පතු සඳහා

රු.300,000/- ට වැඩි තැන්පතු සඳහා

සෑම පුංචි සීට්ටුවකටම ලස්සන Pouch එකක්

තොග අවසන් වනතුරු පමණයි
කොන්දේසි සහිතයි

මහජන බැංකුවේ පවතින සියලුම තැන්පතු, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ ආවරණය කර ඇත.

www.peoplesbank.lk
1961 PEOPLE'S BANK CALL CENTRE

PEOPLE'S BANK
Pride of the Nation

A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA- සන්නාම මූල්‍ය ශ්‍රේණිගත කිරීම
මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

ධරණී

ජාත්‍යන්තර කාන්තා දිනය 2023

"හිතේ හයියෙන් ජීවිතය දිනන්නම වෙර දරන ඔබට"

විශේෂ දැන්වීම් අතිරේකය

හඬන ඔබේ හදවත සනසාලන දැවෙන ඔබේ හදවත නිවාලන

සංසාරගත සෙනෙහසක් සොදුරු අසපුව

කාන්තාවක් වී මේ සසරේ උපත ලැබූ ඔබ, මේ වන විට පාසල් යන දියණියක්, යෞවනයේ පසුවන සුන්දර තරුණියක් නැතහොත් විවාහ අපේක්ෂාවෙන් සිටිනා ප්‍රේමවන්තියක් විය හැකිය. එසේත් නැතහොත් ප්‍රේමයක් අපේක්ෂාවෙන් අනන්ත හීන දකිනා කෙනෙක් හෝ ප්‍රේමයෙන් පැරදී ජීවිතයම අඳුරු කරගත් ඇත්තියක් නැතහොත් පතිකුලයට පැමිණ කාලයක් ගෙවී යද්දී තමන් පණට වඩා ආදරය කරපු ආදරණීය සැමියාගේ නොමනා ක්‍රියාවන් නිසා වද වේදනා විඳින්නියක් විය හැකිය. එසේත් නැතහොත් දරුවන් ලැබ පතිනියක් වූ ඔබව ඔබේ ස්වාමියා අතහැර ගොස් හෝ මිය යාම නිසා අසරණ වූ මවක් වන්නට පුළුවන. ඒ කුමන ආකාරයකින් වුව ද කාන්තාව නැමැති භූමිකාව නිරූපණය කරන ඔබ, ඔබේ අසරණකම නිසාම සිතේ කකියන දුක නිවා ගැනීමට නොයෙකුත් අයගෙන් පිළිතුරක් විමසනවා වන්නට හැකිය. ඒ අයගේ මූලා බස් වලට රැවටී ඇතැම් විට ඔබ ඔවුන් හමුවන්නට පවා පෙළඹෙන්නට ඇති. කිසිදු අධ්‍යාපනයක්, පළපුරුද්දක් නොදත් විවිධ ජනප්‍රිය පුද්ගලයින් යොදා ගනිමින් පච්ච වර්ණ ඇඳ පැළඳගෙන, රතු සායම් ගල්වා ගනිමින්, කොණ්ඩය කඩාගෙන, මහා ගොරහැඬි හඬින් වෙළඳ දැන්වීම් කරන නොමිලේ සියල්ල යැයි කියනා පහත් පෙළේ පුද්ගලයින්ට ඔබ මේ වන විටත් කොතරම් නම් මූලා වන්නට ඇත් ද ?

අසරණ වූ දියණියනි, මව්වරුනි, එවැනි දේට තවත් නොරැවටෙන්න. කෙනෙකුට කියන්න බැරි, කීවත් ඵලක් නැතිව හදවතින් විඳවන ඔබ, ඔබේ දුක් කරදරය කිව යුත්තේ උගත්, බුද්ධිමත්, ගුණවත්, ශාස්ත්‍රය මැනවින් දන්නා පළපුදරුදු අයෙකුටයි. ඒ අන් කිසිවෙක් නොව දකුණෙන් බිහි වූ මේවන විට මෙරට මෙන්ම විදෙස් රටවල පවා ආදර ගෞරවයට පාත්‍රව ගරු සම්මාන ලැබගනිමින් වසර 46ක් පුරා අකලංක සේවාවක් අප වෙනුවෙන් සිදු කරන අලව්වේ ශ්‍රී සුගත වේද මැදුරේ වෙසෙන දුක හඳුනන, දුකට පිහිට වෙන පිංවත් ශ්‍රී සුගත වෙද හාමිනේ ය.

නිසි කලට විවාහ වීමට නොහැකි වීමෙන් අසහනකාරීව විවාහ අපේක්ෂා කරන ඔබට සියලුම කරදර බාධක මඟ හරවා මංගල මල් වරම් ලබා දීමට එතුමියට ගත වන්නේ ඉතා සුළු කාලයකි.

එමෙන්ම ග්‍රහදොස් නිසා කායිකව හා මානසිකව පීඩාවෙන් සිටින දුවා දරුවන්ට ඒ සියලු දෝෂ දුරු කර, රැකියා ලාභ (දෙස් විදෙස් හි) හදිසි ධන ලාභ, වැඩිහිටි කැමැත්ත, ආදරය ස්ථිර කර ගැනීම ආදිය දීන කීපයක් ඇතුළත සාර්ථක කර දීමට පුළුවනි.

වර්තමානයේ පාසල් යන කුඩා දරුවාගේ පටන් යෞවනයේ පසුවන දරුවන් නොයෙක් හේතූන් මත ගුරුදෙගුරුන්ට විරුද්ධව කටයුතු කරනු පෙනේ. තම සහෝදරාදීන්ට නපුරු වෙයි. අධ්‍යාපනය අතහැර වෙනත් දූෂිත කටයුතුවලට සිත යොමු කර තම ජීවිතය අඳුරට හෙළා ගනියි. මේ අය ගුරුදෙගුරුන්ට කීකරු කර, මෙල්ල කර නැවත අධ්‍යාපනය වෙත යොමු කරවා, සමාජයට වැඩදායී පුද්ගලයෙක් කරවීමට මෙතුමිය කටයුතු කර දෙනු ඇත.

මව්වරුනි, ඔබේ ආදරණීය දියණිය ව විවාහ කර ගැනීමට පොරොන්දු දී, ඈ සතු වටිනා දේ සොරාගෙන, ඇයගේ චරිතය ද කෙළෙසා ඇය තනි කර පළා ගිය පෙම්වතුන් ද, විවාහ වී දරුවන් ද ලැබුණු පසු එම කැදැල්ල සුණු විසුණු කර දමා ගිය ස්වාමි පුරුෂයින්ට ද දිය හැකි උපරිම දඬුවම් ලබා දීමද නැතහොත් කීකරු කර, මෙල්ල කර වෙනත් අයගෙන් ඈත් කර නැවත ගෙන්වා ගැනීමට කටයුතු කළ හැක.

මතට ඇබ්බැහි වූ දුව, පුතා, බෑණා, සැමියා සති කීපයක් තුළදී ඉතා සාර්ථක කෙම් ක්‍රමයක් මඟින් සුමගට ගැනීමට ඇයට ගත වන්නේ ඉතා සුළු කාලයකි.

තම නිවසේ, රැකියා ස්ථානයේ බලයෙන් රැඳී සිටින සතුරන්ව එම ස්ථානවලින් නෙරපා ඈත් කර ගැනීමට හා තම පවුලට සතුරු කරදර කරනු යම් කෙනෙක් වෙතොත් ඒ අයව ප්‍රදේශයෙන්ම පිටමං කර දීමට ඇයට හැකියාව ඇත.

විවාහයට පත්ව සිටින බිරිඳ හෝ ස්වාමියා තම දූ දරුවන්ටත් නොසලකා හරිමින් මතට, දුරාචාරයට, අනාචාරයට හසුව දැඩි ලෙස සැර පරුෂ වූ සැමියා හෝ බිරිඳ මෙල්ල කර නැවත පවුල් දිවිය ම සුර විමනක් කර ගන්නට ඔබට ඇය සහය වනු ඇත.

නැන්දම්මාගෙන්, නෑනාගෙන් හා අසල් වැසියන්ගෙන් ලැබෙන රුවුම් ගෙරවුම්, කරදර, හිංසා දුරු කර, ඔබට ඔබේ ආදර සැමියා/බිරිඳ සමඟ සතුටින් කාලය ගෙවන්නට මෙතුමිය හමුවීමෙන් පුළුවන් වන බව කිව යුතුය.

ඔබේ නිවසට, ව්‍යාපාරයට සෞභාග්‍ය උදා කරන ලක්ෂපතියෙක්, කෝටිපතියෙක් කරවන මහානුභාව සම්පන්න වාසනා සුගන්ධ ධූපය සහ ජය පිරිතෙන් ලක්ෂවාරයක් පීවම්බලය කාවද්දා ඇති රන් තැඹිලි තෙල් ලබා ගැනීමට අදම වෙද හාමිනේ අමතා දිනය, වේලාව වෙන්කර ගන්න. මේ කිසිවක් තැපැල් මඟින් සිදු නොකරන බව කරුණාවෙන් සලකන්න.

අලව්වේ පිංවත් සුගත වෙද හාමිනේ වෙතින් ඔවුන්ගේ පුරාණ සත්‍ය ශාස්ත්‍ර බලවේග මඟින් කටයුතු සිදු කර දෙන්නේ එතුමියගේ අසපුවට පැමිණ එතුමිය හමුවන අයට පමණි.

අඳුන්, ආරූඪ, ශාස්ත්‍ර බොරුවකි. මූලා නොවන්න. දුරකථනයෙන් අමතා ඔබේ පැමිණීම පිළිබඳ දන්වන්න. එවිට ඔබට එතුමියව පුද්ගලිකව ම හමුවිය හැක. තම මවට, සොයුරියකට මෙන් ඔබට ඕනෑම දෙයක් සැකයෙන්, බියකින් තොරව පැවසිය හැකිය. ඔබගේ ආත්ම ගෞරවය, රහස්‍යභාවය, රැකගෙන මේ මව්තුමිය ඔබට අවශ්‍ය ජය, සතුට, සැනසීම ලබා දෙනු ඒකාන්තයි.

පරම්පරාවෙන් ලද විස්මයජනක ශාස්ත්‍රයන් හා දැන උගත් ශාස්ත්‍රයෙන් මූල් කොට ලද ආත්මීය සෙනෙහසක් තුළින්...

සැමට සුව සෙත සදන දෙස් විදෙස් සුපතල ගරු සම්මානලාභී

පිංවත් ශ්‍රී සුගත වෙද හාමිනේ

නැණ ගුණයෙන් පිරි කීකරු දරුවෙක් කර ගැනීමට

පවුලේ සමඟිය, බලය, දියුණුව ඇති කිරීමට

2022/2023 වසර සාමාන්‍ය පෙළ, උසස් පෙළ ශිෂ්‍යත්ව විභාගවලින් විශිෂ්ට ජය ලැබීමට

ඔබේ සුන්දර කැදැල්ල සුරපුරයක් කර ගැනීමට

කළණ මිතුරුදම රැක ගනිමින් පාප මිත්‍රයින්ගෙන් දුරස්වීමට

වැඩිහිටි අවසරය ඇතිව කුලගෙදරට පිවිසීමට

ප්‍රමාද වූ විවාහයට මංගල මල් වරම්

ඉගෙනීමට අදක්ෂ දරුවන් නරක ඇසුරෙන් මිදවීමට

සතුරු කරදර, අපල උපද්‍රවලින් ඈත් වීමට

කිසිවෙකුගෙන් කරදරයක් නොවී තම දේපළ ආරක්ෂා කර ගැනීමට

ඉඩමට, රැකියාවට, ව්‍යාපාරික ස්ථානයට දියුණුව සලසා ගැනීමට

ජීවිතයේ සියලු දුක් දරන්නී කාන්තාවක්මයි. උපතේ සිට මරණය දක්වාම තම පවුල තුළ දහසකුත් දුක් දරන ඔබ තරුණියක්, පෙම්වතියක්, බිරිඳක්, මවක් වන්නට පුළුවන. තම පෙම්වතා, සැමියා, දරුවා වෙනුවෙන් ඔබ කොතෙකුත් නම් ඉවසීම් මෙන්ම දරාගැනීම් සිදු කරනවා ඇති.

දයාබර දෙමාපියනි, දුවා දරුවනි,

ඔබේ සහ ඔබ දියණියගේ ප්‍රමාදවන විවාහය නිසා තව තවත් කේන්ද්‍ර බලමින් කාලය ගත නොකොට සියලු දෝෂ දුරුකොට යහපත් විවාහ සම්පත්තිය කෙටි කාල සීමාවක් තුළ දී සැබෑ කර මංගල මල් වරම් ලබන්නට ඔබ තවත් ප්‍රමාද නොවන්න.

පවුලේ සමඟිය තුළින් සියලු රෝග බිය දුරු වී මානසික සුවය, කායික සුවය,ධනය, බලය, රැකියා, ව්‍යාපාර දියුණුව උදාකර ගන්න. ප්‍රමාද නොවන්න.

ගැහැනියකගේ දුක හඳුනන්නේ තවත් ගැහැනියක් ම පමණි.

ඔබ මේ කුමන හෝ ප්‍රශ්නයකට මැදිව කෙනෙකුට කියන්නට බැරිව, කීවත් ඵලක් නැතිව හදවතින් විඳවන ඔබ, සැකෙන් බියෙන් තොරව, තම ආත්ම ගෞරවය, රහස්‍යභාවය රැකගෙන සිය මවට, සොයුරියට මෙන් පවසා සත්‍ය ලෙසම සහනය ලබාගන්න.

කිසිවිටෙකත් බොරු අඳුන්, ආරූඪ, ශාස්ත්‍රවලට නොරැවටෙන්න.

හමුවීම : සෙනසුරාදා, ඉරිදා
උදේ 10 සිට සවස 2 දක්වා

පැමිණීමට පෙර දුරකථන ඇමතුමක් දී වේලාවෙන් කරගන්න.

ලි. ප. අ. කෑ/ව/00023

ලැබීම, දියුණුව, වාසනාව ලැබ ලක්ෂපතියන් කෝටිපතියන් කරවන ධනය, බලය ළඟා කර ගැනීමට බලගතු යන්ත්‍ර මෙන්ම සුවඳ ධූපය ලබා ගැනීමට ද

තරුණ දූ පුතුන්, සැමියන් මත් වතුරට, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම දුරුකර දීම (ඉතාම රහස් කෙම් ක්‍රමයක් මඟින්)

ශ්‍රී සුගත වෙද මැදුර තුල්හිරිය, අලව්ව 077 77 22 860 / 075 48 38 300

කොළඹ - කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ අඹේපුස්සත් අලව්වත් අතර තුල්හිරිය උසාවිය පිහිටා ඇත. එතැන බසින්න. ඒ ඉදිරි පිට.

අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පිංතූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

මාසික අධ්‍යාපනික පුවත්පත් 6 ක්

අවසන් වාර විභාගයට අභ්‍යාස සමඟින්

මාර්තු කලාපයන් දැන් වෙළෙඳපොළේ

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348
දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක

Sterill HOME

ANTIBACTERIAL MULTIPURPOSE CLEANER

Kills 99.9% of illness causing germs

99.9% විෂබීජ විනාශ කරයි

කොරෝනා වෛරසය විනාශ කරන බවට තහවුරු කර ඇත

DERMATOLOGICALLY TESTED

සමට හානිකර නොවේ

නානකාමර | මුළුතැන්ගෙය | ගෙබිම | වීදුරු

GS&Co BELIEVE

අතේ ඇති මුදලට වැඩිම වාසියක්

Marketed by: George Steuart Consumer (Pvt) Ltd. | **Hotline:** 0115 662626

රු.390/-

ධරණි

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07. දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672601, 0112672603, 0761393811 ෆැක්ස් 0112 673 451

වාණිජ බැංකු ඇබෑර්තු

★ බැංකු ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් තනතුරු කිහිපයක අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප රු. 40,000/-
18/40 ගෑ/පි
(මෑන් පවර් නොවේ)

0716 434 278 | 0703 346 072
0774 024 155 | 0716 434 288
0761 125 624 | 0702 231 694

ධරණි

පුවත් පත නිවසටම ගෙන්වාගන්න අමතන්න
076 1367 623

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601
0112 672 603

ඔබ දෙවයට පිටුපායිද.. ?
දෙවය ඔබට පිටුපායිද.. ?

● ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
● වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරලේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය.
සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

A/L O/L Banking
Accounting Econ
BS ආර්ථික විද්‍යාව,
ව්‍යාපාර ගණිතය,
Commerce
මූල්‍ය න්‍යාය
Paper class
revision
077 710 2241
L60075

සියළුම
හෙයර්කට්ස් පර්ම්,
කලර්, ස්ට්‍රෙට් කිරීමට
වෙන් වෙන්
වශයෙන් පාඨමාලා
හැදෑරිය හැක.
වයස් බේද
නොසැලකේ.
ගැහැණු / පිරිමි.
(සති 6කින් පාඨමාලාව
අවසන් වේ.)
Clipper Cuts Unisex family hair salon
077 307 4080

උගස් තැබූ රත්තරං

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහළ මිලක්
076 101 88 53

ජාතික ගෞරව
නාම සන්නස්පත්‍ර ප්‍රදානය
2023 සුදුසුකම්ලත්
පුද්ගලයන්ගෙන් අයදුම්පත්
කැඳවේ.
076 360 1939
076 268 3426

ඔබත් මෙවැනි අයෙක්ද ?

● නිතර නිතර අත සෝදනවාද?
● එකම දේ නිතර නිතර කරනවාද?
● කරන දේ නැවත කීපවාරයක් සොයා බලනවාද?
● නැමට වැඩි වේලාවක් ගන්නවාද?

ඔබට මෙයින් මිදීමට අවශ්‍යද?
0716 90 90 90
ශ්‍රී සෙන් ප්‍රතිකාර ඖෂධාගාරය
(සියලු ප්‍රතිකාර රජයේ ලියාපදිංචි වෛද්‍යවරුන් විසිනි)
ගාල්ල කොළඹ
කුරුණෑගල

දෙහිවල

කාන්තා පමණක් රූපලාවණ්‍යාගාරයක් සඳහා කාන්තා කොණ්ඩා මෝස්තර රූපලාවණ්‍ය ශිල්පිනියක් අවශ්‍යයි.
ආකර්ශනීය වැටුප් + කොමිස්.
011 271 0177
077 151 1970

A/L සංයුක්ත ගණිතය

ගියවර 24 ස්ථානය සමග
සියල්ලම Campus,
ලංකාවේ ප්‍රථම ස්ථාන
කිහිප වරක් බිහිකළ
කොළඹ රාජකීය
(අවු. 18 1/2) ආනන්ද
(අවු. 7 1/2) උත්තරපත්‍ර
පරීක්ෂක, විදුසර ලේඛක
රූපවාහිනීදේශක,
දිවයිනේම සම්පත්
පුද්ගලයෙකු ලෙස තේරී ඇත.
Maximum Qualification,
Maximum result.
077 724 2160

ඔබ කෙට්ටුද ?

ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම

මසක් වැනි කෙටිකලකින් කෙට්ටු බව නැතිකර පිරිපුන් පැහැපත් සිරුරක් සඳහා අතුරු ආබාධ වලින් තොර කෙට්ටුබව සඳහාම නිපදවූ පෝෂණ අතිරේකය
නිවසටම ගෙන්වා ගැනීමට හෝ පැමිණීමට
විමසීම් : 0714 520 418
පුරුෂ රෝග - ස්නායු, ධාතු දුබලතා, අප්‍රාණිකත්වය සඳහා විශේෂ ප්‍රතිකාර
අධික තරබාරුව, කාන්තා රෝග, හිසකෙස් රෝග, ගෑස්ට්‍රයිටීස්, සියලු රෝග සඳහා පැමිණ හමුවන්න.
සංහිත ප්‍රතිකාර මධ්‍යස්ථානය
නො.70, සණස වෙළඳ සංකීර්ණය, නුවර පාර, යක්කල, ගම්පහ.
(යක්කල කාගිල්ස් ෆුඩ්සිටි 3 වන මහල)
දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 4.30
තෝය සහ සිකුරාදා දින නිවාඩු
අනු ශාඛා නොමැත W.P.11015

දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.
ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.
වැටුප රුපියල් 35,000 - 40,000
ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ
072 945 9247

ආතරයිටීස්
විශේෂ ප්‍රතිකාර

දණහිස් ඉදිමුම වේදනා සියලු සන්ධි රෝග, වාත රෝග, හිරිය, කශේරුකා ඇත් වීම, ළංවීම, ඉපැරැණි නිල ප්‍රතිකාර මඟින් පළමු ප්‍රතිකාරයේ සිටම සුවය. කැඩුම් බිඳුම් ප්‍රතිකාර.
ආතරයිටිස් ප්‍රතිකාර ඔබේ නිවසට ගෙන්වා ගත හැක. මාසිකව රු.7500/-

පාරම්පරික වෛද්‍ය, හෙල වෛද්‍ය ප්‍රසාදිනි, වෛද්‍ය කීර්ති ආර්. බී. පියතිස්ස
රත්න වෙද මැදුර
163/1, නිල්පනාගොඩ හන්දිය, මිනුවන්ගොඩ.
0776 060 950

කවි යාය



ධරණී

සුවහසක් කාන්තා සැමගේ
සිත් සතන් පුබුදු කරනා
මනහර හැඟුම් පානා
නව බලාපොරොත්තු කැන්දනා
සැමට දැනුම ගෙන දෙනා
ඔබගේ ගුණ වයා නිමකළ නොහැක
සතිපතා ආලින්දයට පැමිණෙනා
ඔබේ ගුණ වයන්නට
කවි පද මෙලෙස ගොතන්නෙමි

නුවන්ති මධුෂානි සුබසිංහ

අම්මා නැතිව අවුරුදු එපා

පායා එළිය දුන්නත් නව සඳ අපට
ඇවිදින් කොහා හැඬුවත් මිහිරිම කනට
කජු පුහුලන් සුවඳ දැනුණත් නැහ වලට
අවුරුදු කුමරු පිළිගන්නට බැහැ අපට

කිරිබත් උයල එදවස මවගේ සුරතින්
කැව් හැටි අපට සිහියට නැගෙනව නිතැතින්
අප අතහැරලා අම්මා අපෙ ගිය විලසින්
අවුරුදු කන්නෙ කොහොමද දෙවියනි සතුටින්

අම්මා නැති දුකට නිතරම කඳුළු පිරී
නෙත් දෙක මගේ ඇත කඳුළැලි ගගුලෙ එරී
සිහියට එද්දි බිව් කිරි හදෙ තලයි ඉරී
ගෙවී ගිය අතීතයෙ ඉපදිල යනව මැරී

එන අවුරුද්දෙ නව සඳ පායන්න එපා
කොහා ගයන ගීතය දෙසවනට එපා
කජු පුහුලන් සුවඳ නැහැයට දැනෙනු එපා
අම්මා නැති අපට අවුරුදු එපා එපා

සීතා රත්නායක
ඉහළ බෙලිගල්ල
බෙලිඅත්ත

කලාකරුවෙකුගේ විවාහය

දෙවන උපත
ඔබ ළඟදිම වුණා විපත
නීතිය නැවතුවත් අපේ සැපත
දෛවය වෙයි මගේ කැඩපත

දැගිලි එක්කළ හුය ගැලවී
තොල්පෙති වැලපේ හාදු අහිමි වී
පමාවී ආ වසන්තය නිම වී
ඔබ මගෙන් දුර ගියා වෙන්වී

සමරු මතක චිතකය
ආදරයේ පිරිපතින් නිමවිය
යෞවනයට තබා විරාමය
සඳ අහිමි මට දැන් අමාවකය

ආදරය තුන්කල් සිහිනයකි
ඔබ රෑයේම බැස ගිය තරුවකි
ප්‍රථම ප්‍රේමය ධවල පිරිවුවටකි
ඔබ එය කිළිටි කළ තිළිකුණකි

සමන් සුරවීරආරච්චි
රඹුක්කන

හඳුනාගැනීම

හෙමි හෙමින් නෙතු සඟල
තිමිර පටලෙන් වැහෙයි
විනිදෙනා කිසි හඬක්
සවන් තුළ නොවැකි යයි

අක් බමරු කෙස් කළඹ
හෙමින් ගිලිහී වැටෙයි
වාරු නැති දුබල කය
යන අතට නොම රැඳෙයි

දකින සේයා රුවක්
හඳුනන්ට නොහැකි වෙයි
දැන් ඉතින් කුටිය තුළ
හුදකලා වූ වගයි

ඒ නමුදු ඇත වුව
නුඹේ හඬ මට ඇසෙයි
රැලි වැටුන ඔබේ අත
මේ කියා මට දැනෙයි

පියසීලි විජේනායක

කවිය නුඹ

හුදකලා නිමේශයේ
සිත් කොනක හිඳ
දුක - සතුට සමඟින්ම
ගලායන මේ දිවියේ
සරා සඳකට තනි රකින
තරු කැකුළක්ම විය

මැදියම් රැයක
සොඳුරුතම සිහිනයක
දුක - සතුට කැටිව
ගලා ආ විඩාපත් සිතුවිල්ල
රසවත් ගීයක්ව
නිදහස්ව ඉගිලුනේ
ඔබ නිසාවෙනි

පහන් කරනු මැනවි
මා සිතට
මියෙන තුරාවට
ඔබ මා සමඟ
'දයාබර කවිය'

ඊ.ඒ.එම්.එදිරිසූරිය
මල්ලවපිටිය
කුරුණෑගල

ප්‍රථමයා

(යුදබිමේ දිවි පිදූ ප්‍රථම රණවිරුවරිය ඉරේෂා නිල්මිණී වෙනුවෙන්)

මා මව්පියන්ගේ
ප්‍රථම සිහිනය වූ
ඔබ
අප පුංචි පවුලේ
ප්‍රථමයා වූ
ඔබ
අප සනුහරේ ප්‍රථමයෙන්
රූ රැජිණිය වූ
ඔබ
අප සනුහරේ
කාන්තාවක් ලෙස ප්‍රථමයෙන්
ත්‍රිවිධ හමුදාවට බැඳුණු
ඔබ
එහිදී ප්‍රථමයෙන්
ලාන්ස් කෝප්‍රල් හා
කෝප්‍රල් පදවිය ලැබූ
ඔබ
මා මාපියන්ගේ
ප්‍රථමයෙන්
තම දියණියක්
මනාලියක් ලෙස
දකින්නට සිහින පෙන්වූ
ඔබ
මා දිවිය තුළ අහිමිවීමේ
වේදනාව
ප්‍රථමයෙන් ලබාදුන් ඔබ

ද.සිල්වා නිලන්ති
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

අම්මාට ලියමි

ගතේ සවි නැතිද
හිතේ බර හැල්ලුවට
දුන්නාට මං කරකාර
නුඹ සතුටින්ද
මගෙ අම්මෙ

දර ටික ගෙට ගන්න
වී ටික වේලන්න
රටාවකට මිදුල අමදින්න
පොඩ්ඩි නැතුව බැහැ නේද
දුක නැද්ද මගෙ අම්මෙ

වයිරාට කිටියාට
මං නැති දුක දැනෙනවාද
අනේ ඒ අසරණයන්ට
මට වගේ මව් වෙයන්
මගෙ අම්මෙ

අඹ ගහ පලබරද
වෙරළු ඉදිලා බිම වැටිලාද
රතු පේර පැහිලාද
මතක් වෙනකොට හිත හඬනවා
මගෙ අම්මෙ

පොඩ්ඩිගෙ හුස්ම පොද වෙච්ච
මගේ බුදු අප්පච්චි
තනිව වැළපෙනවා ඇති
උන්දෑට ඇනුම්පද නොකියන්න
මගෙ අම්මෙ

අඹ ගැටේ කොස්මදුල පවා
මිල කරන විසල් පුරවරයෙ
පුංචි කුලී ගෙදරක
හිමි සමඟ මං තුටින
නුඹට බුදු සරණයි
මගෙ අම්මෙ

කාන්ති විජේසිංහ
මාලපල්ල පන්නිපිටිය

පෙරනිමිති

දිය පොදක් නැතිව වෙව්ලන
සිහින් දුක්බර මුහුණු දුටුවෙමි
දරුණු වකුගඩු රෝගයෙන්
සෙමින් මියයන බව දුටුවෙමි

ජාතිවාදයෙන් දැවී ඇවිලෙන
සෑයවල් කිහිපයක් දුටුවෙමි
මිනින්තලයට පියාඹා යන
නිහඬ කණකොක් රැන දුටුවෙමි

මැරුණු දරුවෙක් තුරුළු කරගත්
තරුණ වයසේ මවක් දුටුවෙමි
මොළය මියගිය දෑස් දන්දෙන
මගේ වයසේ පුතෙක් දුටුවෙමි

නදීෂා අබේකෝන්
මාතර කඹුරුපිටිය

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,
කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

MOBILE

TRIPLE BUDDY

UNLIMITED DATA

SELFCARE APP එක හරහා හෝ
#170# අමතා ඇක්ටිවේට් කරගන්න.

ඇප් 3ටම

රු.444කට

(බදු ඇතුළත් වේ.)

දින 30ක් පුරාවට

TRC/M/PRO/20/07 කොන්දේසි සහිතයි.

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොදයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.